# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2019** ජනවාරි **22** වන අඟහරුවාදා
2019தை 22 வெள்ளிக் கிழமை
Tuesday 22nd January 2019

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12 ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.29 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.29* ***க்கு சபை கூடியது***
*The Provincial Council met at 09.29 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ආණ්ඩු පක්ෂයේ ඇන්ටනි උපුල් රාජිත ගරු මන්ත්‍රීතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානය හා සන්ධානගත වූ දේශපාලන පක්ෂයක නායකයා ලෙස එම සන්ධානගත පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් මා වෙත දන්වා එවා ඇති හෙයින්, ඇන්ටනි උපුල් රාජිත ගරු මන්ත්‍රීතුමාට ආණ්ඩු පක්ෂයේ මුල් පෙළ අසුනක් වෙන් කර දී ඇති බවත්, ඒ අනුව ඇතැම් ගරු මන්ත්‍රීවරුන්ගේ ආසන අනුපිළිවෙළ සුළු වශයෙන් වෙනස් වී ඇති බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*කිසියම් ගරු මන්ත්‍රීවරයෙකුට ආසන පැනවීම සම්බන්ධයෙන් යම් අපහසුතාවයක් හෝ ඉල්ලීමක් තිබේ නම් ඒ බව ලිඛිතව මා වෙත හෝ සභා ලේකම්තුමා වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව දන්වා සිටිනවා.*

*ඒ අනුව ඉදිරියේදී සභා රීති ප්‍රකාරව හා සභා සම්ප්‍රදායානුකූලව ලබා දිය හැකි යම් සහනයක් ඇත්නම් එය නොපැකිලව ලබා දීමට උත්සුක වන බව වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙනවා.*

*ii*

*"පසුගිය සභා රැස්වීමේදී ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා විසින් මා වෙත කරන ලද ඉල්ලීමක් අනුව, මා විසින් සභා ලේකම් මගින් ප්‍රධාන ලේකම් වෙත ලබා දුන් උපදෙස් අනුව 2018 වසර තුළ එක් එක් අමාත්‍යාංශ විසින් සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාරණාව සම්බන්ධයෙන් මා වෙත යොමු කරන ලද,*

*ඔබේ අංක C/O/2/2/1 – (BAC-VI) හා 2019.01.10 දිනැති ලිපිය හා බැඳේ.*

*2018 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන යෝජනා සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා පළාත් පාලන ආයතන මට්ටමින් මුදල් වෙන් කර ඇති ආකාරය මේ සමඟ අමුණා එවන බව කාරුණිකව දන්වා සිටිමි.*

*ආර්.ඒ.ටී.ආර්. රාමනායක,*
*අධ්‍යක්ෂ (සැලසුම්),*
*ප්‍රධාන ලේකම් වෙනුවට.*

ඇත්ත වශයෙන්ම මේ වාර්තාව ඊයේ හවස ලැබුණේ. අපට මේ ගැන පැහැදිලි අවබෝධයක් ලබා ගන්න බැරි වුණා. යම්කිසි මන්ත්‍රීවරයෙකුට අද දවස තුළ මෙම වාර්තාව අවශ්‍ය නම්, සභා ලේකම්තුමා ළඟ මෙම වාර්තාව තිබෙනවා. ඒ වාගේම මෙම වාර්තාවේ සියලුම ලේඛන ඉදිරි සභා වාරයේදී අපි ඔබතුමන්ලාට ලැබෙන්නට සලස්වනවා.

*iii*

*2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳව පැවති 2018.12.04, 05, 06 හා 07 දිනයන්ට අදාළ හැන්සාඩ් වාර්තාවන්හි මෘදු කොපි (soft copy) ගරු මන්ත්‍රීවරුනගේ tab පරිගණකයේ බා ගත කර ඇති බවත්, එකී හැන්සාඩ් වාර්තාවන්හි මුද්‍රිත පිටපත් ඉදිරියේදී සභාගත කරන බවත් කාරුණිකව ගරු සභාවට දැනුම් දෙනවා."*

*iv*

*"මෙම පළාත් සභා ගොඩනැගිල්ල සඳහා පූර්ණ ගිනි ආරක්ෂණ පෙරහුරුවක් 2019.01.25 දින පෙරවරුවේ පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇති බවත්, ඒ පිළිබඳව සියළුම ධූරධාරීන් ඇතුළු ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙසත්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් සභා ලේකම්තුමා වෙත 2019.01.18 දිනැතිව ලිඛිත දැනුම් දීමක් කර තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා.*

*ඒ අනුව ඒ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කරන මෙන්ද, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන ගරු මන්ත්‍රීවරුන් වේ නම්, එම තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කරන ලෙසටද කාරුණිකව ඉල්ලා සිටිනවා."*

*v*

*පළාත් සභා ගරු මන්ත්‍රීවරියක් ලෙස පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරන ප්‍රශ්න ඇසීමට වෙනත් ගරු මන්ත්‍රීවරයෙකුට බලය පැවරීම පිළිබඳව රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, එතුමියගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමට ගරු විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාව නම් කර ඇති බව මා වෙත දැනුම් දී තිබෙනවා."*

## ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලිපිලේඛන පිළිගැන්වීම යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශ උපදේශක කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කිරීමට, එම උපදේශක කාරක සභාවේ සභාපතිවරයා වන පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාට හෝ වෙනත් සාමාජික ගරු මන්ත්‍රීවරයෙකුට අවස්ථාව ලබා දෙනවා.

පළාත් පාලන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ අවස්ථාවේදී සභා ගර්භයේ නැහැ. එතුමා මදක් අසනීප තත්ත්වයෙන් සිටින්නේ. එතුමා මා වෙත දැනුම් දුන්නා, ප්‍රමාද වී සභාවට පැමිණෙන බව. එම නිසා එම කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරයෙකුට අවස්ථාව තිබෙනවා, එම වාර්තාව සභාවට ඉදිරිපත් කිරීමට.

එම උපදේශක කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයෙකු නොමැති නිසා බස්නාහිර පළාතේ පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ 2018.10.19 දින පැවැත්වූ උපදේශක කාරක සභාවේ රැස්වීම් වාර්තාව මම මෙම සභාවට ඉදිරිපත් කරනවා. එම වාර්තාවේ පිටපත් අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේස මත තබා තිබෙනවා.

## කාරක සභා වාර්තා පිළිගැන්වීම
## PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2019.01.09 දින පැවැත්වූ සභා කටයුතු කාරක සභාවේ රැස්වීම් වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
## PETITIONS

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, පානදුර, බෙක්කේගම, පුන්සරවත්ත පාර, අංක 45/1, 'මර්සි' හි පදිංචි ඕ.පී.වී.ජී.එන්. පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***සභා මේසය මත තබන ලද පෙත්සම් :***

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පන්නිපිටිය, හිරිපිටිය, අංක 210/ඞී හි පදිංචි ප්‍රියංකා දර්ශනී මීමනගේ යන අයගේ පෙත්සම.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

බොරලැස්ගමුව, (අංක 11 කළුගහවත්ත), වැව පාර, අංක 548 හි පදිංචි ඇම්.යූ.එස්. සිරිවර්ධන යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petition Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම

QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ගරු අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology)

ගරු සභාපතිතුමනි, පිළිතුරු සූදානම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හොඳයි. බොහොම ස්තුතියි.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**01.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/01)**

*ප්‍රශ්නය :*

*අ. බස්නාහිර පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් බස්නාහිර පළාතේ උපාධිධාරී ගුරුවරුන් ලෙස බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කරන ලද්දේ ද? ඒ කවදා ද?*

*පිළිතුර :*

*අ. ඔව්. 2014.08.11 හා 2016.11.01*

*ප්‍රශ්නය :*

*ආ. එම දැන්වීම ප්‍රකාරව බඳවා ගැනීමට නියමිත වූ කලා උපාධිධාරීන්ගේ අවම සුදුසුකම් මොනවාද?*

*පිළිතුර :*

*ආ. අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 03 ක් සහිතව මව්බස හා ගණිතය ද ඇතුළත්ව විෂයන් 06 කින් සමත් වීම. (එක් වතාවකදී අවම වශයෙන් විෂයන් 05 ක් සමත් වී තිබිය යුතුය.)*
*අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයන් 3 කින් සමත් වීම.*
*ශාස්ත්‍රවේදී උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය.*

*ප්‍රශ්නය :*

*ඇ. i. ඉඹුල්ගොඩ, පහළ ඉඹුල්ගොඩ, “සිසිර”, අංක 329/1 දරණ ස්ථානයේ පදිංචි එම්.කේ.එල්. ජයසූරිය යන අය ගුරු පත්වීමක් සඳහා අයදුම්කර තිබුණේද?*

*ii. එම තැනැත්තා ලිඛිත විභාගයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණද?*

***පිළිතුර :***

*ඇ. i. එම්.කේ.එල්. ජයසූරිය යන අය ගුරු පත්වීම් සඳහා අයදුම්කර ඇති බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා ඇත.*

*ii. ලකුණු 92 ක් බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වා ඇත.*

***ප්‍රශ්නය :***

*ඇ. i. වර්ෂ 2019-01-02 වන දින කොපමණ සංඛ්‍යාවකට ගුරු පත්වීම් පිරිනමන ලද්දේද?*

*ii. එහිදී එම්.කේ.එල්. ජයසූරිය විසින් ලබා ගත් ලකුණු ප්‍රමාණයට පත්වීමක් ලබා නොදීමට හේතුව පැහැදිලි කළ හැකිද?*

***පිළිතුර :***

*ඇ. i. 518 දෙනෙකු සඳහා*

*ii. ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් පිරිනමන ලද සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් මෙම එම්.කේ.එල්. ජයසූරිය යන අයට ඇති බැවින් එය පාසල් ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ නොවන උපාධියක් නිසා ගුරු පත් වීමක් ලබා නොදුන් බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් දැනුම් දී ඇත.*

***ප්‍රශ්නය :***

*ඉ. එහිදී ලකුණු 88 සීමාව දක්වා පත්වීම් ලබාදී තිබේද?*

***පිළිතුර :***

*ඉ. ඔව්.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි ප්‍රශ්නය ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමාගෙන්. ඒ ප්‍රශ්නයත් ගරු අමාත්‍යතුමාටමයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය ඉදිරිපත්කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි? ගරු මන්ත්‍රීතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාගත කරන්නේ නැතිව මේකට උත්තරයක් දුන්නා නම් අපටත් දැන ගන්න ඕනෑ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක කරන්න පුළුවන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ කියන්නේ පළමුවැනි ප්‍රශ්නයද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔව්. පළමුවැනි ප්‍රශ්නය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමගේ අවසරයක් ලැබේ නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඒකේ අත්‍යවශ්‍ය කරුණක් ගැන අහලා තිබෙන්නේ. ඒ ගැන අපටත් දැන ගන්න අවශ්‍යතාවයක් තිබෙන නිසා. අපට උත්තර ටික කියෙව්වා නම් ඇති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයකුත් නැහැ. ඔබතුමා ලැහැස්ති නම් කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අනික් මන්ත්‍රීවරුන්ට දැන ගැනීම පිණිස.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉන්න මන්ත්‍රීවරු දැන ගන්නවා නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔව්. ගරු සභාපතිතුමනි, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. රීති ප්‍රශ්නයකුත් තිබෙනවා. අදාළ මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභා ගර්භයේ නැහැ. ඒ නිසා ඔබතුමාට මේ වෙලාවේ ප්‍රශ්නයට උත්තර සපයන්න අමාරුයි. එකම දේ තිබෙන්නේ සභාගත කිරීම විතරයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම සූදානම් ගරු සභාපතිතුමාගේ අවසරය ලැබෙනවා නම්, අද ඉදිරිපත් කරන්න. නැත්නම් සභාගත කරන්න. නැත්නම් ඊළඟ සභා වාරයේදී ගරු සභාපතිතුමාගේ අවසරය පරිදි කටයුතු කරන්න පමණක් සූදානම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාගත කිරීම නොවෙයි. අනෙක් මන්ත්‍රීවරුන්ට දැන ගන්න අවශ්‍යයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, සභා රීතියක් තිබෙනවා නේ? දැන් ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ නේ? එතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට කොපියක් දෙන්නම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නම් දැන් දෙන්න. එතුමා නැති එක හරි. නමුත් මේකේ අත්‍යවශ්‍ය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීතියක් තිබෙනවා නේ? ගරු මන්ත්‍රීතුමා නැත්නම් ඉදිරිපත් කරන්න බැහැ ඒක. එතුමා පළමුව ප්‍රශ්නය යොමු කරන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා හැමදාම රීතිවලට එල්ලෙන්න එපා. රීතිවලට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීතිවලම මම ඉන්නේ නැහැ. ඔබතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

රීතිවලට එල්ලෙන්නේ නැතිව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කොපියක් එවන්නම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමාගේ අතේ උත්තරය තිබෙනවා නම් තත්පර ගණනාවකින් කියවන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පිළිතුරුවල පිටපතක් ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා හැමදාම රීති පොතට යනවා නම්, හැමදේම රීති පොතට ගියොත් ඕක තමයි ප්‍රශ්නය වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමදාම රීති පොතට මම යන්නේ නැහැ. ඔබතුමන්ලාත් රීති පොතට යන්නේ නැහැ නේ? එතුමා සභා ගර්භයේ නැහැ නේ? මට ඒ උත්තරය දෙන්න. මම එතුමාට කොපියක් -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හොඳමයි. බෙහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**02.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/02)**

අ. බස්නාහිර පළාත් ක්‍රීඩා විද්‍යායතනය පිහිටුවීමේ අරමුණ කුමක්ද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. ඒ සඳහා 2018 වර්ෂයේ පළාත් සභාව මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද? යන්නත්, එකී මුදල් වියදම් කර 2018 වර්ෂයේ කොපමණ ව්‍යාපෘති සංඛ්‍යාවක් සිදු කළේද? යන්නත් මෙම සභාවට දන්වන්නෙහිද?

ඇ. ඉහත ප්‍රතිපාදනවලට අමතරව එකී ආයතනයට ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කර තිබේද? යන්නත්, ඒ කවර ආකාරයෙන්ද? යන්නත් මෙම සභාවට දන්වන්නෙහිද?

ඈ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දැනුම, උපදෙස්, පුහුණුව ලබා දීම.

එම ක්‍රීඩා පුහුණු ආයතනවල පුහුණුව ලබන්නන් විසින් ලබා ඇති ප්‍රවීණතාවය නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම.

එම ක්‍රීඩා පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන විභාගවලින් සමත් වූ අයට අභිඥාන පත්‍ර පිරිනැමීම හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම.

ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශකයින් පුහුණු කිරීම.

ආ. බස්නාහිර පළාත් වුෂු උපදේශකයන් සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම රු. 130,000.00

මහරගම පොල්වත්ත ක්‍රීඩා පාසල ඉදිකිරීම අදියර I - රු. 50,000,000.00

මහරගම පොල්වත්ත ක්‍රීඩා පාසලේ ක්‍රීඩා භූමියෙහි බැහැරගත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සැකසීම් සිදු කිරීම - රු. 1,000,000.00

ඇ. අමතර ප්‍රතිපාදන වෙන් කර නොමැත.

ඈ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා පළමු වැනි ප්‍රශ්නයට දීපු උත්තරය අනුව මෙම විද්‍යායතනය ආරම්භ කිරීමේ අරමුණ පැහැදිලි කළා. හැබැයි, දෙවැනි ප්‍රශ්නයට දීපු උත්තරත් එක්ක හරි පැහැදිලියි. ඒ අරමුණුවලට අනුව නොවෙයි දැන් මේ විද්‍යායතනය ක්‍රියාත්මක වෙන්නේ කියන එක පැහැදිලියි. ඒ පිළිබඳව ඔබතුමාගේ පැහැදිලි කිරීම මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රශ්නය සඳහා මම විශේෂයෙන් අමාත්‍යාංශයත් එක්ක යළි කථා කරන්න ඕනෑ. මම බලාපොරොත්තු වෙනවා මගේ උපදේශක කාරක සභාවත් නුදුරු දිනක පැවැත්වෙනවා. ඊට කලින් ඔබතුමාට අවශ්‍ය නම් අපි ලිඛිත පැහැදිලි කිරීමක් හෝ ඔබතුමා මගේ අමාත්‍යාංශයට එනවා නම් අද දවසේ වුණත් පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. නැත්නම් උපදේශක කාරක සභාවේදී පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, ටිකක් මේ පිළිබඳව විමසා බලලා තමයි ගරු සභාපතිතුමනි, පැහැදිලි කිරීම් කරන්න සිද්ධ වෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. බොහොම ස්තූතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා කැමැති ඔය පියවර තුනෙන් මම ඕනෑම එකකදී පිළිතුරු දෙන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා මට ලිඛිතව එවන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හොඳයි. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තුන් වැනි ප්‍රශ්නයත් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේමයි. එම ප්‍රශ්නයත් ගරු අධ්‍යාපන ඇමතිතුමාට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**03.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/03)**

අ. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයට අනුයුක්තව ක්‍රීඩා පුහුණුකරුවන් කොපමණ සංඛ්‍යාවක් සිටින්නේද?

ආ. මේ වන විට ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පුරප්පාඩු පවතින්නේද? යන්නත්, පුරප්පාඩු තිබේ නම් ආවරණය කරනු ලබන්නේ කවුරුන් විසින්ද? යන්නත් මෙම සභාවට දන්වන්නෙහිද ?

ඇ. එසේ පහසුවෙන් ආවරණය කළ හැකි රාජකාරියක් සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් සිටියදී විශ්‍රාමලත් නිලධාරියෙකුගේ සේවය අනවශ්‍ය ලෙස ලබා ගැනීම සඳහා බලධාරීත්වය කටයුතු කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. එසේ එම නිලධාරියා සඳහා ගෙවමින් පවතින වැටුප් මහජන මුදල් අවභාවිතයක් ලෙස ඔබතුමා පිළිගන්නෙහිද? යන්නත්, එසේ සිදුවී ඇත්නම්, ඒ සඳහා ගනු ලබන පියවර කුමක්ද යන්නත් මෙම සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. 11 යි.

ආ. ඔව්. ක්‍රීඩා නිලධාරීන් දෙදෙනෙකු විසින් ආවරණය කරයි.

ඇ. විශ්‍රාමලත් නිලධාරියෙකු ක්‍රීඩා පුහුණුකරු තනතුරක වැඩ ආවරණය කරනු නොලබයි.

ඈ. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, තුන් වැනි ප්‍රශ්නයේ 'ඇ' සඳහා දීපු පිළිතුර. ඒ කියන්නේ ඔබතුමා කිව්වේ දැනට ආවරණය කරන්නේ නැහැයි කියලා. ඒ කියන්නේ කලින් ආවරණය කළාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දැන් අහන ප්‍රශ්නයට නේ අපි උත්තර දෙන්නේ. එතුමාට පුළුවන්කම තිබුණා එහෙම නම් කිසියම් පැහැදිලි කර ගැනීමක් තිබුණා නම් ඒකට තව ප්‍රශ්නයක් ඇතුළත් කරන්න. දැන් මට ඒකට උත්තර දෙන්න බැහැ. මම එහෙම නම් මගේ අමාත්‍යාංශ ලේකම්ගෙන් අහන්න ඕනෑ. කලින් ආවරණය කළාද? ඒ කවුද කියන එක පිළිබඳව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි ඉතින් අතුරු ප්‍රශ්න -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මරු උත්තරයක් නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොකක්ද මරු උත්තරයක් කියන්නේ. මම කැමතියි ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මගෙන් විමසනවාට දෙයක්. ඔබතුමා විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අහපු ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමා ආවරණය කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් කවුරුවත් ආවරණය කරන්නේ නැහැ. මගේ උත්තරය තමයි දැනට කවුරුවත් වැඩ ආවරණය කරන්නේ නැහැ. අහලා තිබෙන්නේ මෙහෙම නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට තිබෙන තොරතුරු අනුව පුහුණුකරුවෝ පස් දෙනෙකුගේ පුරප්පාඩු තිබුණා. හතර දෙනෙකු ක්‍රීඩා නිලධාරීන් විසින් වැඩ ආවරණය කළා. එක් අයෙක් විශ්‍රාමිකයෙක් - වැඩ ආවරණය කළා. මම අතුරු ප්‍රශ්න නේ අහන්නේ. මේ ප්‍රශ්නයේ යම් වැරැද්දක් තිබෙනවා. ඒ කියන්නේ වැඩ ආවරණය -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, 'ඇ' යටතේ විමසලා තිබෙන්නේ, *"එසේ පහසුවෙන් ආවරණය කළ හැකි රාජකාරියක් සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් සිටියදී විශ්‍රාමලත් නිලධාරියෙකුගේ සේවය අනවශ්‍ය ලෙස ලබා ගැනීම සඳහා බලධාරීත්වය කටයුතු කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?"* අපි දෙන උත්තරේ තමයි, "විශ්‍රාමලත් නිලධාරියෙකු ක්‍රීඩා පුහුණුකරු තනතුරක වැඩ ආවරණය කරනු නොලබයි." ඉතින් මොකක්ද ගරු සභාපතිතුමනි, මේකේ වරද. මේ උත්තරේ වරද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ දැන් නේ? මම අහන්නේ, එහෙම වැඩ ආවරණය කළාද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එපමණයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉතින් අර විධියටම ඔබතුමාට උත්තර දෙන්නම්. ලිඛිතව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇමතිවරයෙකු හැටියට අවබෝධයක් තිබෙන්න ඕනෑ. අතුරු ප්‍රශ්නයක් එතුමා අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ප්‍රශ්නවලට මට එහෙම කාලය දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා හිතනවාද මගේ අමාත්‍යාංශයේ ඉන්න සියලුම සේවකයින්ගේ පත්වීම් දිනයි විශ්‍රාමික දිනයි දන්න ඇමතිවරයෙක් කියලා මම. මම නොවෙයි, ලංකාවේ ජනාධිපතිවත් දන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔය පිළිබඳව සාමාන්‍ය අවබෝධයක් තිබෙන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට අවබෝධයක් තිබෙනවා. මම අනවබෝධයෙන් යුක්ත කෙනෙකු නොවෙයි. මම මේ බොහොම අවංකව කියන්නේ. මේ ප්‍රශ්නයට ගරු සභාපතිතුමනි, -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට සමස්තය ගැන අවබෝධයක් නැතිව ඇති. හැබැයි, මම ප්‍රශ්නයක් අහලා තිබෙනවා, නිශ්චිත ප්‍රශ්නයක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේකේ විය යුතු දේ තීරණය කරන්න කෝ? විය යුතු දේ එවැනි නිලධාරීන් පත් නොකර සුදුසු අය පත් කරන්න කියන අදහසේ පිහිටලා නේ කථා කරන්නේ. ඒකට ඇමතිවරයා හැටියට මම සූදානම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. දැන් මම අහනවා, ඊළඟ ප්‍රශ්නය.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් එහෙම විශ්‍රාමික නිලධාරියෙකුව මේ ක්‍රීඩා නිලධාරීන් සිටිද්දී පුහුණුකරු තනතුර සඳහා වැඩ ආවරණය කරලා රජයේ මුදල් අවභාවිතා කරලා තිබෙනවා. ඔබතුමා කියනවා. ඒක දන්නේ නැහැ, දැක්කේ නැහැ. දැන් ඇමතිවරයා විධියට අඩුම තරමේ ඔබතුමා අමාත්‍යාංශයේ ඉන්න සමස්ථ සේවක සංඛ්‍යාව ගැන දන්නේ නැතිව ඇති. හැබැයි, මේ ප්‍රශ්නයට අදාළවත් අඩුම තරමේ ඔබතුමාට අවබෝධයක් තිබෙන්න ඕනෑ නේද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

දැන් ප්‍රශ්නය අහන ඔබතුමා දන්නවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දන්නවා. ඒ නිසා නේ මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔය කියන නිලධාරියා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විශ්‍රාම ගියේ කවදාද කියලා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පුරප්පාඩු 05 ක් තිබුණා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ කියන නිලධාරියා විශ්‍රාම ගියේ කවදාද කියලා ඔබතුමා දන්නවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා මාර ප්‍රශ්නයක් නේ මගෙන් අහන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒක තමයි. ප්‍රශ්නයක් අහනවා නම් ගරු මන්ත්‍රීතුමා, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අහන්නේ ඒ නිසා නේ? දන්නේ නැති නිසා තමයි ඔබතුමාගෙන් අහන්නේ. දන්නවා නම් එතුමා අහන්නේ නැහැ නේ ඔබතුමාගෙන්. දන්නේ නැති නිසා අහන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දන්නවා නම් ප්‍රශ්න අහන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අහන්නේ නැහැ නේ ඔබතුමාගෙන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඉතින් මම දීපු උත්තරේ සාධාරණයි. දෙවැනි උත්තරෙත් සපයන්න කැමැතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ ඊළඟ ප්‍රශ්නෙත් සාධාරණයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න. රීතිය යටතේ අපට සාකච්ඡා කරන්න ඉඩ ප්‍රස්ථාවක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට එපමණ දුර -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ රීතිය යටතේ. මම කැමැතියි ඔබතුමාට ලිඛිතව උත්තරයක් දෙන්න. ලිඛිතව උත්තරයක් හෙට දවස තුළ එතුමාට දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හෙට දවස තුළ උත්තරයක් දෙනවා. හෙට දවස තුළ දෙන්නේ. හතර වැනි ප්‍රශ්නයත් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේමයි. ඒකත් ගරු අධ්‍යාපන ඇමතිතුමාට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/04)**

අ. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ස්ථිර ක්‍රීඩා පුහුණුකරුවන් කොපමණ සංඛ්‍යාවක් සිටින්නේද? යන්නත්, ඔවුන්ගේ පුහුණු වැඩසටහන් සඳහා 2018 වසරේ කොපමණ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබේද? යන්නත්, එම වැඩසටහන් මොනවාද? යන්නත් මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. ක්‍රීඩා නිලධාරීන් බඳවා ගැනීමේ නියමිත ක්‍රමවේදයෙන් බැහැරව බාහිර අයදුම්කරුවන්ගෙන් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සම්පූර්ණ කිරීමේ උත්සාහයක් ගෙන ඇති බව දන්නෙහිද ?

ඇ. එම උත්සාහය ගන්නා ලද්දේ කවුරුන්ද? යන්නත්, මේ වන විට බඳවා ගැනීමේ පටිපාටියේ උපදෙස් මාලාවට පටහැනිව වසර 5 ක් වැනි කෙටි කලකින් ක්‍රීඩා නිලධාරීන් පුහුණුකරුවන් ලෙස පත්වීමට අවශ්‍ය සුදුසුකම් බඳවා ගැනීමේ පටිපාටියට ඇතුලත් කිරීම නීත්‍යානුකූල නොවන බවත් ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස පත්වීම් ලැබීමට කටයුතු නොකරන පුහුණුකරුවන්ගේ වැටුප් විෂමතා ඉවත්

කිරීමට මේ වන විට ඔබතුමා විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක්ද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද ?

ඉ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොම තිබෙන්නේ ක්‍රීඩා සම්බන්ධයෙන්මයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අ. 11 යි.

කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී, ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් සඳහා ඉහළ උන්නතාංශ පුහුණුව පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව - රු. 209,100.00

බස්නාහිර පළාතේ ක්‍රීඩා නිලධාරීන් සඳහා ක්‍රීඩාවේ නව නීතිරීති අන්තර්ජාතික ප්‍රමිති හා ක්‍රීඩා සෞඛ්‍යය පිළිබඳ පුහුණුව.රු 1,000,000.00

ආ. නොදනී.

ඇ. ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා බඳවා ගැනීමේ බලතල පවතිනුයේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවයි. දැනට බලාත්මකව පවතින්නේ 2010.04.27 දින අනුමත බඳවා ගැනීම් පටිපාටියයි. එම පටිපාටියට අනුව ක්‍රීඩා පුහුණුකරු තනතුරට පත් විය හැක්කේ, ක්‍රීඩා නිලධාරී ලෙස වසර 05 ක සේවා කාලයක් සපිරීමෙන් පසුවයි. කෙසේ වුවද, පළාත් 09 සඳහාම පොදු බඳවා ගැනීම් පටිපාටියක් සැකසීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව කටයුතු ආරම්භ කර ඇත.

ඇ. ක්‍රීඩා පුහුණුකරු තනතුරට පත් විය හැක්කේ වසර 05 ක සේවා කාලයක් ඇති ක්‍රීඩා නිලධාරීන් හටයි. එම තනතුර අතර වැටුප් විෂමතාවයක් නොමැත.

| | වැටුප් කේතයන් | ආරම්භක වැටුප් පියවර |
|---|---|---|
| සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණ) | SL 1 -2016 | 47,615.00 |
| දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී | MN7 - 2016 | 41,580.00 |
| ක්‍රීඩා පුහුණුකරු | MN3 - 2016 | 31,040.00 |
| ක්‍රීඩා නිලධාරී | MT2 - 2016 | 29,840.00 |

ඉ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමා කිව්වා, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් පොදු පටිපාටියක් සදමින් තිබෙනවාය කියලා. මගේ දැනුමේ හැටියට පොදු පටිපාටියක් හදලා තිබෙන්නේ. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ බස්නාහිර පළාත තවමත් ඒ පොදු පටිපාටියට අනුගතව වැඩ කරන්නේ නැහැ. ඒක තමයි තිබෙන ගැටළුව. ඔබතුමා ඒ සම්බන්ධයෙන් කුමක්ද පැහැදිලි කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඇත්ත වශයෙන්ම ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව මම සොයලා ඉතා නිවැරදි උත්තරයක් දෙනවා විතරක් නොවෙයි, අපේ එහෙම අඩුපාඩුවක් තිබෙනවා නම්, ඒ කාරණය නිවැරදි කරන්නත් මම අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ පොදු පටිපාටිය අනුව වසර 08 කින් තමයි ක්‍රීඩා නිලධාරීන් පුහුණුකරු තනතුරට වසර 08 කින් යන්න පුළුවන්. නමුත් බස්නාහිර පළාතේ ඒක වසර පහක් බවට පත් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් ඔබතුමා පැහැදිලි කරනවා නම් වඩා හොඳයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ වාගේම වැටුප් විෂමතාවය සම්බන්ධයෙනුත් යම් ගැටළුවක් තිබෙන බවට තමයි ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන් සඳහන් කරන්නේ. ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්නය කියලා ඉල්ලනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි. මැදිහත්වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්වැනි ප්‍රශ්නය රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ. එතුමිය සභා ගර්භයේ නැහැ. ගරු විපක්ෂ නායකතුමාත් සභා ගර්භයේ නැහැ. ඔබතුමා පිළිතුරු සභාගත කරන්න.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නවලට පිළිතුරු සූදානම්. පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**05.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/05)**

*ප්‍රශ්නය :*

*අ. බස්නාහිර පළාතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සී/ස කෙහෙල් ඇල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හා ලිපිනයන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?*

*පිළිතුර :*

*අ. 2018.09.30 දින සිට වසර 03 ක කාලයක් සඳහා පත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය.*

| | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 01. | ඩබ්ලිව්.පී.එස්.ආර්.ඒ. වික්‍රමසිංහ | සභාපති | අමරසේකර මාවත, බඩල්ගම. |
| 02. | වින්සන් බුලත්සිංහල | උප සභාපති | වයලවිලා කෝන්ගොඩමුල්ල, කටාන. |
| 03. | එච්.පී.එස්. සීලදාස | අධ්‍යක්ෂ | ශ්‍රී සෝරත මාවත, කොස්හේන, බඩල්ගම. |
| 04. | කේ.එන්. උදයසිරි | අධ්‍යක්ෂ | 59/සී/3, දිසාගේවත්ත, කටාන. |
| 05. | වී.කේ. චන්ද්‍රසිරි | අධ්‍යක්ෂ | පැතිගොඩ, බඩල්ගම. |
| 06. | ටී.ඒ.ආර්. ප්‍රියදර්ශන | අධ්‍යක්ෂ | 13, කෝපිවත්ත ජනපදය, අම්බලයාය, කටාන. |
| 07. | එම්.ටී. ගුණවර්ධන | අධ්‍යක්ෂ | 36, මැල්ලවගෙදර |

*2015.05.31 දින සිට 2019.09.30 දක්වා පත්ව සිටින අධ්‍යක්ෂ මණ්ඩලය.*

| | නම | තනතුර | ලිපිනය |
|---|---|---|---|
| 01. | ඩී.එස්.එස්. කන්නන්ගර | සභාපති | පහල මඩම්පැල්ල, කටාන. |
| 02. | ඩබ්ලිව්.පී.එස්.ආර්.ඒ. වික්‍රමසිංහ | උප සභාපති | අමරසේකර මාවත, බඩල්ගම |
| 03. | එච්.පී.එස්. සීලදාස | අධ්‍යක්ෂ | ශ්‍රී සෝරත මාවත, කොස්හේන, බඩල්ගම. |
| 04. | කේ.එන්. උදයසිරි | අධ්‍යක්ෂ | 59/සී/3, දිසාගේවත්ත, කටාන. |
| 05. | වින්සන් බුලත්සිංහල | අධ්‍යක්ෂ | වයලවිලා කෝන්ගොඩමුල්ල, කටාන. |
| 06. | ඒ.ඒ.එන්. වසන්ත | අධ්‍යක්ෂ | මැල්ලවගෙදර |
| 07. | එස්.එම්.ආර්. වික්‍රමතිලක | අධ්‍යක්ෂ | ඉහල මඩම්පැල්ල, මීරිගම. |

*ප්‍රශ්නය :*

*ආ. මෙම සමූපකාර සමිතියෙන් වර්ණකුල ආදිත්‍ය සෙම්බුකුට්ටිගේ නදුන් ලහිරු ප්‍රිමාල් ජැන්ස් අංක 144/1, කොච්චිකඩේ පාර, හල්පේ, කටාන යන අය 2008 සහ 2010 වසරවලදී ණය මුදලක් රැගෙන ඇත්තේද ?*

*පිළිතුර :*

*ආ. ඔව්.*
*නදුන් ලහිරු ප්‍රීමාල් යන අය 2010.12.06 දින රු. ලක්ෂ 05 ක පමණ ණය මුදලක් ලබා ගෙන ඇත.*

*ප්‍රශ්නය :*

*ඇ. ඉහත තැනැත්තා ණය නොගෙවීම හේතුවෙන් ඇපයට තැබූ දේපල වෙන්දේසි කර ණය මුදල අය කර ගෙන ඇති බව ඔබතුමා දන්නේද?*

*පිළිතුර :*

*ඇ. ඔව්.*
*මීගමුව දිසා අධිකරණයේ තීන්දුව පරිදි 2015.06.23 දින පවත්වන ලද වෙන්දේසියේදී අදාළ දේපළ රුපියල් ලක්ෂ 09 කට වෙන්දේසි වී ඇති අතර, සමිතියේ ණය මුදල අය කර ගෙන ඇත.*

*ප්‍රශ්නය :*

*ඈ. එකී රු. 2,165,600/- මුදලකට තක්සේරු කර තිබූ දේපල වෙනත් බාහිර පුද්ගලයන් කිසිවෙක් සහභාගී නොවූ වෙන්දේසියකදී රුපියල් ලක්ෂ නවයක ලන්සුවක් තබා රුපියල් ලක්ෂ දහතුනක මුදලකට (රු. 1,300,000-) මිලට ගෙන ඇත්තේ එකී සමූපකාරයේම වෙන්දේසියට සහභාගී වූ සමූපකාර අධ්‍යක්ෂවරයෙක් වන එම්. එම්. ස්ටීවන් පාරිස් කරුණාරත්න නමැත්තා බව ඔබතුමා දන්නේද?*

*පිළිතුර :*

*ඈ. අදාළ දේපළ තක්සේරු වටිනාකම රු. 2,165,600/- ලෙසට අධිකරණයේ උසාවි කොමසාරිස් වෙන්දේසිකරු හා තක්සේරුකරු වන එම්.ජේ. එදිරිසිංහ මහතා විසින් තක්සේරු කර වාර්තාව ලබා දී ඇත. වෙන්දේසි වාර්තාව අනුව රු. 900,000/- කට කටාන, අම්බලංයාය, අංක 138 හි පදිංචි මහීපාල මුදලිගේ ස්ටීවන් පාරිස් කරුණාරත්න නමැති අයට විකුණා ඇත. එකී ගැනුම්කරු සී/ස කෙහෙල්ඇල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂවරයෙකු නොවේ.*

*ප්‍රශ්නය :*

*ඉ. එකී ණය ගනුදෙනුවට අදාල ගිණුම් සහ ලිපි ලේඛන සියල්ල ඔබතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?*

*පිළිතුර :*

*ඉ. ඔව්. පහත ඇමුණුම්[1] ඉදිරිපත් කරමි.*

| | |
|---|---|
| *මෙම ගනුදෙනුවට අදාළව නදුල් ලහිරු ප්‍රිමාල් යන අය විසින් සමිතියේ තබා ඇති ණය ඔප්පුව* | *ඇමුණුම 01* |
| *එම ණය ඔප්පුවට අදාළව අත්සන් කර ඇති ඇප ඔප්පුව* | *ඇමුණුම 02* |
| *ශර්ලි අමරසේකර නීතිඥවරයා විසින් ලියන ලද උකස් ඔප්පුව* | *ඇමුණුම 03* |
| *ණය කුවිතාන්සිය* | *ඇමුණුම 04* |
| *තක්සේරු වාර්තාව* | *ඇමුණුම 05* |
| *වෙන්දේසි වාර්තාව* | *ඇමුණුම 06* |
| *ණය ලෙජරය* | *ඇමුණුම 07* |
| *තීරක තීන්දුව* | *ඇමුණුම 08* |
| *උසාවි බලගැන්වීමේ ලිපිය* | *ඇමුණුම 09* |

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.

*ප්‍රශ්නය :*

*ඊ. මේ ආකාරයට සමූපකාර නිලධාරීන් මහජනයා ගසාකෑම පිළිබඳව ඔබතුමා විසින් නීතිමය පියවර ගන්නේද?*

*පිළිතුර :*

*ඊ. සමූපකාර නිලධාරීන් විසින් අයථා පරිදි කටයුතු කර ඇති බවට අනාවරණය නොවේ.*

*ප්‍රශ්නය :*

*උ. නොඑසේනම් ඒ මන්ද?*

*පිළිතුර :*

*උ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට හයවැනි ප්‍රශ්නය ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු වෙන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන් ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. එතුමා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. හය සහ හත කියන ප්‍රශ්න දෙකටම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්න දෙකටම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඉතින් කරන්න දෙයක් නැහැ නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මෙහෙම සැරින් සැරේට නැගිටලා කථා කරන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් ඉන්න. කියන්නේ මොකක්ද කියලා ඇහුවේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් හරි මොකක් හරි කියලා අහන්න. මට නිකම් අහන්න දෙන්න බැහැ. සභා රීතියක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕනෑ ඕනෑ වෙලාවට නැගිටින්න බැහැ. සභා රීතියක් තිබෙනවා. මොන ප්‍රශ්නයට අදාළවද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ප්‍රශ්නවලට අදාළ එකක්. ඒකයි නැගිට්ටේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය ඉවරයි නේ? දැන් ඊළඟ ප්‍රශ්නයට අපි ගියා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගිය සභාවේදී මගේ ප්‍රශ්නයකට අදාළව සභාගත කළා උත්තරයක්. ඒ වෙලාවෙදි ඔබතුමාම කිව්වා, ඊළඟ සභාවේදී මට අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව දෙනවාය කියලා. ඒකට අදාළව ප්‍රශ්න අහන්න මම නැගිට්ටේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්නම්. මේ ටික ඉවර වුණාම මම දෙන්නම් ඔබතුමාට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. ප්‍රශ්න ඉවර නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට සැරින් සැරේ අවස්ථාව දෙන්න බැහැ. එක පාරටම නැගිටලා ඉවර වෙලා. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම දැන ගන්න කැමැතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

න්‍යාය පත්‍රයේ ප්‍රශ්න අවසන් නිසා තමයි මම නැගිට්ටේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍ර යේ තිබෙනවා. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සමාවෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඒක මගෙන්ද? ගරු මහ ඇමතිතුමාගෙන්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාගෙන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගෙන්. ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් මම එකක් කියන්න ඕනෑ ගරු සභාපතිතුමනි, දැන් මම දන්නේ නැහැ මෙතැන එකශ්‍රැතය තිබෙන මන්ත්‍රීවරු ඉන්නවා වාගේ. මේක off කරන්නේ කවුද? ඔබතුමාගේ අවසරය නැද්ද මට කථා කරන්න. ඉතින් මම නතර කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ප්‍රශ්නය ගැන නිවැරදි කිරීමක් කරන්නේ. දැන් හිටපු ගමන් මේ සභාවේ ඕනෑම කෙනෙකුගෙන් ප්‍රශ්නයක් අහනවා. ගරු සභාපතිතුමනි, අපි දන්නේ නැහැ නේ? දැන් ගිය සතියේ ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධ මගෙන් අද විමසනවා නම්, මාව කලින් දැනුවත් කළ යුතුයි. සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් ගරු සභාපතිතුමාගේ නියෝග පරිදි. නැත්නම් මම දන්නේ නැහැ මේකේ උත්තර දෙන්න. ඒක කියන්න එපැයි. ඒක ඔබතුමන්ලා කවුරුත් පිළිගන්න ඕනෑ. මට උදේ හරි දෙන්න ඕනෑ. මේ ප්‍රශ්න අහන්න බලාපොරොත්තුව පවතිනවා කියලා හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි ගරු ඇමතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නිවැරදි කර ගැනීම. පැහැදිලි කර ගැනීම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාවේ ඇමතිවරයෙක්. අධ්‍යාපන විෂය භාර ඇමතිවරයා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ ප්‍රශ්නය සභා ලේකම් කාර්යාලයට යොමු කරන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ප්‍රශ්න අහනවාට කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාවේ ඉන්න. මේ පැය හතරහාමාරක පුංචි කාලය ඉන්න. නැතිව ඔබතුමා සභාවේ නොසිට සභා ලේකම් කාර්යාලයට වරද පටවන්න එපා. ඒක වැරදියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ යුතුකමක් තිබෙනවා, -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වරද පටවනවා නොවෙයි. මේ කියන එක පොඩ්ඩක් පැහැදිලි කරන්න ඉඩ දෙන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරු ප්‍රශ්න අහනවා. අතුරු ප්‍රශ්න අහනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වරද පටවනවා නොවෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් විනාඩියක් දෙන්න කෝ? ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්න අහනවාට මම කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඒක තමයි. කැමැතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම දන්නේ නැහැනේ දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමා සභාවේ ඉන්න එපැයි. දැන ගන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එහෙම නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මේක වෙන කෙනෙකුට බෝලය පාස් කරන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ප්‍රශ්නය දැන් මම වෙනස් කරන්න ඕනෑ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගියවර සභාවට ආවේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

දැන් ඔය සභාව කල් තබන වෙලාවෙ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාවට ඇවිල්ලා 1.30 වන කල් මේ සභාවේ ඉන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. මම සභාවට ආවේ නැහැ. ඔබතුමාට ඕනෑ නම් මම මෙඩිකල් රිපෝට් එක ඉදිරිපත් කරන්නම්. තේරෙනවා නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම අවශ්‍ය නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා මට එහෙම අපහාස කරන්න එපා. මම අදත් නර්සින් හෝම් එකේ ඉඳලා ආවේ. මම කාටවත් හයේ කථා කරන්නේ නැහැ. මම වැරදි වැඩ කරන මිනිහෙක් නොවෙයි. මේ බොරු කියනවාද? ඔබතුමා රීතියට කටයුතු කරන්න සභාපතිවරයා හැටියට. ඔබතුමා රීතිය දන්නේත් නැහැ. ඔබතුමා රීතිය දන්නේ නැති හින්දා ප්‍රශ්නය අවුල් කර ගෙන ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය පැලැස්තරයක් ගහගෙන ආවාට මට කරන්න දෙයක් නැහැ. පැලැස්තර ගහගෙන -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම පැලැස්තර ගහගෙන එන මිනිහෙක් නොවෙයි. මම මේ ඔක්කොම විඳ දරා ගෙන එනවා. මට තිබෙනවානේ වගකීමක්. මම තමයි මේ සභාවේ වැඩියෙන්ම උත්තර දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැඩියෙන්ම ප්‍රශ්න අහන්නෙත් ඔබතුමාගෙන් නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම සූදානම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට නේ ප්‍රශ්න ඔක්කොම තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා අහන ප්‍රශ්නවලට උත්තර දෙන්නත් සූදානම්. මම නිවැරදි කිරීමක් කරන්න ගරු මන්ත්‍රීතුමාට කථා කළේ. වෙන ගැටළුවකට නොවෙයි. මට උදේ දෙනවා නම්, පසුගිය සභා වාරයේ ප්‍රශ්නයට අද මම අතුරු ප්‍රශ්න අහන්න බලාපොරොත්තු වෙනවාය කියලා. ඒ මන්ත්‍රීතුමාගේ හදවතත් ඒකට කැමැති වෙයි. මේක සාධාරණ ඉල්ලීමක් නේ? දැන් ආපු ගමන්ම මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා - සමහර වෙලාවට මම දන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම කැමතියි එතුමාට අවසර දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමා, පසුගිය සභා වාරයේදී මට මේ ප්‍රශ්නයට අදාළව බරපතළ අතුරු ප්‍රශ්න ගණනාවක් තිබුණා. මොකද, මේ ප්‍රශ්නයට දීලා තිබෙන උත්තරය සම්පූර්ණයෙන්ම මේ සභාව නොමග යවන එකක්. මේ සභාව සම්පූර්ණයෙන්ම නොමග යවලා තිබෙනවා. මේ ප්‍රශ්නයට දෙවැනි උත්තරයේදී -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මම කැමැතියි. විනාඩියක් දෙන්න. මම කැමැතියි උත්තර දෙන්න. මාව වරදවා තේරුම් ගන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක තමයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නිවැරදි උත්තර දෙන්න, මම උදේ දැන ගන්න එපැයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් ගිය සභාවේ ප්‍රශ්නයක් යොමු වුණා නේ? තලපත්පිටිය සිද්ධාර්ථ විද්‍යාලය ගැන ප්‍රශ්නයක් යොමු කළා. මේ ප්‍රශ්නයට අදාළව දැන් මේ වන කොට ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්න ඕනෑ නේ? සති දෙකක් වෙනවා දැන් ප්‍රශ්නය අහලා. ඔබතුමා මේ ගැන දැන ගන්න ඕනෑ නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මම කැමැතියි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා අවසර දෙනවා නම්, මේ ප්‍රශ්නය මතු වුණු නිසා - මොකද, දිගින් දිගටම මේ සභාවේ මේ ප්‍රශ්නය මතු වෙනවා. එකක් තමයි, එවැනි විශේෂ ප්‍රශ්නයක් සම්බන්ධව ඊළඟ සභාවට උත්තර දෙන්න ඕනෑය කියලා ගැටළුවක් මතු වුණාට පස්සේ, ඔබතුමාගේ පැත්තෙන් ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට වගකීමක් තිබෙනවා, අදාළ ඇමතිතුමාව දැනුවත් කරන්න. ඒ වාගේම තමයි ඇමතිතුමාගේ වගකීමක් තිබෙනවා. ඇමතිතුමා මේ සභාවේ නැත්නම්, ඔබතුමන්ලාට කාර්ය මණ්ඩලයක් දීලා තිබෙනවා. ඔබතුමන්ලාට ලේකම්ලා ඉන්නවා. නිලධාරීන් ඉන්නවා. ඒ අය මේ සභාවට එන්න ඕනෑ. ඒ අය ඔබතුමන්ලාව දැනුවත් කරන්න ඕනෑ. දැනුවත් කරලා මේ සභාවට උත්තර දෙන්න ඕනෑ. මොකද, මන්ත්‍රීවරයාගේ වරප්‍රසාද රකින්න ඕනෑ. ඒක ඔබතුමාගේ පැත්තෙන් වෙන කාරණයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නය දැන් දිගින් දිගටම විවාදයට යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට තත්පර දහයක් දෙන්න. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ අදහස හොඳයි. මම මගේ උත්තර ටික ඔක්කොම සකස් කරලා ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමාගේ අතට පත් කළා. මොකද, මට එවෙලේ තිබුණු තත්ත්වයත් එක්ක. ඒ නිසාවෙන්

[ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා]

එතුමන්ලාත් එහෙම සාධාරණව උත්තර සපයනවා. මේකට මහ ලොකු ශබ්දයක් කරන්න දෙයක් නොවෙයි. මම නිවැරදි කරන්න උත්සාහ කළේ. ප්‍රශ්නයට වඩා නිවැරදි උත්තරයක් දෙන්න පුළුවන් නේ මේක මට උදේ දුන්නා නම් කියන එක මම මේ කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ චෝදනාව ඔබතුමා කරන්න ඕනෑ කාටවත් නොවෙයි. ඔබතුමාගේ කාර්ය මණ්ඩලයට. ඔබතුමාගේ කාර්ය මණ්ඩලයක් ඉන්නවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. මේ සභාවේ ප්‍රකාශ -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒවාට වැටුප් ගෙවනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සභාවේ ඊළඟ සභා වාරය පවතින්නේ, ක්‍රියාත්මක වෙන්නේ කෙලෙසද කියන තීන්දුව තිබෙන්නේ සභා කටයුතු කාරක සභාවේ ප්‍රධානියාගේ අතේ. සභාපති අතේ. මගේ අතේ නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්න සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා නේ? මේ හැන්සාඩ් එක දෙන්නේ සභාවක් ඉවර වෙලා ඊළඟ සභාව එන දවසට මේ මේසය උඩට. මේ හැන්සාඩ් එක අරින්න ඕනෑ න්‍යාය පත්‍රය එක්ක. එතකොට අපි කියවලා බලලා ඒ හැන්සාඩ් එකේ තිබෙන, ඇමතිවරු දීලා තිබෙන උත්තර අනුව ක්‍රියා කරලා තිබෙන්නේ මොනවාද කියලා ඊළඟ සභාවේ අහන්න පුළුවන්. ඒ ගැන මොකක්ද තිබෙන වැරැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට න්‍යාය පත්‍රය වෙලාවට එනවා නේද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අමාත්‍යවරුන්ට වෙනම අරින්න ඕනෑ. මන්ත්‍රීවරුන්ට න්‍යාය පත්‍රය එක්ක අරින්න ඕනෑ. නැත්නම් මේකේ තිබෙන ටේප් එක හරි අරින්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, හැන්සාඩ් ඔක්කොම අරින්න වෙලාවක් නැහැ හදිසියේ ඊළඟ සභාවට. ඔබතුමන්ලාට න්‍යාය පත්‍රයක් එවනවා. ඔබතුමන්ලා ලැහැස්ති වෙන්න, සභා ලේකම් කාර්යාලයෙන් ඒක සොයා ගෙන.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි මේක කියවනවා. බලනවා. දැන් මේ හැන්සාඩ් එක. එතකෙට කොහොමද අහන්නේ අපේ තිබෙන රීති මාලාව අනුව. අහන්න බැහැ. එතකොට වේලාසනින් තිබෙනවා නම්, අපට පුළුවන් ඔබතුමාට යොමු කරලා, රීති අංක යටතේ ඒ ප්‍රශ්නයට උත්තරය අහගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මන්ත්රීතුමා ඒකේ ප්‍රශ්නයක් නැහැ. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමල්ලාට අපි වෙලාවට න්‍යාය පත්‍රය එවනවා. ඔබතුමා න්‍යාය පත්‍රය කියවලා ඔබතුමන්ලාට ඒ ගැන කරුණු ගන්න පුළුවන් සභා ලේකම් කාර්යාලයෙන්. අවශ්‍ය හැන්සාඩ් ගන්න පුළුවන්. ටේප් එක අහන්න පුළුවන්. කිසි ප්රශ්නයක්, තහනමක් නැහැ ඒවායේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පසුගිය සභා වාරයකදී මම ඇහුවා, නුගේගොඩ සමුද්‍රදේවි විද්‍යාලයට ඒකාබද්ධ කරපු විජේරාමයේ ජයසිංහ විද්‍යාලයේ පන්ති කාමරයක් සම්බන්ධව. ඒ ප්‍රදේශයේ අයට දෙනවාය කියලා කැබිනට් පේපර් එකක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙතෙක් කල් හිටියා නේ? ඔබතුමාත් ඇමතිවරයෙක් වශයෙනුත් හිටියා. ඔබතුමාත් අවුරුදු 25 ක් විතර පළාත් සභාවේ හිටියා නේ දැන්. මේ අන්තිම සභා හතරට ඕවා කථා කරලා තේරුමක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

උත්තරයක් දෙන්න ඕනෑ මේවාට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා මෙතුමාගෙන් උපදෙස් ටිකක් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගන්න ඕනෑ. ඒක තමයි. වෙලාවක මම ඔබතුමාව පොඩ්ඩක් මුණ ගැහෙන්නම්. උපදෙස් ටිකක් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා අවසර දෙනවා නම්. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇවිල්ලා සිටින නිසා මගේ ප්‍රශ්න දෙකට පුළුවන් නම් උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් එතුමා සති දෙකක් කල් ඉල්ලා ගත්තා නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන් නම් ප්‍රශ්නයක් නැහැ. එතුමා ලැහැස්තියි උත්තර දෙන්න. එහෙම නම් ඔබතුමා උත්තර දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ලක්ෂ්මන් මගෙ මිත්‍රයා නේ?

**06.**

**ලක්ෂමන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන සහ ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/06)**

අ. උපමාන පාදක ප්‍රදානවලට අමතරව සංවර්ධන කටයුතු සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන සහ අනෙකුත් ප්‍රතිපාදන වෙන් කිරීමේදී මන්ත්‍රීවරුන් හරහා යෝජනා ලබාගැනීමට කටයුතු කරන්නේද?

ආ. මේ සඳහා අනුගමනය කරන විධිමත් ක්‍රමවේදයක් තිබේද ?

ඇ. ලබන අප්‍රේල්වලින් පසුව පළාත් සභා මන්ත්‍රී ධූර හා අමාත්‍යවරුන්ගේ හා ධූරධාරීන්ගේ ධූරයන් අවසන් වන බව පිළිගන්නේද?

ඈ. ඒ අනුව ප්‍රතිපාදන යෙදවීමේදී සංවර්ධනය සඳහා අවධානය සහිතව මුදල් යෙදවීමට වඩා ඉදිරි මැතිවරණ ඉලක්කයන් සහිතව කටයුතු කිරීමට ඇති නැඹුරුතාව පිළිගන්නේද?

ඉ. 2019 ජනවාරි 08 වැනි දින සභාවේදී සභාගත වූ ලිපිලේඛන එයට සාක්ෂි බව පිළිගන්නේද?

ඊ. මුදල් කටයුතු භාර අමාත්‍යවරයා ලෙස මේ පිළිබඳව ඔබතුමාගේ මතය සහ ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

මෙම අමාත්‍යාංශයට අයත් සියලුම ප්‍රතිපාදන මන්ත්‍රීවරුන්ට වෙන් නොකරන අතර පළාත් ආයතන හා පොදු මහජනතාව විසින් අමාත්‍යාංශය වෙත ලබා දෙන සංවර්ධන යෝජනා සඳහා ද ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. සංචාරක මණ්ඩලය, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංවර්ධන සැලසුම සඳහා ද ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරනු ලබයි.

ඇ. ඔව්. සභාපතිවරයා හැර.

ඈ. නැත.

අමාත්‍යාංශයට වෙන් වන මුදල් අමාත්‍යාංශ විෂයයන්ට අදාළව ඉදිරිපත් කරන යෝජනා සඳහා පමණක් ප්‍රමුඛතාවය හඳුනාගනිමින් අනුමත කරන අතර, එම ව්‍යාපෘති ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. එබැවින් එම ව්‍යාපෘති පොදු මහජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පමණක් සිදු කරන අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටළු මතු වෙන්නේ නම් ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම මෙන්ම එම ව්‍යාපෘති අමාත්‍යාංශයේ නිරන්තර අධීක්ෂණයට ලක් කෙරේ.

ඉ. ලිපිලේඛන නිරීක්ෂණයට ලක් නොවූ බැවින් ඒ සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කළ නොහැක.

ඊ. අවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාර්ග ගනිමි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා 'ඊ' ප්‍රශ්නයට උත්තර දෙන්නේ ඒ සම්බන්ධව අධීක්ෂණයට ලක් වුණේ නැහැයි කියලා. මොකද, ගිය සභාවේදී ඒ ලිපි ලේඛන ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, සභාගත වුණා. ඒකෙන් මම විශ්වාස කරන්නේ ඔබතුමාගේ අධීක්ෂණයට ලක් වෙනවා කියලා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒ නිසා හරිනම් සාධාරණ උත්තරයක් ඒ 'ඊ' සඳහා දෙන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඇත්තටම මේ කාරණා සම්බන්ධයෙන් මමත් ගරු සභාපතිතුමනි, දැනුවත් වුණේ සභාවේදී. ඒ අනුව ගරු මන්ත්‍රීතුමා ඉල්ලලා තිබෙන ප්‍රශ්නවලට තමයි මම පිළිතුරු සපයලා තිබෙන්නේ. මට නැත්නම් කල් ගන්න තිබුණා. මම සාමාන්‍යයෙන් කැමැතියි ප්‍රශ්නයක් ආවාම ඉක්මණින් පිළිතුරු දෙන්න. මොකද, ඔය කාරණාව මම හිටපු නැති වෙලාවක තමයි සාකච්ඡා වෙලා තිබෙන්නේත්. මන්ත්‍රීතුමාත් ඒක දන්නවා. ඊළඟට හත් වන ප්‍රශ්නය.

**07.**

**ලක්ෂමන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන සහ ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/19/07)**

අ. 2019 ජනවාරි 08 වැනි දින සභාගත වූ ලිපිලේඛනවල ගරු සභාපතිතුමා, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා සහ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින්, ගරු ආණ්ඩුකාරතුමා අමතා එතුමාගෙන් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කළ ඉල්ලීම් ඇති බව දන්නේද?

ආ. එහි සඳහන් පරිදි මාර්ග සංවර්ධනය සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ප්‍රතිපාදන වෙන් කර දෙන ඉල්ලීමක් ලෙසද සඳහන් බව පිළිගන්නේද?

ඇ. එම ලිපිවල සඳහන් පරිදි හිටපු ගරු ආණ්ඩුකාරතුමාද මුදල් ප්‍රතිපාදන ලබා දීමට වාචිකව එකඟ වූ බවක් හැඟවෙන බව පිළිගන්නේද?

ඈ. පළාත් මාර්ග සංවර්ධන විෂය භාර අමාත්‍යවරයෙකු සිටියදී ගරු ආණ්ඩුකාරතුමා විසින් එහි ප්‍රතිපාදන ලබා දෙන්නේ කුමන ආකාරයකටද?

ඉ. ප්‍රතිපාදන ඉල්ලීම කරන්නේ ඉදිරියේ මැතිවරණයකට ඉදිරිපත් වන නිසා, ගරු ආණ්ඩුකාරතුමාගෙන් මෙම සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ඉල්ලන බවට ලිපිවල සඳහන් බව පිළිගන්නේද?

ඊ. බැලුබැල්මට විකෘතියක් සේ පෙනෙන මෙහි තේරුම කුමක්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. 2019 ජනවාරි 08 වැනි දින සභාගත වූ ලිපිලේඛන අනුව එවැනි ඉල්ලීමක් කර තිබූ බව දැන ගතිමි.

ආ. එම ලිපිලේඛන මේ දක්වා මාගේ පරිශීලනයට ලක් වීමට හැකියාවක් නොතිබුණි.

ඇ. 2019.01.08 වන සභා ලේඛන අනුව එවැනි වාචික එකඟතාවක් ඇති වූ බව හැඟේ. කෙසේ වෙතත් සභාව ක්‍රියාත්මක වන අවස්ථාවකදී ගරු ආණ්ඩුකාරවරයාට එවැනි ප්‍රතිපාදන වෙන් කිරීමට හැකියාවක් නොමැත.

ඈ. ඉහත (ඇ) පිළිතුර අදාළ වේ.

ඉ. නොදනිමි.

ඊ. නොදනිමි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කලබල වෙන්න එපා. මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. ඔබතුමා කලබල වෙනවානේ ඉතින්. අධ්‍යාපන ඇමතිතුමා එක්ක ඔපමණ රණ්ඩු වෙන්න යන්න එපා. එතුමා හොඳ ඇමතිවරයෙක්. අධ්‍යාපන ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

රණ්ඩුවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය දෙනවා. ඔබතුමා මේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඔබතුමා න්‍යාය පත්‍රයට එන්න දෙන්න කෝ? එන්න දෙන්නේ නැහැ නේ? ඔබතුමා මේ අධ්‍යාපන ඇමතිතුමා එක්ක එල්ලෙන්නේ. අනික් අය එක්ක එල්ලෙන්න කෝ පොඩ්ඩක්. එතුමාට සහනයක් දෙන්න කෝ? නැද්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමා හුළං ගහනවා පොඩ්ඩක්. අධ්‍යාපන ඇමතිට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අසනීපෙන් ඉන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දූක හිතිලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. අපි කල්‍යාණ මිත්‍රයෝ. එහෙම ප්‍රශ්නයක් නැහැ මට. එල්ලීමක් නොවෙයි මේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම බැලුවේ අපේ නිලධාරීන් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සභාපතිතුමා හය වෙලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම අපේ නිලධාරීන් හම්බ වෙන්න යන්න බැලුවේ. ඇත්තටම මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. ප්‍රශ්නයත් මගේ ළඟ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමා මුලින් පොඩි චෝදනාවක් කළා සභා ලේකම් කාර්යාලයට. ඒක සභා ලේකම් කාර්යාලයට කරන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. චෝදනාවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරු ඉන්නවා. තව නිලධාරීන් ඉන්නවා. ඔබතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ අය ඉන්නවා. ඒ අය අනිවාර්යයෙන් සභාව දවසට එන්න ඕනෑ. ඔබතුමා නොසිටියත් ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා අසනීප වුණා කියමුකෝ. නමුත් ඔබතුමා වෙනුවෙන් ඒ අය සැදී පැහැදී ඉන්න ඕනෑ ඊළඟ සභාවට උත්තර ලැහැස්ති කරගෙන ඒවා ඉදිරිපත් කරන්න. ඔබතුමා ඒවා ආරක්ෂා කර ගන්න. ඒක මට තේරෙන්නේ නැහැ, කොහේද වැරැද්ද කියලා. හැබැයි, සභා ලේකම් කාර්යාලයට ඒ වගකීම පවරන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හොඳයි. ඔබතුමාගේ උපදෙස් පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපි පුළුවන් දෙයක් කරමු. දැන් ඔබතුමාට අවස්ථාව. ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න. එතුමාගෙන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් එතුමා සූදානම් නැහැයි කියලා කිව්වා නේ? ඒ නිසා මේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම උත්සාහ කළේ සභාපතිතුමාගේ උපදෙස් පරිදි මගේ නිලධාරීන් හමු වෙලා මෙතැනට එන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න කෝ. ගරු සභාපතිතුමනි, මම එළියට යන්න හැදුවේ මගේ නිලධාරීන් හම්බ වෙලා එන්න. මොකක්ද මේ ප්‍රශ්නය කියලා. ඔබතුමා කැමැති දෙයක් අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, මෙහෙමයි. එතුමා ඒ ගැන -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. පුංචි කාරණාවක් අවධාරණය කරන්නේ. දැන් මේ ප්‍රශ්නයට අදාළව. මේ පාසලේ ලොකු අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ වන කොට එක ගුරුවරියක් සම්පූර්ණයෙන්ම සේවය හැර ගොස් තිබෙනවා. තව ගුරුවරියක් වසර හයකට පෙර විශ්‍රාම යන්න තීරණය කර තිබෙනවා, මේ විදුහලේ විදුහල්පතිවරයාගේ ප්‍රශ්නයත් එක්ක. එතකොට මේ විදුහල්පතිවරයාගේ ප්‍රශ්නය විසඳලා නැහැ. ඒ නිසා මට මේ දීපු උත්තර ඇතුළෙත් මේ නිලධාරීන් විසින් එක පැමිණිල්ලක්, වැදගත්ම පැමිණිල්ල යටපත් කරලා තිබෙනවා. වැදගත්ම පැමිණිල්ල යටපත් කරලා තිබෙනවා මේ උත්තර ඇතුළේ. ඒ නිසා මම එක දෙයයි ඉල්ලන්නේ. මේ පිළිබඳව ඔබතුමා අවධානය යොමු කරලා, මේ ප්‍රශ්නයට දීපු උත්තරත් අරගෙන, මගේ ප්‍රශ්න ටිකත් අරගෙන මේ පිළිබඳව පුළුල් විමර්ශනයක් කරන්න. කරලා අපට උත්තරයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු ඇමතිතුමා, ඔබතුමා ඒ ප්‍රශ්නයට -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හොඳයි. මම ඒ වගකීම භාර ගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා වගකීම භාර ගන්නවා. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්න තිබෙන්නේ ප්‍රශ්නවලින් පස්සේ හොඳේ. ප්‍රශ්න අතරේ අතුරු ප්‍රශ්න අහන්න බැහැ. මම දැනුවත් කරන්න ඔබතුමාට කියන්නේ. න්‍යාය පත්‍ර යේ තිබෙන්නේ ප්‍රශ්න. අතුරු ප්‍රශ්න. දැන් ප්‍රශ්න ටික ඉවර වුණා නේ? ඒකයි ඔබතුමාට අවසර දුන්නේ. ඔබතුමා කලින් නැගිට්ටා නේ ඉස්සෙල්ලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉස්සෙල්ලා ඔබතුමා නැගිට්ටා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මහ ඇමතිතුමා හිටියේ නැහැ. එතුමාගේ ප්‍රශ්න දෙකට කල් ගන්නවාය කියලා කිව්වා. ඊට පස්සේ තමයි මම නැගිට්ටේ. ප්‍රශ්න හතම ඉවර වුණාට පස්සේ මම නැගිට්ටේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් කලබල වෙන්න ඕනෑ නැහැ. අපි වැඩේ යමු. තව මාස -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමා කලබලයි. ඒකයි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඇත්තටම අද නම් වැඩියෙන් කලබල වුණේ සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට එහෙම -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඔබතුමා ටිකක් කලබලෙන් වාගේ තමයි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමා කලබලයි අද.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා සභාපතිතුමාගේ අණට කීකරු නොවන මන්ත්‍රීවරයෙක් කියලා මගේ අත්දැකීම. දිගින් දිගටම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා, අපිත් එකඟ වෙනවා. සභාපතිතුමා කලබලයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මොන තරම් නියෝග, අවවාද දුන්නත් ඒක නොසලකා මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා නැගී සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඒ ප්‍රශ්නය ඉවරයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම නම් ගරු සභාපතිතුමා දෙන අවවාද, ඒ වාගේම උපදෙස් අකුරටම පිළිපදින්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි මට දීපු මේවා එකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට පෞද්ගලික ප්‍රකාශ ඉදිරිපත් කිරීමට -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ ගොඩනැගිල්ල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න. වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, අපට ගිය සභා වාරයේදී ඩයරියක් දීලා තිබෙනවා. ඇත්තටම හරි ලැජ්ජයි කියන්න. මේ වාගේ ඩයරියක් අපට දුන්න එක ගැන. මේක නිකම් note book කැල්ලක් වාගේ. පිටු 80 පොතක් වාගේ. බස්නාහිර පළාත් සභාව යටතේ මේ වාගේ ඩයරියක් මන්ත්‍රීවරුන්ට පාවිච්චි කරන්න කියලා දුන්න එක ගැන මම කනගාටු වෙනවා. ඒ පිළිබඳව අපේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. ඔබතුමා මේ ගැන සොයලා බලලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව මමත් කනගාටු වෙනවා. මෙතෙක් පළාත් සභා ඉතිහාසයේම මම හිතන්නේ මෙවැනි ඩයරියක්, මේ වාගේ දෙයක් මුද්‍රණය කරපු පළමු අවස්ථාව මේක.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒ වාගේම ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ලේකම් කාර්යාලයේවත්, මගේවත් වැරැද්දක් නොවෙයි. ඒක අපි පැහැදිලිවම කියන්න ඕනෑ. ගරු ආණ්ඩුකාරතුමා ඒ සඳහා අපට අනුමැතිය දුන්නේම නැහැ. කිහිප අවස්ථාවකදීම මතක් කළා. මේ ඩයරිය ගහන්න දෙන්න කියලා. රුපියල් මිලියනයයි මේ ඩයරිය ගහන්න වියදම් වෙන්නේ. නමුත් එතුමා ඒකට අවසර දුන්නේ නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

එහෙම නැත්නම් අපෙන් අඩු කරලා හරි, මන්ත්‍රීවරුන්ගෙන් ගාණක් කපලා හරි කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි උපරිම උත්සාහ කළා ඩයරියක් මුද්‍රණය කරන්න. අවස්ථාව දුන්නේම නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒක ලැජ්ජයි. ඒ වාගේම ගරු සභාපතිතුමනි, 276 ගම්පහ කඳාන පාරේ ඔබතුමාට තමයි ජනතාව බණින්නේ. අර බෝක්කුවක් කපා ගෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යෙන්.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මෙරිල් මන්ත්‍රීතුමාට කියනවා, මැදිහත් වෙලා ඒක ඉක්මණට හදලා දෙන්න. සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා බැණුම් අහනවා. මහ ඇමතිතුමට කියලා ඒක හදලා දෙන්න. අපේ සුනිල් විජේරත්න මැතිතුමා තමයි බැණුම් අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කථාව සම්පූර්ණ ඇත්ත. මමයි වැඩියෙන්ම බැණුම් අහන්නේ. මගේ ආසනය නේ?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අනාගත මහ ඇමතිතුමාට කියනවා ඉන්න මහ ඇමතිතුමාට කියලා ඒක හදලා දෙන්න කියලා. ගරු සභාපතිතුමාට තමයි බණින්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන මොකුත් කියන්න යන්නේ නැහැ. ඒ ගැන කියන්න ගියොත් ප්‍රශ්න ඇති වෙනවා. ගරු ඇමතිතුමා ඉන්නවා. ඔබතුමා ඉක්මණට මේ ගැන අනුකම්පා කරලා - නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අවුරුද්දක් ඒකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවුරුද්දක් ගියේ නැහැ. තවම මාස පහයි ගියේ. ප්‍රශ්න ආවා. ගං වතුර ගැලුවා. වතුරින් යට වුණා. මිනිස්සුන්ගේ ගොයම් කපන්න සිද්ධ වුණා. ඒ වාගේ ප්‍රශ්න වුණා. කොන්ත්‍රාත්කාරයෝ දාලා ගියා. Black list කළෙත් නැහැ. මොකුත් කළේ නැහැ. ඒ කොන්ත්‍රාත්කාරයෝ -

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගිවිසුම්ගත කාලය තුළ ඒවා කරලා අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙතුමා පොරොන්දු වෙනවා. ලබන මාසයේ, මාර්තු මාසයේ අවසන් කරනවා කියලා පොරොන්දු වෙලා තිබෙනවා. ඔබතුමා අනිවාර්යයෙන් ඒක ඉෂ්ට කරන්න. අපට ඕනෑ එපමණයි. මෙරිල් මන්ත්‍රීතුමාත් ඉන්නවා සභායට. මම හය නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ සම්බන්ධයෙන් මම සභාවේ ප්‍රශ්නයක් ඇහුවා. ඒ වෙලාවේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බෝඩ් ගහන්නේ නැතිව වැඩ කළා නම් හරි. වේලාසනින් බෝඩ් ගහලා. ඒකයි. වැඩ කරලයි බෝඩ් ගහන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ වන කොට වැස්සක් නැහැ. වැස්ස නිසා බැහැයි කියලා තමයි ඒ වෙලාවේදී උත්තර දුන්නේ. දැන් නියඟය නිසා බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කනගාටු වෙන්න එපා. කොහොමත් බෝඩ් එකක් ගහනවා. ඔබතුමාත් ගහන්නේ ඉතින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසයි ඔබතුමාට කියන්නේ. බෝඩ් නොගහා හිටියාම කවුරුවත් දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවාට ඊර්ෂ්‍යා කරන්න එපා. අපි ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. ඔබතුමන්ලා කොපමණ මුදල් ගත්තත් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඊර්ශ්‍යා කරන්නේ නැහැ. වැඩ කරලා ඉවර වෙලා බෝඩ් ගහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලිපිගොනු තිබුණා අපි ළඟ. අපි කියන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම මේ සභාව පටන් ගත්ත දිනයේම ඉල්ලීමක් කළා, අපට reading lamp එකක් දෙන්න කියලා. මේ ලයිට් ටිකත් එක්ක මේවා පේන්නේ නැහැ. මේ ඉස්සරහා ඉන්න පෙළට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි දැන් ඒ ගැන සාකච්ඡා කරලා තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ වාගේම මේ සභාව පටන් අරගෙන දැන් මාස ගණනක් ගෙවිලා ගියා. අර මහා මාර්ගයේ දෙපස දහස් ගණනක් මිනිස්සු මේ අමාත්‍යාංශවලට එනවා. එහා පැත්තෙන් පැනලා මේ පැත්තට. මේ පැත්තෙන් පැනලා එහා පැත්තට යනවා. තවම සුදු ඉරි දෙකක් ගහ ගන්න බැරි වුණා. එදා වයසක අම්මලා වගයක් හැප්පෙන්න ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක ඇත්තටම වැදගත් අදහසක්. මමත් ඒක දැක්කා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒකත් එක්කම මේ ලයිට් සිස්ටම් එකක්. Traffic light system එකක් දැම්මා නම් එතකොට අර පාරේ මඟින් පනින වෙලාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. එපමණ කියන්න ඕනෑ නැහැ. පොඩි ළමයින් නොවෙයි. අපට ඒක පැහැදිලියි. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක දාන එක මෙපමණ අමාරුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, අපට කියන්න ඕනෑ නැහැ ඕක. සුදු ඉරේ නීතිය කවුරුවත් දන්නවා නේ? අවශ්‍යයි නේ ඉතින්. මම හිතන්නේ, පාර අයිති පළාත් සභාවට නොවෙයි. ඒක RDA පාරක්. ඒ නිසා ලේකම්තුමා, අපි RDA එකට දැනුම් දීලා වහාම -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහා මාර්ග එකත් එක්ක කථා කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි. අපට කියන්න ඕනෑ නැහැ. අපට ප්‍රශ්නය තේරෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙපමණ බිල්ඩින් එකක් හදලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට තේරෙනවා. හිටපු ප්‍රවාහන ඇමතිතුමා. තේරෙන්නේ නැහැ නේ ඔබතුමාට. තේරුම් ගන්නකෝ. අපට තේරෙනවා ඒක. හරි. ඔබතුමා මට ඉදිරිපත් කරලා තිබෙනවා පෞද්ගලික ප්‍රකාශයක්. ඔබතුමාට ඒ ප්‍රකාශය ඉදිරිපත් කරන්න මම අවස්ථාව ලබා දෙනවා.

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මහරගම නගර සභා බල ප්‍රදේශයේත්, කොළඹ දිස්ත්‍රික්කයේත්, අමාත්‍යවරයෙකු වෙලා ඉන්න කාලයේත් අපේ මන්ත්‍රීවරු විවිධ ප්‍රතිපාදනවලින් දුප්පත් අයට ස්වයං රැකියා කර ගැනීම සඳහා පොඩි පොඩි කරත්ත කඩ ලබා දුන්නා. එක එක්කෙනාගේ, අපේ හෙක්ටර් බෙත්මගේ මැතිතුමාගේ නම දාලා, කෝරළගේ මැතිතුමාගේ නම දාලා වාගේ දුන්නා ස්වයං රැකියා කරන්න. මම මේ කියන්නේ. එහෙම මන්ත්‍රීවරු වෙන් කළා. නමුත් මේ වන කොට ඒ නගර සභා සීමාවල තිබෙන කඩ කරත්ත - නාගරික සංවර්ධන අධිකාරියෙන් මේක දන්නෙත් නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියත්, සමහර නගර සභාත් එකතු වෙලා මේවා අයින් කරලා. මේවා ස්වීප් කරත්ත. ස්වයං රැකියා කරන මිනිස්සු. මේ දුප්පත් මිනිස්සු. පවුලක් රැකෙන්නේ ඒ ස්වීප් ටිකෙන්. ඒ ස්වීප් ටික විකුණලා තමයි මේ රටේ ඉන්න රෝගීන් සඳහා ඒ කියන්නේ, නිදහස් සෞඛ්‍ය සේවයට මුදල් දෙන්නේ ඒ ලොතරැයි මණ්ඩලවල සල්ලිවලින්. මේ රටේ අධ්‍යාපනයට මුදල් දෙන්නේ මේ ලොතරැයි විකුණන සල්ලිවලින්.

අපේ මහ ඇමතිතුමාට තිබෙන විෂයක් පළාත් පාලන ආයතන. අපේ ලලිත් වනිගරත්න ඇමතිතුමාට පළාත් මාර්ග තිබෙනවා. එතකොට මේවායේදී කිසිම දැනුම් දීමක් ඒ මිනිස්සුන්ට නැතිව එක පාරටම ඇවිල්ලා මේවා කඩාගෙන කඩාගෙන යනවා. අපි ඉන්න කාලයේ ගහපු බස් ස්ටෑන්ඩ්. ඔක්කොම කඩලා දානවා. මේවා මහජන මුදල්. රාජ්‍ය දේපළ. පිකටින් එකක් කරලා, අර බැරියර් එකක් තල්ලු කරගෙන ගියාම කියනවා, රාජ්‍ය දේපළ විනාශ කළාය කියලා. දැන් මේවා අපේ මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත මුදලින් වෙන් කරගෙන මුදල් තමන්ගේ ඒ තුළින් ජීවිකාව කර ගන්න දුප්පත් මිනිස්සු. එතකොට මේවාට මැදිහත් වෙලා මේ ප්‍රශ්න විසඳන්න ඕනෑ. රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නත් එක්ක මේ මිනිස්සුන්ට ගහන්න, ගහන්න මේ මිනිස්සු හිඟමනට වැටෙන මිනිස්සු බවට පරිවර්තනය වෙනවා. එදිනෙදා ජීවිතයක් කර ගෙන ගිය මිනිස්සු. ස්වයං රැකියාවලින් ජීවත් වුණු මිනිස්සු. ඒගොල්ලන්ගේ දරුවන්ව පාසල් යවන්න, ඒගොල්ලන්ට එදිනෙදා ගෙවල්වලට

අවශ්‍ය වියදම, කන්න ආර්ථිකය හදා ගත්ත මේ මිනිස්සුන්ට මෙවැනි කරුණු යටතේ මේ ජීවන මාර්ග සියල්ලක්ම වැසී ගිහිල්ලා තිබෙනවා. ඉතින් මෙන්න මේ නිසා අපේ මහ ඇමතිතුමා පළාත් පාලන ආයතන කැඳවලා, පළාත් පාලන ආයතන ටිකට මේවා කියලා, මහා මාර්ග අමාත්‍යාංශයත් කැඳවලා, නාගරික සංවර්ධන අධිකාරියත් කැඳවලා මේ ප්‍රශ්න ටික විසඳලා, ඔබතුමා මේ ප්‍රදේශයේ මහ ඇමතිවරයා හැටියට ඔබතුමාට තමයි බලතල තිබෙන්නේ, ඉතින් ඒ නිසා ඔබතුමාට ඕනෑම අමාත්‍යාංශයකට කථා කරන්න පුළුවන්. කැබිනට් ඇමතිවරයෙකුගේ වරප්‍රසාද ඔබතුමාට තිබෙනවා. නමුත් මෙවැනි ක්‍රියාවලින් අපේ රටේ දුප්පත් මිනිස්සුන්ගේ ආර්ථිකය තවත් කඩා හැලෙන නිසා මේ ගැන සාකච්ඡාවක් කැඳවලා මේ කටයුත්ත ඔබතුමා හරහා කරන්න කියලා මම මතක් කරනවා. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. වෙලාවට කථාව අවසන් කළා. ඔබතුමා අර බස් හෝල්ට් කතන්දරයක් කිව්වා නේද? දැන් බස් හෝල්ට් නැහැ. කවුරු හරි ගලවාගෙන ගිහිල්ලා. බෝඩ් ටික. පසුගිය දවස්වල ගහලා තිබුණේ, බස් නැවතුම්පලවල්. ගම්පහ කච්චේරිය ළඟත් එකක් ගහලා තිබුණා. ගරු ඇමතිතුමා, ඒ බෝඩ් එක නැහැ. ගරු ඇමතිතුමා, ඒ ගැන පොඩ්ඩක් සොයලා බලන්න. මම හිතන්නේ, හැම තැනම ගලවාගෙන ගිහිල්ලා. බස් නැවතුම්පලවල්වල තිබෙන මහ ඇමතිතුමාගේ ඡායාරූපය. ඔබතුමාගේ.

මීළඟට පෞද්ගලික ප්‍රකාශය කිරීම සඳහා ගරු නියෝජ්‍ය සභාපතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන කාර්යභාරයක් පෙන්වා දෙන්න සූදානම් වන්නේ. අද අපේ රටේ අධ්‍යාපනය අවුලෙන් අවුලකට පත් වෙලා. විශේෂයෙන් බස්නාහිර පළාත තුළ අධ්‍යාපනය ජනතාවගේ දරුවන් ඇතුළත් කිරීම, ගුරු මාරු කිරීම, මේවා ජනතාවට හිසරදයක් බවට පත් වෙලා කියන එක පිළිබඳව මේ සභාවේ ඉන්න කවුරුත් ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. අද මම පෙන්වා දෙන එක පිළිබඳව මේ සභාවේ කවුරුවත් දොස් කියන්න එපා. එම අවුල් තත්ත්වය පිළිබඳව ඔබ සියලු දෙනාට හෙට, එනම් බදාදා දවසේ බස්නාහිර පළාත් සභාවේ මේ ගොඩනැගිල්ලේ දෙවැනි මහළට පැමිණ දැක බලා ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. සමස්ත ගරු මන්ත්‍රීතුමන්ලාටත්, ඒ වාගේම සියලුම මාධ්‍ය ආයතනවලටත් මම ආරාධනා කරනවා. අද මේ රටේ බොහෝ ප්‍රශ්නවලට විසඳුමක් ලබා දෙන්නේ අපේ මාධ්‍ය ආයතනවලින්. මාධ්‍ය ආයතනවලින් ඒ දෙයක් පෙන්වා දුන්නාට පස්සේ තමයි මේ රටේ වගකිවයුත්තන්ට ඒ පිළිබඳව ඇහැ ඇරිලා ඒ සම්බන්ධව අද පිළිතුරක් ලබා දීලා විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්නේ. ඒ නිසා මම අද ආරාධනා කරනවා. හෙට උදේ දහය විතර වෙන කොට මේ මාධ්‍ය ආයතනවලටත්, අපේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මේ ගොඩනැගිල්ලේ දෙවැනි මහළට ඇවිල්ලා මේ ජනතාවගේ දුක මොකක්ද කියන එක පිළිබඳව තේරුම් ගන්නය කියලා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇවිල්ලා මේ සභාවේ තමුන්නාන්සේලාට දැක බලා ගන්න පුළුවන් බදාදා දවසේ හත් සියයක්, අට සියයක් විතර මිනිස්සු දෙවැනි මහලේ දුක් විඳිනවා. අපි තවමත් මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීතුමන්ලා තවම සූදානම් වෙලා නැහැ, ඒ මිනිස්සුන්ට තේ එකක් බොන්න, කෑම වේලක් කන්න, හදලා දෙන්න පිළිවෙළකට කැන්ටිමක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, රීතිය කඩන්න වීම ගැන කනගාටු වෙනවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

සමාවෙන්න ගරු ඇමතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් ඉන්න. මේ කුණුහරුප කියවන්න එපා. මේකේ ඇමතිවරයෙක් ඉන්නවා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු ඇමතිතුමා, මගේ වෙලාව දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මෙතුමාගේ ඔලුව හොඳ නැහැ. මෙයාගේ වෛරයක් තිබෙනවා. මගේ අමාත්‍යාංශයට එන හැමෝටම මම උත්තර දෙනවා. තමුන්නාන්සේගේ තිබෙන ඔලුව හොඳ නැතිකම තමුන්නාන්සේ ගෙදර තියා ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක කථා කළේ නැහැ group meeting එකේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

Group එකේ කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මගේ අමාත්‍යාංශයට -

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු ඇමතිතුමා, තමුන්නාන්සේට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කථා කරන්න දෙන්න. කියන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මෙරිල් මන්ත්‍රීතුමා, ඔබතුමා ඉන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා අහගෙන ඉන්න ඉතින්. කථා කරන්න දෙන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මගේ අවස්ථාව දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මෙයා මෙහෙට එන්නලු අමාත්‍යාංශයට.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ඔබතුමා අහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, මට ආරංචියි එතුමා ටොෆි, බිස්කට් එහෙම ගේනවා කියලා බදාදාට.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, දෙවැනි තට්ටුවට මම මාධ්‍යයට ආරාධනා කරන්නේ, 700 ක් 800 ක් මිනිස්සු ඇවිල්ලා -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමා බොරු කියන්නේ. අමාත්‍යාංශයට එන පොඩ් අයට ගරු ඇමතිතුමා බිස්කටුයි දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් ආරංචියි ඒක. බිස්කට් ගේනවා කියලා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

සවස හතර වෙනකල් බලාගෙන ඉඳලා මිනිස්සු නැගිටලා බැහැලා යනවා. මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට විසඳුමක් නැහැ. දරුවන් ඇතුළත් කිරීමේ ගැටළුව, ඒ වාගේම ගුරු මාරු කිරීමේ ප්‍රශ්න වැනි ප්‍රශ්නවලට දැඩි ලෙස මූලිකත්වය දක්වලා තිබෙනවා. අද පන්තිවලට ළමුන් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් උඩ ඉඳලා පල්ලෙහාට අඩු කළාය කියනවා. 45 ක් දක්වා තිටපු පන්තිවල ළමයින් සංඛ්‍යාව අද 35 දක්වා ක්‍රම ක්‍රමයෙන් අඩු කර ගෙන එනවා. නමුත් දරුවන්ට තනි බස් එකක යන්න ළඟම පාසල ලබා දෙන සංකල්පයක් මේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ - අපේ පළාත් සභාව තුළ විතරක් නොවෙයි. මධ්‍යම ආණ්ඩුවෙත් මේ සඳහා

ප්‍රතිපත්තියක් හැදිලා නැති වීම පිළිබඳව මම බොහොමත්ම කනගාටුවට පත් වෙනවා. ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා. මේ මිනිස්සුන්ගේ දුක් ගැහැට අහලා පළාත් සභාවේ යම් තීන්දුවක් ගන්න. ග්‍රාම සේවක සහතිකය ලබා දෙනවා නම් අවුරුදු පහකට, හයකට, දහයකට ඒ මිනිස්සුන්ට ළඟම පාසල ලබා දීමේ ක්‍රමවේදයක් මේ පළාත් සභාව තුළ, එහෙම නැත්නම් මධ්‍යම ආණ්ඩුව තුළ ලබා ගැනීම ඉතාමත්ම කාලෝචිතයි කියන එකයි මම පිළිගන්නේ. ඒ නිසා අද මේ තත්ත්වය පිළිබඳව - විවිධ ගැටළු අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තිබෙනවා. අද මම දැක්කා. මීට දින කිහිපයකට පෙර මාධ්‍ය තුළ, විශේෂයෙන්ම හිරු මාධ්‍ය තුළ උදේ ප්‍රකාශ කරනවා මම බලාගෙන හිටියා. අවුරුදු තුනකින් විද්‍යාපීඨවලට ගුරුවරු බඳවාගෙන නැහැයි කියලා. දරුවන් බඳවා ගෙන නැහැයි කියලා. මේ රටේ ක්‍රමවේදයක් තිබුණා. දැන් අපි ගුරු පත්වීම් දෙනවා. මාස තුනකට, හතරකට සැරයක් ගුරු පත්වීම් දෙසීයක්, තුන්සීයක් දෙනවා. ඒ දෙන ගුරු පත්වීම් සියල්ලක්ම සාමාන්‍ය පෙළ කළා. උසස් පෙළ කළා. උපාධිය කළා. ගුරු පුහුණුවක් නැහැ. උපාධි දරුවන්ට ගුරු පත්වීම් දී ගෙන යනවා. කමක් නැහැ. ඒක හොඳයි. ඒන දරුවන් වෙනුවෙන් කරන්න ඕනෑ. නමුත් මේ රටේ තිබුණා, විශ්ව විද්‍යාලවලට දරුවන් ඇතුළත් කළාට පස්සේ ඊළඟ ළකුණට හිමි භාවයක් තිබුණා. මේ රටේ ගුරු විද්‍යාලවලට ඇතුළත් වීමේ ක්‍රමවේදයක් තිබුණා. ඒ ගුරු විද්‍යාලවලින් බිහි වෙන්නේ ගුරුවරු. ඒ ගුරුවරු බිහි කිරීමේ ප්‍රවණතාවය වැඩි කරනවා තියා අවුරුදු තුනකින් මේ රජයට පුළුවන්කමක් ලැබුණේ නැහැ, මේ ගුරු විද්‍යාලයට දරුවන් ඇතුළත් කරන්න. ඉතින් මේවා පිළිබඳව දිගින් දිගට සාකච්ඡා කරන්න, කථා කරන්න තිබෙන ආයතන තමයි පාර්ලිමේන්තුව සහ පළාත් සභාව. ඒවායේ ප්‍රතිපත්ති හදන කොට මේවා පිළිබඳව සැලකිලිමත් වෙන්නය කියලා කියනවා. මගේ

හොරණ කොට්ඨාශය තුළ බාලිකා විද්‍යාලයේ විදුහල්පතිවරයෙක් නැතිව දැන් පාසල තිබෙනවා. මාස අටක් වෙලා තිබෙනවා. පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණය කළායින් පස්සේ, පරීක්ෂණය කරන කොට පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පතිනියක් ඉදිරිපත් වුණා. දැන් පළමුවැනි ශ්‍රේණියේ විදුහල්පතිවරු නැතිව තුන්වැනි ශ්‍රේණියේ, දෙවැනි ශ්‍රේණියේ විදුහල්පතිවරයෙක් දාන්න තිබුණා. මම බලාගෙන ඉන්නෙත් කවුද මේකට අත්සන් කරන නිලධාරියා කියලා. කවුරු හරි නිලධාරී මහත්තයෙක් අත්සන් කළොත් ඒ සම්බන්ධයෙන් උසාවි යන්නේ මේ සභාවේ මමයි කියන එකත් මම ප්‍රකාශ කරනවා. ඒ සම්බන්ධව. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. මම දිගින් දිගටම කථා කරන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මම ඉල්ලන්නේ, සියලුම මාධ්‍ය ආයතනවලටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත් හෙට උදේ දහයට දෙවැනි මහලට ඇවිල්ලා අපේ ඒ මිනිස්සුන්ගේ ඒ දුක් ගැනවිල්ල පිළිබඳව පොඩ්ඩක් අහලා, තමුන්නාන්සේලා මේ සභාවේ තීන්දුවක් අරගෙන තවමත් ළඟම පාසල නොවෙයි. කිසිම පාසලක් නැතිව ඉන්න දරුවෝ ඉන්නවා. ඒ දරුවන් සඳහා විසඳුමක් ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේක කණ්ඩායමේදී කථා කරන්න තිබුණා නේ?

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

සියලු දෙනාටම ඕනෑ ප්‍රශ්නයක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කණ්ඩායමේ කථා කළාම පත්තරේ යන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව ඊළඟට තිබෙන්නේ වරප්‍රසාද කඩ වීම්. මා වෙත ලැබී නැහැ.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙනවා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, මම සභාවට එන්න ප්‍රමාදයකුත් සිද්ධ වුණා. අද ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපස පිරිසක් විරෝධතාවයක යෙදෙනවා. උද්ඝෝෂණයක යෙදෙනවා. මම මේ අවස්ථාවට සම්බන්ධ වෙන්න එන කොට ඔවුන් මාව සම්බන්ධ කර ගනිමින් යම්කිසි විරෝධතාවයක් ඉදිරිපත් කළා. සභාවට ඉදිරිපත් කරන්න කියලා. ඒ නිසා තමයි මටත් ප්‍රමාද වුණේ, මේ සභාවට සම්බන්ධ වෙන්න. ගරු සභාපතිතුමනි, නැගෙනහිර හේවාගම්කෝරළයේ සමූපකාර සමිතියේ සිදු වුණු මූල්‍ය අක්‍රමිකතාවයක් නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

එහි තැන්පත්කරුවන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක එක ඒවා ඔබතුමන්ලා වරප්‍රසාදවලට ගේන්න එපා.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

නැහැ. එහි තැන්පත්කරුවන් පිරිසක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක් වුණා නම් කමක් නැහැ.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ගරු සභාපතිතුමනි, මට වුණු දේ දැන් මේ සභාවේ මම කියන්නේ නැතිව කොතැනද ප්‍රකාශ කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රමාද වුණු හේතුව කියන්න. ඒ ඇති ඉතින්.

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

ඒ නිසා ඒ තැන්පත්කරුවන් එතැන විරෝධතාවයක යෙදෙනවා. ඒ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත්, ගරු අමාත්‍යතුමාගේත් අවධානයට යොමු කරලා, ඒ කරුණ යම්කිසි සාකච්ඡාවකට ගෙන ඒ ප්‍රශ්නය විසඳන්න කියලා තමයි මම ඉදිරිපත් කරන්නේ. අවිස්සාවේල්ල ආසනය නියෝජනය කරන තවත් මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඉන්නවා. ඔවුනුත් මේ ප්‍රශ්නය දන්නවා. ඔවුන්ට තිබෙන අසහනය සහ පීඩනය නිසයි මෙතැනට ඇවිත් තිබෙන්නේ. අද මට මෙතැනට එන්න විනාඩි 15 ක් පරක්කු වුණේ මට ඔවුන් සමඟ සාකච්ඡාවට රැඳෙන්න සිද්ධ වුණු නිසා. ඒ පිළිබඳව කටයුතු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, නියෝජ්‍ය සභාපතිවරයා හැටියට බරපතළ චෝදනාවක් යසපාල කෝරළගේ මැතිතුමා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ස්වභාවය.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, ඒක විහිළුවට ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. විහිළුවක් නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ දෙන්නා යාළුවෝ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සභාවේ උප සභාපතිතුමා කථා කළේ. සභාවේ උප සභාපතිතුමා කියනවා, එයාගේ ගමේ ළමයින්ට පාසලක් නැහැයිලු. ළඟම අයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒක දැන් -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

බරපතළ ප්‍රශ්නයක්. පොඩි කෙනෙකු නොවෙයි කියන්නේ. උප සභාපතිතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක හැමදාම තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඇමතිතුමා උත්තරයක් දේවි ඒකට.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මෙයා ලකුණු දා ගන්න හදනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සැහැල්ලුවට ගන්න එපා. ඒ ගැන වහාම ක්‍රියා කරන්න. සභාවේ උප සභාපතිතුමා එහෙම කියන කොට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලන්නම් ඒ ප්‍රශ්නය. ඒක දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක්. ප්‍රශ්නයක් නැහැ එතැන. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, අපේ පැත්තට අත දිගු කරලා කියන්නේ. අපි ආණ්ඩු පක්ෂය වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපි බලන්නම්. ප්‍රශ්නයක් නැහැ ඒක. ඔබතුමාට ස්තූතියි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ශිරන්ත මන්ත්‍රීතුමා, අපි ඒක බලාගන්නම්.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපේ පැත්තට ඇඟිල්ල දික් කරලා කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අපි බලාගන්නම් ඒක.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

වාඩි වෙන්නකෝ. අපි බලා ගන්නම් ඒක. අම්මේ තිබෙන -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒක අපට බලාගන්න පුළුවන්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

තව මාස දෙකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒක කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක්. ඔබතුමන්ලා අපි ගම්පහ දිස්ත්‍රික්කය ගැන කථා කරමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

රෝස්ගෙයි ඔයාගෙයි ගෝරි තිබෙන්නේ. ඒ වාගේ තමයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේක කළුතර දිස්ත්‍රික්කයේ -

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

එතුමා හැමෝටම ආරාධනා කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ප්‍රකාශ කළේ, කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ආරාධනා කළා දෙවැනි තට්ටුවට ඔක්කෝටම.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස්නාහිර පළාතේම දෙමව්පියෝ එනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, එහෙම කියන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හෙට උදේට ගියාම ඉවර නේ? ඔබතුමා හෙට උදේට ගිහින් බලන්න ප්‍රශ්නය.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතැන 2000 ක් විතර ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2000 ක් නම් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බදාදා දවස්වලට 2000 ක් විතර එනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

එක එක අයට එක එක විධියට. එතුමාට හරියට කථා කරන්න දෙන්නෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයට යමු.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අටසියය, 2000 වුණා. ශිරන්තට ගියොත් පන්දාහ වෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. පසුගිය දිනක අපි සභා කටයුතු කාරක සභාවට එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයෙකු වශයෙන් සම්බන්ධ වුණා. අපි මේ පළාත් සභාවට හෝටල් පාසලක් ගන්න යනවා. අපේ කණ්ඩායම් රැස්වීමේදී ගරු විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම මගෙන් ඇහුවා, මොකක්ද ඒකේ ප්‍රගතිය කියලා. අපි කණ්ඩායමක් වශයෙන් කවුරුත් විරුද්ධ නැහැ. බස්නාහිර පළාත් සභාවට හෝටල් පාසලක් අවශ්‍යයි. ඒක හොඳ අදහසක්. හොඳ වැඩ සටහනක්. කණ්ඩායමේ බහුතරයේ සෑම දෙනාගේම ඉල්ලීම වුණේ ඒ ගන්නා ක්‍රමවේදය සභාවට දන්වන්න. ගරු මහ ඇමතිතුමා මෙතැන ඉන්නවා. මම ගරු ඔබතුමා මාර්ගයෙන් කියන්න කැමැතියි. මේ ගැන අපේ විරුද්ධතාවයක් නොවෙයි. ඒක කරන ක්‍රමවේදය ගරු මහ ඇමතිතුමනි, මේ සභාවට දන්වන්නය කියලා එක්සත් ජාතික පක්ෂය කණ්ඩායමක් වශයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. හෝටල් පාසලක්. එතුමා දන්නේ නැහැලු එහෙම සිද්ධියක්. මහ ඇමතිතුමා දන්නේ නැහැ ලු.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

පුදුමයි නේ? දැන් අපේ ගාමිණී තිලකසිරි ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු එකෙන් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හෝටලයක් ගන්න මේගොල්ලන්ට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හෝටලක් ගන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේකේ මන්ත්‍රීවරු අපි -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

විෂය භාර අමාත්‍යතුමා ඉතින් මහ ඇමතිතුමා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ, හෝටල් පාසලක් නොවෙයි. කාමර සහිත හෝටලයක් ගන්න තමයි මම හිතන්නේ සාකච්ඡා කළේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ, නැහැ. ඒකේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හෝටල් පාසලකුත් අරින්න යෝජනාවකුත් තිබෙනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, බංකොලොත් වුණු හෝටලයක්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඒ කණ්ඩායමේ නියෝජිතයා වශයෙන් මාව දැනුවත් කළේ හෝටල් පාසලක් සඳහා මේ හෝටලය ගන්නවා කියලයි. ඔබතුමා Budget එකේදීත් කිව්වා නේ? අයවැයේදී ප්‍රකාශ කළා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා. ඒ ගැන සොයා බලලා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සභාවට -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ගිය සතියේ අපි රට ඉන්න වෙලාවේ ඒ කමිටුව ගිහිල්ලා බලලා තිබෙනවා. තවම අපට වාර්තාව ලැබිලා නැහැ. තවම ඒක කැබිනට් එක ඇවිල්ලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවම ඒක ලැබිලා නැහැ. එතුමා පැහැදිලි වාර්තාවක් දෙයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මම කිව්වේ අපේ පක්ෂයේ මතය.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කාටවත් විශේෂයෙන් දැන ගන්න දෙයක් නැහැ. ගන්නවා නම් නීත්‍යානුකූලව නේ ගන්නේ. නිකන් ගන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා, මහ ඇමැතිතුමා පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමා සභාවට පැහැදිලි ප්‍රකාශයක් කරනවා කියලා. ගන්න ක්‍රමවේදය ඒවා ඔක්කෝම එතුමා සභාවට කියයි. බොහොම ස්තුතියි. මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දැන් මට පිළිතුරු දෙන්න වෙන්නේ එතුමාගේ ප්‍රකාශයට තමයි. අමාත්‍යාංශ නිවේදන යටතේ පිළිතුරු දෙන්න වෙන්නේ. ඒ නිසා ඔබතුමා ඉන්න. මගේ ඉල්ලීමක්. බොහොම ස්තුතියි ඔබතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිතුමා කියපු දේ හරි. සාධාරණ දෙයක් එතුමා කිව්වේ. දැන් න්‍යාය පත්‍රයේ අවස්ථාව තිබෙන්නේ, අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීම. එතුමා ලැහැස්ති වෙන්නේ මෙතුමාට උත්තරයක් දෙන්න නේ? ඔබතුමා කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි,

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අනේ මම කලින් වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා කියලා කිව්වා. එතකොට තමුන්නාන්සේ ඇහුම්කන් දුන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැක්කේ නැහැ. ඔබතුමා කථා කරන්න. ඔබතුමා ඉන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා කථා කරන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, දැන් ඊයේ හවස මට දුරකථනයෙන් කථා කරලා - මගේ ළඟ Number එක තියෙනවා. ආණ්ඩුකාර කාර්යාලයෙන් කථා කරනවා කියලා කිව්වා. පස්සේ මම නම ඇහුවාම නම කිව්වේ නැහැ. මගෙන් ඇහුවා, තමුන්නාන්සේලා ආණ්ඩුකාරතුමාට විශ්වාසභංග යෝජනාවක් ගේනවාද කියලා. මම ඒ පාර කිව්වා මම එහෙම කියන්න තමුන්නාන්සේ කවුද කියලා දන්නේ නැහැ නේ කියලා. ඒ පාර යම් නමක් කිව්වා. කියපුවාම, මම කිව්වා හරි. ගිය සභාව වෙලාවේ නම් මෙහෙම පොඩි කථාවක් ආවා. නමුත් අපි එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම එහෙම තීන්දුවක් අර ගත්තේ නැහැ ආණ්ඩුකාරතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගේන්න. එක එක එක්කෙනා එක එක තැන්වල කථා වුණා මිසක් ඒ ගැන වැඩි විස්තරයක් මම දන්නේ නැහැයි කියලා මම කිව්වා. පසුව මම ඇහුවා ඇයි එහෙම අහන්නේ කියලා. මම මේ නමත් එක්කම කියන්නේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළාලු. මම දන්නේ නැහැ කොහේදිද කියලා. ආණ්ඩු පක්ෂ රැස්වීමේදීද කොහේද දන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයෙන් ආණ්ඩුකාරතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගේනවා. ඒ නිසා මේක වළක්වා ගන්න කියලා එතුමා දැනුවත් කළාලු. එතුමා තමයි ගිය සභාවේදී මාව දැනුවත් කළේ, උඹලා ආණ්ඩුකාරතුමාට විශ්වාසභංග යෝජනාවක් ගෙනෙල්ලා කියලා. මට විතරක් නොවෙයි. උදාර රත්නායක ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහේෂ් එහෙම තමයි සාමාන්‍යයෙන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

උදාර රත්නායක මන්ත්‍රීතුමා ඉන්නවා නම් එතුමා සාක්ෂි දෙයි. එතුමාව පෙළඹෙව්වෙත් මෙතුමාම තමයි. තව කිහිප දෙනෙකුට කිව්වා. මම මේ කථාව විපක්ෂ නායකතුමාට කියන කොට විපක්ෂ නායකතුමා කිව්වා, මටත් කිව්වේ මහේෂ් තමයි කියලා. විපක්ෂ නායකතුමා ඉන්නවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේ ප්‍රශ්නය විපක්ෂ නායකතුමා තවම දන්නෙත් නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතකොට අපට හරි අසාධාරණයක් කරන්න. අපි ලව්වා, බළල්ලු ලව්වා කොස් ඇට බාවන්න ඕනෑ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොමිනිස්ට්කාරයින්ට අහු වෙන්න එපා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

විශ්වාසභංග යෝජනා ගේන්න අපට ඕනැ තරම් - අපි කැමැතියි අසාද් සාලි වාගේ ආණ්ඩුකාරවරයෙක් මේ පළාත් සභාවේ ඉන්න එක ගැන. හැබැයි මහේෂ් අල්මේදා වාගේ කුහක මන්ත්‍රීවරයෙක්, බළල්ලු ලව්වා කොස් ඇට බාවන්න හදන මන්ත්‍රීවරයෙක් මේ සභාවේ ඉන්න එක ගැන මම කනගාටු වෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේ දේම තමයි Budget එකේ වුණෙත්. කණ්ඩායමක් ඇවිල්ලා අපේ පැත්තේ මිනිස්සුන්ට කිව්වා විපක්ෂව ඡන්දය දෙමු කියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මේ දිය රෙද්දෙන් බෙල්ල කපනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔයගොල්ලෝ Account එක ලැහැස්ති කර ගන්න කියලා. අපි අමාරුවේ වැටුණා. ඒකයි වුණේ. Budget එකේ කළෙත් ඕකමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමා සොයිසාට කරන්නෙත් ඕකමයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් දෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, Budget එකේ කළෙත් ඕකම තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමාගේ නම කියැවුණා නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මගේ නම කියැ වුණා. ඒ නිසා මම කථා කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, විවාදයක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න. එතුමා බරපතළ චෝදනාවක් ඔබතුමාට කළේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බරපතළ චෝදනාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බරපතළ චෝදනාවක්. ඔබතුමා කුහක විධියට කුමන්ත්‍රණය කරයි කියන එක.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මීට දවස් තුනකට කලින් පෙරෙයිදා ලංකාදීප පුවත්පතේ ලොකු අකුරෙන් දාලා තිබුණා, විපක්ෂ නායකතුමා පත්තරේට කියලා. ඉතාම පැහැදිලිව දාලා තිබුණා. අපි නඩු හතක් තිබෙන, චෝදනා රැසක් තිබෙන ආණ්ඩුකාරවරයාට විරුද්ධව විශ්වාසභංගයක් ගෙන එනවා කියලා. ඒ පත්තරේම අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාගෙනුත් අහලා තිබුණා මොකක්ද ඔබතුමන්ලා ඒ ගැන කියන්නේ කියලා. විපක්ෂ නායකතුමා මෙහෙම කියලා තිබෙනවා කියලා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කියලා තිබුණා කියලා. ලංකාදීප පත්තරේ ලියලා තිබුණා, සමහර අය සහයෝගය දෙනවා ඇති. අපි එවැනි තීන්දුවක් අරගෙන නැහැයි කියලා. ඉතින් සිරිකමල් මන්ත්‍රීතුමා කියනවා නම් මම එහෙම කිව්වා කියලා. මම කියන්නේ මම එහෙම කිව්වා කියලා ඔප්පු කරන්න කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලැජ්ජ නැති කථා කියන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එක්කෝ වෙන මොකක් හරි කරලා ඔප්පු කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලංකාදීපේ තිබුණා නම්, දැන් දවස් තුන හතරකට ඉස්සෙල්ලා තිබුණේ. මෙතුමා අපට කිව්වේ ගිය සභා රැස්වීම වෙලාවේදී.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කරුණාකරලා මන්ත්‍රීතුමා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම මොනවටද මූණ බලාගෙන බොරු කියන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා පොඩ්ඩක් ශිෂ්ට සම්පන්න වෙන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

විපක්ෂ නායකතුමාට කිව්වා. මම ඉස්සරහා පිට උදාර රත්නායක මන්ත්‍රීතුමාට කිව්වා, උදාර රත්නායක ඔයා යෝජනාව ගේන්න. අපි සහයෝගය දෙනවා කියලා. අපිට එකක් කියලා, group එකේ ගිහිල්ලා තව එකක් කියලා. ලැජ්ජ නැති වැඩ කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මන්ත්‍රීතුමා දැන් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේ මේ පළාත් සභාවේ අවුරුදු 20 ක් හිටපු, ඇමැති ධූරයක් දරපු මන්ත්‍රීවරයෙක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලැජ්ජ නැත්තේ කාටද කියලා මිනිස්සු දන්නවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒ වාගේ බලු වැඩ කරන්න එපා. සුද්ද සිංහලෙන්ම.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභාවේ දන්නවා කාටද ලැජ්ජ නැත්තේ කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහේෂ් සොයිසාට කරන්නෙත් ඔය ටික තමයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඇයි මෙච්චර කේන්ති ගිහිල්ලා තියෙන්නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේ මේ ජාතියේ නපුංසකයෙක් කියලා දැනගෙන හිටියේ නැති නිසයි කේන්ති ගිහිල්ලා තියෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔයා මොන නපුංසකයාද කියලා මම දන්නවා. මම -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒකයි මම කියන්නේ. තමුන්නාන්සේ කරපු නපුංසක වැඩේ නිසා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම කථා කරන්නේ මූලාසනයට. කරුණාකරලා මට කථා කරන්න -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, ඒ නපුංසක කියන වචනය ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අසාද් සාලි ආණ්ඩුකාරයාට විරුද්ධව විශ්වාසභංග එකක් නොවෙයි, දහයක් ගේන්න කාරණා තිබෙනවා. අපට මොකද? ජනාධිපතිතුමාට -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම හොඳාකාරවම දන්නවා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා නපුංසකයෙක් නොවෙයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කරුණාකරලා කථා කරන්න දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නපුංසකයෙක් නොවෙයි කියලා මම හොඳාකාරවම දන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සිරිකමල් පිලීෂියන් ද සිල්වා මැතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මම දන්නේ නැහැ,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මයික් on කරන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඕකමයි Budget එකට කළෙත්. මට ඒකමයි කේන්තිය.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, දැන් මම කථා කරන වෙලාව. එතුමාට කථා කරන්න අවස්ථාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න. නැත්නම් අසාධාරණයක් වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සිරිකමල් පිලීෂියන් සිල්වා මන්ත්‍රීතුමා, උදාර රත්නායක මන්ත්‍රීතුමාත් එක්ක ඇවිල්ලා මට කිව්වා මචං විශ්වාසභංගයක් ලැහැස්ති කරනවා සහයෝගය දෙන්න කියලා. මම කිව්වා සහයෝගය දෙන්න බැහැයි කියලා. ඒක තමයි මේ තරහා තියෙන්නේ. ඒ නිසා නපුංසකයෝ කවුද කියලා අපි දන්නවා. විශ්වාසභංග ගේන්න අපි එකඟ නැහැයි කියලා කිව්වා. ඒක තමයි මේ ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පිළිගත්තා නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක තමයි මේ චෝදනාව කරන්නේ. ඒ නිසා නපුංසකයා කවුද කියලා ගිය සභාවේදී කැන්ටිමේදී හැමෝම දැක්කා. කවුද මේ යෝජනාව කළේ කියලා. සිරිකමල් පිලීෂියන් තමයි යෝජනාව ගෙනාවේ. මට කිව්වා, අත්සන් කරන්න කියලා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ. නැහැ. අපි ඔය යෝජනා ගෙනාවේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම බැහැයි කිව්වා. බැහැයි කියපු නිසා තමයි මේ ප්‍රකාශය කළේ. ඒනිසා එක්සත් ජාතික පක්ෂය -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි අදටත් විරුද්ධ නැහැ, අසාද් සාලිට.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක එහෙමනම් එදා කියන්න තිබුණා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පත්තරේට කියලා තිබුණා, මේ වෙලාවේ මගේ ළඟ පත්තරේ කොළේ නැහැ. පෙරෙයිදා ලංකාදීප පුවත්පතේ, ඉතාම පැහැදිලිව පුවත්පත් වාර්තාවක් තිබුණා. විපක්ෂ නායකතුමා පත්තරේට කියපු එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, ගරු මන්ත්‍රීතුමා. පැහැදිලියි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම ගත්තු තීන්දුව අපේ පැත්තට දාන්න ලැහැස්ති වෙන්න එපා. අපි එහෙම කිව්වේ නැහැ. අපි කිව්වා නම් අපි පස්සට යන්නෙත් නැහැ. ඇඹරෙන්නෙත් නැහැ. මේකේ අපි මහ ඇමතිවරු පන්නලා තිබෙනවා. මහ ඇමතිවරු ගෙනැල්ලා තිබෙනවා. විශ්වාසභංග ගෙනැල්ලා තිබෙනවා. අපි ඒවා එළිපිට කළේ. මේ සිරිකමල්ලා වාගේ හොරෙන් අපි ඒවා කරන්නේ නැහැ. අපි හොරෙන් කරන්නේ නැහැ. අපට කොන්දක් තිබෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි ප්‍රසිද්ධියේ කියනවා. අපි අසාද් සාලිට අකැමැති නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා කාට හරි විශ්වාසභංගයක් ගේන්න ඕනෑ නම් අපි තැන තැන ගිහිල්ලා කොළ කෑලි අත්සන් කරන්නේ නැහැ. සිරිකමල් තමයි මට කිව්වේ, කැන්ටිමේදී අත්සන් කරපන් කියලා. මම බැහැයි කිව්වා. ඒක නිසා තමයි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අතේද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කොළ කෑලි ගෙනැල්ලා අත්සන් කරන්න -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අතේද අත්සන් කරන්න කිව්වේ. බොරු කියන්න එපා මනුස්සයෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අර නපුංසක වැඩ කරන්න එපා කියලා මම සිරිකමල්ට කියනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කේන්ති ගියේ නපුංසක කිව්ව එකට.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කෙලින් ගේන්න. කෙළින් කථා කරන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔන්න එනවා විපක්ෂ නායකතුමා. මෙන්න එනවා විපක්ෂ නායකතුමා අහන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සිරිකමල් තමයි කොළේ ගෙනාවේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම කොළයක් ගෙනාවේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මට කිව්වා අත්සන් කරපන් කියලා. මම බැහැයි කිව්වා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම නැවත වතාවක් කියනවා. ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා නපුංසකයෙක් කියලා මම ආයේ සැරයක් කියනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

නපුංසක වැඩ කරන්න එපා. කෙළින් ගේන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ආයේ මොනවා කියන්නද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කෙළින් ගේන්න. අපි ලැහැස්තියි ඒකට සහයෝගය දෙන්න. කෙළින් ගෙනැල්ලා කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හොරෙන් කථා කරන්න එපා. නපුංසකයා කවුද කියලා අපට පැහැදිලියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවසන් කරන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමා, න්‍යාය පත්‍රයට යන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පොඩ්ඩක් අවස්ථාව දෙන්න. විපක්ෂ නායකතුමාට අවස්ථාව දෙන්න. විපක්ෂ නායකතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

එතුමා ආව ගමන් මොකක්ද කියලා දන්නේ නැහැ නේ? පොඩ්ඩක් ඉඳගන්න අවස්ථාව දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මගේ නම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පාවිච්චි කළා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ නම කිව්වා නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක සම්පූර්ණයෙන් වැරැදියි. මම කවදාවක්වත් ඔබතුමාට කියලා නැහැ විශ්වාසභංග යෝජනා ගේන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම කිව්වේ විපක්ෂ නායකතුමා, පෙරෙයිදා පත්තරේ තිබුණු එක. ඔබතුමාගේ පත්තරේ නමින් තිබුණු එක. ඒක තමයි මම කිව්වේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

තමුන්නාන්සේ තමයි මට කිව්වේ, විශ්වාසභංග යෝජනාවක් ගේන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමාගේ නමින් තමයි පත්තරේ තිබුණේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් හරිද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම පත්තරවලට කියලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, තව පැය භාගයකින් මම සභාගත කරනවා මෙතුමාගේ නමින් ලංකාදීප පත්තරේ තිබුණු එක.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කවදාවක්වත් පත්තරවලට කියලා නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් හරිද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පත්තරේ දාලා තිබුණු එක.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කවදාවක්වත් පත්තරවලට කියලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම තව පැය භාගයකින් සභාගත කරනවා. මෙතුමාගේ නමින් ලංකාදීප පත්තරේ තිබුණේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම ලංකාදීප පත්තරෙන් ඇහුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද කිව්වේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම දන්නේ නැහැ, කවුද කිව්වේ කියලා. ඔබතුමාගේ නමින් පත්තරේ තිබුණේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, වචනයක් කථා කරන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි විශ්වාසභංග ගේන්නේ නැහැ, පරාද වෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

එක්සත් ජාතික පක්ෂය නොමඟ යනවා මේ වැඩෙන්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි ගේන්නේ දිනන්න විශ්වාසභංග.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේ දේ මේ විධියට තමයි යෝජනාව ගෙනාවේ. හරිද? ගෙනැල්ලා කිව්වා අපි විශ්වාසභංගයක් ගේනවා. උඹලා එකතු වෙයල්ලා. එකතු වෙලා වැඩේ කරමුයි කියලා. Budget එකටත් ඔය දේමයි සමහර මන්ත්‍රීවරු කණ්ඩායමක් එකතු වෙලා කන තැනට ඇවිල්ලා -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඇයි ඔයගොල්ලෝ ඔච්චර බොළඳද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

Budget එක පරදමු. අපේ Heads ගණන දෙනවා කියලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔයගොල්ලෝ ඔච්චර බොළඳද? චූටි බබා. එන්න සුප්පුවක් දෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි මේ ගමන ලණු කයි කියලා හිතුවාද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

සල්ලි නැහැ නේ. දූකට කියවනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු. ගරු අධ්‍යාපන අමාත්‍යතුමා. අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවස්ථාව. ඔබතුමා ප්‍රකාශයක් කරනවා නේ.

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මහ මුරුගසං වර්ෂාවක් වැස්සාම පොද වැස්සෙන් වැඩක් නැහැ. මට පරණ කතාවක් මතක් වෙනවා. හැමදාම හවසට තමන්ගේ ඇඹේණියට තඩිබාපු ගමරාළ කෙනෙක් සිටියා. ගමරාළ මළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නම මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නම යසපාල.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගමරාළ නැතිව යසපාලම කිව්වා නම් හරි නේ. ගමරාළ කියන්න ඕනෑ නැහැ නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

එක සැරේම මේක - මේක නාට්‍යානුසාරයෙන් නේ. එක සැරේ කියන්නේ නැහැ. අපේ මහේෂ් මහත්මයා වාගේ තමයි. ඒ නිසාවෙන් මේ ගමරාළ මළාම ගම හාමිනේ හැමදාම රෑ අටට විතර බෙරිහන් දෙනවා, මෙන්න මට ගහන වෝ. මෙන්න මාව මරණ වෝ. මාව බේරගන්න කවුරුත් නැද්දෝ කියලා අහනවා. එතකොට වටේ මිනිස්සු බලනවාලු යකෝ මේ ගෑනිගේ මිනිහත් මළා. ගමරාළ. දැන් කවුද ගහන්නේ මේ ගෑණිට. සොයලා, සොයලා බැලුවාම මුදුන් යට ලීයේ ගෙදර තිබෙන ලී වංගෙඩිය එල්ලලා, ලී වංගෙඩිය පද්දලා පිට අල්ලලා කියනවා, මට ගහනවෝ. මාව මරණවෝ. මාව බේරගන්න කවුරුත් නැද්දෝ කියලා. යසපාල කෝරළගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. දැන් ඔබතුමා උත්තරය දෙන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න. එවැනි ලතෝනියක් තමයි දෙන්නේ. මේ රටේ චක්‍රලේඛ තිබෙනවා. දරුවන් ඇතුළත් කිරීමේ නීතිරීති පද්ධතියක් තිබෙනවා. සම්මුඛ පරීක්ෂණ කණ්ඩායම් තිබෙනවා. ඒ සඳහා වගකිවයුතු නිලධාරීන්, අමාත්‍යාංශ ලේකම්, පළාත් අධ්‍යක්ෂක දක්වා ඉන්නවා. ඒ නිසා එවැනි ක්‍රමවේදවලින් මීසක ළමයින් ඇතුළත් කරන්න පුළුවන්කමක් නැහැ. පවත්නා චක්‍රලේඛවල අඩුපාඩු තිබෙන බව මේ ඇමැතිවරයා සහ මේ මහ ඇමැතිවරයා පවා පිළිගන්නා කාරණාවක්. ගරු මහ ඇමැතිතුමා මේක පිළිගන්නා කෙනෙක් හැටියට ඔබතුමා දන්නවා. සභාපතිතුමාත් සිටියා. මේ සියලුදෙනා කැඳවලා මේ ප්‍රශ්නවලට විසඳුම් සොයා යන හුහාක් නිවැරැදි වැඩ පිළිවෙළකට අපි ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා තැන් තැන්වල ලතෝනි දීලා, හෙට අමාත්‍යාංශයට එන්න. අමාත්‍යාංශය වටලන්න. මිනිස්සු එන්න. මේ ගොන් පාට් යසපාල කෝරළගේ වාගේ ගොනෙකුට හොඳයි. මම වාගේ මිනිහෙකුට හොඳ නැහැයි කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා. ඔච්චරයි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒ වචනය ඉල්ලා අස් කරගන්න කියන්න. ගොනා කිව්වා.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමා, මගේ නම කිව්වා. මට අවශ්‍යයි කථා කරන්න.මේ වාගේ ගොන් ඇමැතිවරයෙක් හින්දා තමයි මේ පළාත් සභාවේ අධ්‍යාපනය විනාශ වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අධ්‍යාපන ඇමැතිවරයා, ඔබතුමා නියෝජ්‍ය සභාපතිවරයා. මොකක්ද මේ කරන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගොනෙක් කියන්නේ බූරුවෙක් නේ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මේ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නාම වාඩි වෙන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් වාඩි වෙන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

නැහැ, නැහැ. ගරු සභාපතිතුමනි, මගේ නම කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාටද මේ කථා කරන්නේ?

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මගේ නම කිව්වා. එහෙම බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

යසපාල මහත්මයා කොහොමද ගමට යන්නේ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මගෙ නම කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ගොන් පාට් කිව්වා. ඔබතුමා ගොන් ඇමතිවරයා කිව්වා. ඒක දැන් ඉවරයි.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මේ පළාත් සභාවේ අපි මහ ඇමතිවරු ගණනාවක් යටතේ සිටියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕක නවත්වන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

අධ්‍යාපන ඇමැතිවරු යටතේ සිටියා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ වාගේ අය අධ්‍යාපනයට කථා කරන එක වැරැදියි.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

හරි. හරි. ඔබතුමා වාඩි වෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ගුරුවරයෙක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෝරළගේ මහත්මයා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

කැන්ටීමේ තේ හදපු එක්කෙනා තමයි ගුරුවරයා වුණේ. මතක තියා ගන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

හරි. පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පිරිවෙන් ගුරුවරු පස් දෙනා මම කියන්නම්. මගෙන් බැරි නම් කිත්සිරි කහටපිටියගෙන් අහන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මම කථා කරන්න එන්නම්. මම කැමැතියි විවාදයකට යන්න. මෙතුමාත් එක්ක ෆයිල් එක අරගෙන මම විවාදයක් යන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නියෝජ්‍ය සභාපතිතුමා, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕක නවත්වන්න.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මේ වාගේ ගොන් ඇමැතිවරයෙක් නිසා තමයි මේ පළාතේ දරුවන්ට පාසලක් අහිමි වෙලා තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මධ්‍යම රජයේ ඇමැතිතුමා ෆයිල් එක ගන්න ඕනෑ. අලුත් චක්‍රලේඛයේ අඩුපාඩු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නාම වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇමැතිතුමා විශ්ව විද්‍යාලයේ කැන්ටීමේ ඉඳලා තිබෙන්නේ.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කළුතර පැත්තේ එහෙම තමයි. අර තෙවරප්පෙරුම ඇමතිතුමාත් එහෙමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒවා විසඳන්න මේ ගොන් පාට් දාලා බැහැ. ඔළුවෙන් විසඳන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. ඇමැතිතුමා. අපි න්‍යාය පත්‍රයට යමු කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඒක ඉවරයි. ඔබතුමා එයාට ගොන්පාට් කිව්වා. එතුමා ඔබතුමාට ගොන් ඇමැතිවරයා කිව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගොනා කියන්නේ මී හරක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

බලාගෙන අං දෙක ඇනෙයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කෝ උදාර රත්නායක ගරු මන්ත්‍රීතුමා. උදාර රත්නායක ගරු මන්ත්‍රීතුමා කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අද උදේ මේ කණ්ඩායමේ ප්‍රශ්නයක් මතු වුණා. යූ.අන්.පී. කණ්ඩායමේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපට අදාළ නැහැ නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

උදාර රත්නායක තමයි විශ්වාසභංගය ගේන්න හැදුවේ සිරිකමල් එක්ක. අන්තිමට පක්ෂ නායක රැස්වීමේ ගෝරියක් ගියා. උදාර ගහගෙන ගියා. උදාර ඇහුවා කෝ විශ්වාසභංගය කියලා. අද අපේ පැත්තට චෝදනාව දාන්න හදන්නේ. මේ කණ්ඩායම් රැස්වීමේ ගෝරියක් ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න කෝ. ඒක අපට අදාළ නැහැ. උදාර රත්නායක නැද්ද? සිරිකමල් නැද්ද? ඒක අපි ගණන් ගන්න ඕනෑ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

කිත්සිරි මංචනායක කථා කරනවා කෝ. ඉන්නේ ගොළුබෙල්ලෙක් වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඒ අය බලාගනියි. ඔබතුමාගේ වරප්‍රසාදය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ අලුත් ගොඩනැගිල්ලට ඇවිල්ලා මේ සභාවට පැමිණි දවසේ සිට මගේ car parking වෙන් කරලා දුන්න තැන මොකක්ද වාහනයක් ගහලා තිබෙනවා. තවම ඒක අයින් කරලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක බලන්න. අනිවාර්යයෙන් මම අවස්ථාව දෙන්නම්. ඔබතුමා අංකය කියන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

B 44.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මටත් ඒ ප්‍රශ්නය තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වහාම මම ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙනවා. ඔබතුමන්ලාට අවස්ථාව දෙන්නම්.

**ගරු ගාමිණී තිලකසිරි (**කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා**)**
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිතුමා සමාවෙන්න. මට පොඩ්ඩක් අවසර දෙන්න. මම උදේ පාන්දර මූලාසනයට ආවේ. මම මූලාසනයෙන් බහින්න ගිහිල්ලා ආයිත් නැග්ගා. අර ප්‍රශ්නය නිසා. ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට මම ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමාට අවස්ථාව.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ශ්‍රී ලංකාව පුරා පැතිරී යන බඩ ඉරිඟු වගාවට පමණක් නොවෙයි. එළවළු වගාවට ද අහිතකර තත්ත්වයක් තිබෙන සේනා දළඹුවා පාලනයට විශේෂිත ක්‍රියාන්විතය පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා හදිසියේම අපි රැස්වීමක් යොදා ගත්තා. 2019.01.24 දින සවස 02.00 ට බත්තරමුල්ල, නව පළාත් සභා ගොඩනැගිල්ලේ හයවැනි මහළෙහි පිහිටි රැස්වීම් ශාලාවේ. ඒ නිසා මේ පිළිබඳව දැනුවත්වීමට, දැනුවත් කිරීමට බස්නාහිර පළාත් සභාවේ සියලුම මැති ඇමැතිවරුන්ට මම ආරාධනා කරනවා. දීර්ඝ වශයෙන් විස්තර කියන්න යන්නේ නැහැ. සවස 02.00 ට මගේ අමාත්‍යාංශයට පැමිණෙන්න කියලා ඉතාම කාරුණික ආරාධනාවක් කරනවා. සියලුම දෙනාගේ පැමිණීම බලාපොරොත්තු වෙනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

වල්පිට ෆාම් එකෙත් ඒ දළඹුවා ඉන්නවාද?

# පළාත් සභාවේ රැස්වීම
## PROVINCIAL COUNCIL MEETING

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "කාර්ය පටිපාටි රීති මාලාවේ අංක 14(2)(අ) හි කෙසේ සඳහන් වුවද, 2019.02.18 සඳුදා දිනය සභා රැස්වීම පැවැත්වෙන දිනයක් ලෙස මෙම පළාත් සභාව තීරණය කරයි."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු හෙක්ටර් බෙත්මගේ-** සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2018.10.23, 2018.12.19 හා 2019.01.09 යන දින වල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්හිදී ලද එකඟතාවයට අනුව, කාර්ය පටිපාටි රීති අංක 39(4) හා 53(3) හි විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොරව, අද දිනට (2019.01.22) නියමිත න්‍යාය පත්‍රයේ අංක XII පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂය යටතේ ඇතුළත් කාර්යයන්හි අනුපිළිවෙළ, පිළිවෙළින් කාර්ය අංක 02 හා 01 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ එකඟතාවය. එකඟයි නේද? සභාවේ එකඟතාවය නිසා, සභාවේ එකඟතාවය ලද එම යෝජනාව අනුව අද දින න්‍යාය පත්‍රයේ ඇතුළත් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතුවල අනුපිළිවෙළ වෙනස් වෙන බව කාරුණිකව දන්නවා සිටිනවා.

[ගරු නියෝජ්‍ය සභාපතිතුමා]

එසේ කටයුතු තිබියදී අද රීති අත්හිටුවීමේ යෝජනාවකුත් මේ සම්බන්ධව ඉදිරිපත් වෙලා තිබෙනවා. මම හිතනවා, වාර දෙකක් මා ඉදිරිපත් කරපු යෝජනවා cancel කරන්න සිදු වුණා. ඒ නිසා මම මූලාසනයේ ඉඳගෙන හරි ඉල්ලීමක් කරනවා. ඒ යෝජනාව පාසල්වලට සම්බන්ධ යෝජනාවක් නිසා ඒ සඳහා අවස්ථාව ලබා දෙන්නය කියලා. සභාවේ ඒ සඳහා එකඟතාවය විමසනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම දාපු යෝජනාවේ තිබෙන්නේ දුෂ්කර පාසල්වල, දුෂ්කර ගමන් මාර්ගවල ඉන්න දරුවන්ට පා පැදි ලබා දෙන්න කියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මම සභා නායකවරයා හැටියට කියන්න යන්නේ, මට ඇහුම්කන් දෙනවා නම් -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඡන්දයක් විමසලා තීන්දුවක් ගන්න පුළුවන්. ගන්නවාද? නැද්ද? කියන එක.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඡන්දයකට යනවා නොවෙයි. කරුණු පැහැදිලි කිරීමක්. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා විශ්වාස කරනවා ඒක කාලෝචිත යෝජනාවක් කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හොඳ යෝජනාවක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒක හොඳයි. නමුත් මම විශ්වාස කරනවා, මම මේ අදහස් දැක්වීමක් විතරයි කරන්නේ. ඔබතුමාට අභියෝගයක් කරන්න නොවෙයි. මෙතුමාගේ යෝජනාව දීර්ඝ කාලීනව යනවා වාගේම එතුමාගේ යෝජනාව දරුවන්ට පා පැදි ලබා දීම වැදගත් කියලා මම හිතනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පසෙක දානවා නොවෙයි. මේකට හැබැයි තව කල් තිබෙනවා. මේකේ තිබෙන්නේ, මමත් මෙතැනට එකඟයි. මොකද සියලුම දේවල් මිත්‍යාවෙන් පිරිලා තිබෙනවා. මාධ්‍ය ඒකට සහයෝගය දෙනවා. ඒක කරන්න එපැයි කියන කාරණාව. හැබැයි මම හිතනවා. අරකට මම මූලිකත්වය දීලා, දෙවනුව අතනට යමු කියලා මම කාරුණිකව ඉල්ලනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති අනුව කටයුතු කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මොකද, කාලීන වශයෙන් ඉතාම වැදගත් කාරණයක්. මොකද ප්‍රශ්න නිරන්තරයෙන්ම මේ රටේ ඉදිරියට එනවා. සේනා දළඹුවා පිළිබඳ ප්‍රශ්නයත් අපේ කෘෂිකර්ම ඇමැතිතුමා ඉදිරිපත් කළා. පසුගිය සතියේ ඉතාම බරපතළ විධියට සාකච්ඡාවට ලක් වුණු මාතෘකාවක්. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, රීති අනුව කටයුතු කරන්නය කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් මම ඉල්ලා සිටිනවා ඡන්දයකට ගිහිල්ලා ඡන්දය අනුව වැඩ කටයුතු කරන්නය කියලා. ඡන්දයක් සඳහා සීනුව නාද කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් ඔබතුමා ඡන්දය තියන්නේ මොකටද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ගන්නේ කොයි එකද කියලා. ගන්නවාද? නැද්ද? කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි මමත් අහන්නේ ඔබතුමා ඡන්ද විමසීම කරන්නේ 110 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාවටද කියලා. යෝජනාව ගේනවාද නැද්ද කියලාද? පැහැදිලි නැහැ නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න. නිශාන්ත ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මුලින් යෝජනාව ඉදිරිපත් කරන්න. ඊට පස්සේ තමයි ඡන්දය විමසන්නේ. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

# රීති අංක 110 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 110

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, කාලීන වූද පහත සඳහන් යෝජනාව සභාවට ගෙන ඒම සඳහා කාර්යපටිපාටි රීති 14(6), 14(7)(ආ), 19(1), 19(3), 39, 53(2) සහ 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කර සිටිමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ රීති අත්හිටුවීමේ යෝජනාවට සභාවේ එකඟතාවය? බෙදීමක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

බෙදීම ඉල්ලන්නේ කවුද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කවුරුවක්වත් බෙදීමක් ඉල්ලුවේ නැහැ නේද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ සදාචාරයක් තිබෙන්න ඕනෑ. ඔබතුමාට ඔය මූලාසනයේ ඉඳගෙන බෙදීමක් ඉල්ලන්න බැහැ. එහෙමනම් වෙන මන්ත්‍රීවරයෙකුට බෙදීමක් ඉල්ලන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉල්ලන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බලෙන් නම් කරලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉල්ලන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමාට මූලාසනයේ ඉඳගෙන බෙදීමක් ඉල්ලන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බෙදීමක් නැහැ. රීති අත්හිටුවනවාද? නැද්ද? කියලා ඔබතුමා ඡන්දයක් ගන්න. එච්චරයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. දැන් වාඩි වෙන්න. ඡන්දයක් සඳහා සීනුව නාද කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පළාත් සභාවද? සෙල්ලම් ගෙයක්ද? සෙල්ලම් ගෙදරක් වාගේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සෙල්ලම් ගෙදරට වැඩිය වුට්ටක් හොඳයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වුට්ටක් හොඳයි නේද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

යෝජනාව මොකක්ද? අපි ළඟ නැහැ. Table කරලා නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි ළඟ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු රීති අත්හිටුවීමේ යෝජනාව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබෙන්න සලස්වන්න. ඒ අනුව නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු රීති අත්හිටුවීමේ යෝජනාවට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව හම්බ වෙලා නැහැ. හරිද? දැන් එතුමාම නැහැයි කිව්වා නේ. දැන් හම්බ වුණාට. නමුත් දැන් ඔබතුමා නම් කරලා ඉල්ලනවා මේකට බෙදීමක් ඕනෑ කියලා. එතුමා තමයි බෙදීමක් ඉල්ලන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා ඉල්ලුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මොකක්ද මේ වැඩේ? මොකක්ද මේ විහිළුවක්?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා ඉල්ලුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සභාව විහිළුවක් වෙලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා ඉල්ලුවේ. නම් පටලවා ගන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ සඳහා නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලලිත් එල්ලාවල එහා පැත්තේ. මේ ලලිත් වර්ණකුමාර.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ රීති අත්හිටුවීමේ යෝජනාවට -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔහොම මහ ඇමැතිකම් කරන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එල්ලාවල නොවෙයි. මේ වර්ණකුමාර.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔහොම ගේම් ගහලා මහ ඇමැති වෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම පක්ෂව ඡන්දය විමසනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද රීති අත්හිටුවීමේ යෝජනාව ගැනීම සඳහා පක්ෂව ඡන්දය විමසනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ යෝජනාව මොකක්ද? අපට ලැබුණේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව ඉදිරිපත් කළා.

පක්ෂ මන්ත්‍රීතුමන්ලා නැඟී සිටින්න. වාඩි වෙන්න. එම යෝජනාවට විපක්ෂ මන්ත්‍රීතුමන්ලා නැඟිටින්න. හරි වාඩි වෙන්න. යෝජනාවට වැළකී සිටින මන්ත්‍රීතුමන්ලා ඉන්නවාද? නැහැ. ඒ අනුව පක්ෂව ඡන්ද 19 ක් ද, විපක්ෂව ඡන්ද 21 ක්ද ලැබිලා තිබෙනවා. ඒ අනුව ඡන්ද 02 කින් ඒ යෝජනාව පරාජයට පත් වෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මේ පැත්තේ සිටියා නම් ඉවරයි නේ. ඔය ඔක්කොම දා ගන්නවා නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අනුව අපට සිද්ධ වෙනවා,

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අඩුම ගණනේ නිරෝෂවත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නීත්‍යානුකූලව න්‍යාය පත්‍රයේ යෝජනාව අද සභාවට අරගන්න. මට ගැටලුවක් වෙනවා. මගේ යෝජනාව මම ගන්නේ කොහොමද කියලා. ඒ නිසා ගරු සභාපතිතුමාව මූලාසනයට කැඳවන්න වෙනවා. ඒ සඳහා මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඊළඟ කෙනාට දෙන්න. හැබැයි හරියට පුටුවෙවත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සභාව විනාඩි 10 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.14 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***
*Accordingly the Sitting, Suspended and. it resumed at 11.14 a.m with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට යෝජනාව -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. 2018.10.23, 2018.12.19 හා 2019.01.09 යන දිනවල පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවලදී ගත්තු තීරණයක්. ඒකට අනුව මේ සභාවේ සම්මත කළා, මේ යෝජනා පිළිවෙල අංක 02 හා 01 පරිදි විය යුතුයි කියලා. ඒ කියන්නේ මෙතුමාගේ යෝජනාව තිබෙන්නේ 01 ට. හැබැයි අපි සම්මත කරලා තිබෙනවා, අංක 02 යෝජනාව ඉස්සරහාට ගන්න ඕනෑය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මමත් හැබැයි ඒ ගැන - මටත් පොඩි -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා මෙතුමාගේ යෝජනාව නොවෙයි එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මම හිතන්නේ පිළිවෙළ වෙනස් කළා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

පිළිවෙළ වෙනස් කළා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පිළිවෙළ වෙනස් කළා. ඒක තමයි මම කියන්නේ. න්‍යාය පත්‍රය අනුව මෙතුමාගේ යෝජනාව නොවෙයි එන්නේ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

සභාවේ අනුපිළිවෙළ වෙනස් කරනවා කියලා අපි තීන්දුවක් ගත්තා උඩ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කොහොමද තීන්දුවක් ගත්තේ? අපි සභාවේ සිටියා නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා සිටියා නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ සභාවේ මම සිටියා නේ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

තීන්දුවක් ගත්තා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා කොහොමද එතැන ඉඳන් වෙනම තීන්දු ගන්නේ. තනියෙන්.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න. දැන් ඒක නැවත වතාවක් බලන්න කෝ. කථා කරලා. අනික් මන්ත්‍රීතුමන්ලාගෙන් අහලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කාගෙන්ද අහන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ගරු මන්ත්‍රීතුමා, මට හිතෙනවා -

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ඔබතුමාත් එක්ක තර්කයක් නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කාගෙන්ද අහන්නේ?

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මගෙත් එක්ක තර්කයක් නොවෙයි. න්‍යාය පත්‍රය ගැන ලේකම්ගෙන් කථා කරලා අහන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. ඕනෑ කෙනෙක්ගෙන් අහන්න. මොකක් හරි සිද්ධ වුණා නම්, අපිත් දැනගන්න එපැයි මොකක්ද වුණේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාවේ තීන්දුවක් ගත්තා මට මතක නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඉස්සෙල්ලා දෙකට තිබුණා. දැන් එක කළා ඒක.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

එක කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න බැහැ ගරු සභා නායකතුමා. එහෙම කරන්න අමාරුයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. නැහැ. එහෙම කරන්නේ කොහොමද?

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

අපි සභා කටයුතු එකේ එහෙම තීන්දුවක් නේ ගත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගත්තා නම් හරි. අපි ගත්තේ නැද්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකේදී එහෙම තීන්දුවක් ගත්තේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

රීති අත්හිටුවීමේ යෝජනාව ගන්වාද නැද්ද කියන එක විතරයි සම්මත කළේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මීට කලින් යෝජනා කළා මේ සභාවේදී මේ අනුපිළිවෙළ වෙනස් වෙන්න ඕනෑය කියලා. ඒ අනුව නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව එන්න ඕනෑ. එතුමා යෝජනාව ගන්නවාද නැද්ද කියන එක මට අදාළ නැහැ. මම කියන්නේ රීතිවලට අනුව ඒකයි වෙන්න ඕනෑ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මගේ එක ඉස්සෙල්ලා ගන්න ඕනෑය කියලා කිව්වේ නැහැ. හැබැයි, අපි සභා කටයුතු එකේදී තීන්දුවක් ගත්තා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒක තමයි මම මේ ගෙනාපු යෝජනාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේකේ සඳහන් වන ආකාරය මම කියන්නේ. මේකේ සඳහන් වන ආකාරයට ගන්න ඕනෑ, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, මම ඒ වෙලාවේ මූලාසනයේ සිටියේ නැහැ. නමුත් සභාවේ කටයුතු සඳහා යෝජනාව ඉදිරිපත් කිරීමේදී අංක 02 හා 01 පරිදි විය යුතුයි කියලා සලකා ක්‍රියා කිරීමට පළාත් සභාව එකඟ වෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ, මම දන්න සිංහල භාෂාව මම මේ කියන්නේ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ සිංහල භාෂාවෙන් මේකේ තිබෙනවා, මේ යෝජනා පිළිවෙල යෝජනා අංක 02 හා අංක 01 විය යුතුයි කියලා. එතකොට යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාව තිබෙන්නේ අංක 01 ට. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තිබෙන්නේ අංක 02 ට. එතකොට අපි මේක මේ සභාවේ සම්මත කළා නම්, දැන්න ගන්න ඕනෑ දෙක. ඒකයි මම මේ කියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

න්‍යාය පත්‍රය ගහලා තිබෙන්නේ, මේ යෝජනා අනුවද දන්නේ නැහැ නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා සභාවට ඕක පැහැදිලි කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, පරණ න්‍යාය පත්‍රයේ තිබෙන්නේ ඒක දෙකට. හරි නේ. මම පැහැදිලි කරලා දෙන්නද? මේ විධිය හරි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලිවම කරුණු මතක නැහැ. පෞද්ගලික මන්ත්‍රී යෝජනා යටතේ අනුපිළිවෙළ කියන එක අපි 02 සහ 01පරිදි විය යුතු යැයි සලකා ක්‍රියාත්මක කිරීමට තීරණය කළා. දැන් ඒක තමයි මේ වෙන්නේ. වෙන මොකුත් වෙන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මෙතැන හරි නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට 02 ක කියන්නේ, අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව. ඒක තමයි අපි ඉස්සෙල්ලා ගන්න ඕනෑ. මෙතුමාගේ එක නොවෙයි. මෙතුමාගේ යෝජනාව නොවෙයි ගන්න ඕනෑ. අපි ඉස්සෙල්ලා ගන්න ඕනෑ, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, දැන් මේ න්‍යාය පත්‍රය මුද්‍රණය කරලා තිබෙනවා. මෙතැන සභාවේ කටයුතු කියන එකේ, ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව කියලා ඒ යෝජනාව තිබෙනවා. ඒ කියන්නේ දෙක, එකට ගන්න ඕනෑය කියලා නේ ඒ යෝජනාවේ තිබෙන්නේ. එතකොට ඊට ඉස්සෙල්ලා න්‍යාය පත්‍රයේ මෙතුමාගේ එක තිබුණේ 02 ට. දැන් මේ සැරේ 01 ට දාලා තමයි මුද්‍රණය කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දාලා නැහැ, ගරු සභානායකතුමා. කොහෙවත්ත් දාලා නැහැ. දාලා නැහැ. මෙතුමාගේ යෝජනාව දෙකට තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

එහෙමනම් මොකටද යෝජනාවක් ගෙනාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි අංක ගැටලුවක් තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

එහෙමනම් සභානායක හැටියට මට මොකටද යෝජනාවක් දුන්නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සභාව විනාඩි 05 කට හරි කල් දාලා මේක පොඩ්ඩක් විසඳ ගනිමු කියලා. නැත්නම් විහිළුවක්. මේක සභාවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කල් දාන්න අවශ්‍ය නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

විනාඩි 05 කට හරි කල් දාන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒකට මම එකඟයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සභාව කල් දාලා මේක විසඳගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සභාව කල් දාන්න අවශ්‍යතාවයක් නැහැ. මේ අනුව තිබෙන්නේ කෙලින්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තිබෙන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඊට ඉස්සෙල්ලා න්‍යාය පත්‍රයේ මේ යෝජනාව දෙකට නේ තිබුණේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එතුමාට ඒ යෝජනාව ඉදිරිපත් කරන්න කියන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

යෝජනාව ඉදිරිපත් කරන්න කියන්න. එතකොට ඒක ඉවරයි නේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එතුමාට යෝජනාව ඉදිරිපත් කරන්න කියන්න. ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමාගේ යෝජනාව ගන්නවා කියපු නිසා නිරෝෂන් ගරු මන්ත්‍රීතුමා වෙනත් කාරණාවකට යන්න ඇතියි කියලා මම හිතනවා. අපි ඒ ගැනත් සාධාරණය බලන්න ඕනෑ. මොකද, නිරෝෂන් ගරු මන්ත්‍රීතුමා උදේ සිටියා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මෙතුමාගේ යෝජනාව ගනියි කියලයි එතුමා නැති වුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවෙන් පිට වෙලා ගිය හේතුව ඒකයි. ඒ නිසා එතුමාට අසාධාරණයක් කරන්නත් බැහැ. එතුමාට වැරැද්දක් කරන්නත් බැහැ. සභාව එකඟ නම් අපි නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාව ගනිමු. ප්‍රශ්නය ඉවරයි නේ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඔබතුමා ඇතුළු සභාව එකඟ නම් අපි ඒ යෝජනාව ගනිමු. සභාව නේ බලවත්. එතුමා පෙන්නපු එක හරි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක මට ප්‍රශ්නයක් නැහැ. මෙතුමාගේ යෝජනාව 01 ට ගන්න එකේ ප්‍රශ්නයක් නොවෙයි මට තිබෙන්නේ. මම කියන්නේ රීති අනුව කටයුතු කරනවා නම් වෙන්න ඕනෑ මෙකයි කියලයි මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. එහෙමනම් සභාව එකඟයි නේද? සභාවේ ප්‍රශ්නයක් නැහැ නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන කථාව හරි. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත් පසුවට ගන්න. එතුමාට අසාධාරණයක් නොවන පරිදි ගන්න. එතුමාට අසාධාරණයක් කරන්න එපා. න්‍යාය පත්‍රයේ ඒ විධියට තිබෙනවා. අතන සංශෝධනය තිබෙනවා, එකට ඉස්සෙල්ලා ඒ විධියට තිබෙනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟ නිසා යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාව දැන් ගන්නවා. දෙවනුව අපි නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ගන්නවා. හරි නේ. එතුමාට අනිවාර්යයෙන් යෝජනාවට එන්න කියන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

යෝජනාව ගන්න උනන්දු වෙනවා වාගේම ගණපූරණය තියා ගන්නත් උනන්දු වෙන්න ඕනෑ, ගරු සංවිධායකතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න කෝ. ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමා, සභාවේ එකඟතාවය අනුව ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

## පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු
## PRIVATE MEMBER'S AFFAIRS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, " *බස්නාහිර පළාතේ ග්‍රාමීය පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට අද ප්‍රවාහන අපහසුතා දැඩි ලෙස බලපාන බව සියළු දෙනා දන්නා කරුණකි. ඒ හේතුවෙන් පාසල් වැන් සංස්කෘතියක් බිහි වී ඇත. ආර්ථික අපහසුතාවය සැලකිල්ලට ගෙන පාසල් සිසුන්ගේ ප්‍රවාහන අපහසුතාවය නැති කිරීම සඳහාත්, නිරෝගී දරු පිරිසක් බිහි කිරීම සඳහාත්, 8 වසර පංතියෙන් ඉහළ ළමයින්ට පා පැදියක් ලබාදීම සුදුසුයැයි ද, ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන උපමාන පාදක අරමුදල් මගින් යම් ප්‍රතිශතයකට යටත්ව ප්‍රතිපාදන වෙන් කිරීමට අවස්ථාව සලසා දීම සුදුසුයැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවටයෝජනා කර සිටිනවා.*"

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.24]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට මා අදහස් කළේ විශේෂයෙන්ම මම අර මුලින් කථා කළ ආකාරයට දරුවන්ට ඒ නගරයේ පාසල් අහිමි වන අවස්ථාවක් අපට දක්නට ලැබෙනවා. විශේෂයෙන්ම අද දරුවන්ට ග්‍රාමීය පාසල් සඳහා ග්‍රාමීය මාර්ගවල කිලෝ මීටර තුන හතර පයින් ගමන් කිරීමට සිදු වී තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අද වැන් රථයකට ගෙවා ගන්න රුපියල් 3000, 4000 එක පවුලේ ළමයින් හතර පස් දෙනාට ගෙවා ගන්න බැරිව අද මිනිස්සුන්ගේ ආර්ථික තත්ත්වය ඉතාමත් පහළ මට්ටමකට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය නිසා දරුවන්ට අද පාසල් ඒම වාගේම දහම් පාසල් ඒම, විවිධ උපකාරක පන්තිවලට යාම මේ වාගේ තමන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහා විශේෂයෙන්ම දරුවන්ට අද ප්‍රවාහන පහසුකම් දැඩි ලෙස බලපාලා තිබෙනවා. ඒක නිසා මම දීර්ඝ කාලයක සිට මේ ගරු සභාවෙන් ඉල්ලීමක් කරන්න අදහස් කරගෙන සිටිය කරුණක්, අද මෙම සභාවට ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින්ම සතුටු වෙනවා.

ඒක නිසා මේ යෝජනාවෙන් මම බලාපොරොත්තු වෙන්නේ, 2019 වර්ෂයේ සිටම ගරු අමාත්‍යතුමන්ලාගේ කැබිනට් මණ්ඩලය හරහා මේ යෝජනාව සම්බන්ධයෙන් තීන්දුවක්, තීරණයක් අරගෙන ප්‍රධාන ලේකම්තුමාගේ අවසරය සහ ඒ මහ පෙන්වීම මත ඒ සැලසුම් අංශවලට දැනුම් දීලා, අපේ පළාත් සභා ප්‍රතිපාදන යටතේ මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා තමයි අද මේ යෝජනාව මේ ආකාරයෙන් ඉදිරිපත් කළේ. ඒක නිසා මම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලනවා. තමුන්නාන්සේලා දන්නවා, අද පළාත් සභාවේ විවිධ ව්‍යාපෘති, විවිධ වැඩ සටහන්වලට අපි මුදල් වැය කරනවා. නමුත් දරුවන්ගේ අධ්‍යාපනය තමයි දෙමව්පියන්ගේ තිබෙන පළමුවැනි අංගය. නැත්නම් පළමුවැනි රාජකාරිය. වඩාම වැදගත් වෙලා තිබෙන්නේ. ඒක නිසා අද දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා යම් උදව්වක්, උපකාරයක්, ශක්තියක් ලබා දෙන්න පුළුවන් නම් බස්නාහිර පළාතේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට, එය සමාජයට, අනාගතයට ඉමහත් ඉතිරියක්, අනාගත අයෝජනයක් කියලයි මා විශ්වාස කරන්නේ. දරුවෙකුට මෙවැනි පා පැදියක් ලබා දීම තුළ අපට පුළුවන්කමක් ඇති වෙයි, ඒ දරුවා නිරෝගී දරුවෙක් කරනවා වාගේම, අධ්‍යාපනයට උනන්දු දරුවෙක් කරනවා වාගේම ඒ දෙමව්පියන්ටත් සහනයක් ලබා දෙන්න. ඒ නිසා මෙන්න මේ කරුණු ඒකරාශී කරගෙන, විශේෂයෙන්ම මේ ග්‍රාමීය පාසල්වල, ග්‍රාමීය මාර්ගවල ජීවත්වන දරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීලා මේ ක්‍රියාවලිය

කරන්න අපේ පළාත් සභාවේ කැබිනට් මණ්ඩලය වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සැලසුම් අංශ වාගේම, විශේෂයෙන්ම මම ප්‍රවාහන සමූපකාර ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. සමූපකාර දෙපාර්තමේන්තුව හරහා මේවා ලබා දීමේ ක්‍රමවේදයක්, සහනදායි මිලකට ඒවා ගෙනැල්ලා බෙදා හැරීමේ ක්‍රමවේදයකුත් සකස් කරලා මේ යෝජනාව 2019 අවුරුද්දේ මුල සිටම ක්‍රියාත්මක කරන තත්ත්වයට ළඟා කරදීමේ අවශ්‍යතාවය, ඉල්ලීම ඉල්ලමින් මේ යෝජනාවට ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය මීට වඩා යොමු කරලා, සහයෝගය ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ගරු සභාපතිතුමනි, බොහොමත්ම ස්තුතියි.

[පූ.භා. 11.29]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපේ ගරු නියෝජ්‍ය සභාපති, යසපාල කෝරළගේ මැතිතුමා ගෙනෙන ලද යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් හැටියට අපි සඳහන් කරනවා. එතුමා ගෙනෙන ලද යෝජනාව දිහා අරගෙන බැලුවාම අද අපි සතුටු වෙනවා. එක්සත් ජාතික පක්ෂය අධ්‍යාපනයට ලබා දීලා තිබෙන වැඩ පිළිවෙළවල් දිහා බැලුවාම, නිල ඇඳුම් කට්ටලය. පොත්පත් ටික. දිවා ආහාරවේල. ග්‍රාමීය මට්ටමේ ජනතාවට නොයෙකුත් පහසුකම් ලබා දීලා වැඩ කටයුතු කරගෙන යන අවස්ථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පළාත් සභාවෙන් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා ග්‍රාමීය මට්ටමේ පාසල්වලට ලබා දීමට කරපු යෝජනා අපි සම්මත කරනවා. හැබැයි, ගරු සභාපතිතුමනි ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්ක තුන අරගෙන බැලුවාම කොළඹ දිස්ත්‍රික්කයේ අවිස්සාවේල්ල ප්‍රදේශය වාගේ දුෂ්කර ගම්මානවලත්, ගම්පහ දිස්ත්‍රික්කයේ දුෂ්කර ග්‍රාමීය පාසල්වලත්, විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ පාසල් අරගත්තාම ප්‍රවාහන පහසුකම් නොමැති පාසල් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම ග්‍රාමීය ආර්ථිකය නොදියුණු ප්‍රදේශ හැටියට අගලවත්ත, බුලත්සිංහල වාගේ මැතිවරණ කොට්ඨාශවල යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඒ යෝජනාවෙන් කිව්වා වාගේ ප්‍රයෝජනය ගන්න පුළුවන් විශාල පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් ඉන්නවා.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවට පැවරී තිබෙන විෂයයන් අනුව විශාල පාසල් ප්‍රමාණයක් බස්නාහිර පළාතට අයත්ව - මධ්‍යම ආණ්ඩුවට තිබෙන්නේ සුළු පාසල් ප්‍රමාණයක්. අපට අයත් ප්‍රදේශයේ විශාල පාසල් සංඛ්‍යාවක් තිබෙන්නේ බස්නාහිර පළාත් සභාවට. එහෙමනම් අපි අධ්‍යාපන අමාත්‍යාංශයත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් අරගෙන බැලුවාම අපට මේ පළාතේ ජනතාවගෙන් බදු අය කරගන්න වැඩ පිළිවෙළවල් අපි ඉස්සරහාට දාගෙන දාගෙන ගිහිල්ලා එකතු කරගන්න බදු මුදල් ටිකෙන් -මෙතුමා ඉල්ලීමක් කරන්නේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන ටික මේ වාගේ විෂයයකට වෙන් කරලා, විෂයෙන් දරුවන්ට ලබා දීමට වැඩ කටයුතු කරන්න අවස්ථාව දෙන්නය කියලා. එහෙමනම් අපි අරගෙන බැලුවාම නොයෙකුත් ව්‍යාපෘතිවලට වියදම් කරන මූල්‍ය ප්‍රතිපාදනයි, ඒ වාගේම මේ යෝජනාව සඳහා අවශ්‍ය වන නිර්දේශය ලබා දීමේ වැඩ පිළිවෙළ මේ හැම පක්ෂයකම ගරු මන්ත්‍රීතුමන්ලා එකතු වෙලා සහයෝගය ලබා දීලා පළාත් සභාවට ලබා දෙන්නය කියන එක ඉල්ලනවා. බයිසිකලයක් ලබා දීමේ මේ තීරණය අරගෙන මේ පළාත් සභාවෙන් මේක ක්‍රියාත්මක කරගන්න පුළුවන් වුණොත්, අපට පළාත් සභාව හරහා වටිනා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරලා, ඒ දරුවන් උදෙසා මන්ත්‍රීවරු 104 දෙනාගේම මූල්‍ය ප්‍රතිපාදනවලින් යම්කිසි මුදලක් ලබා දුන්නා නම්, අවුරුද්දකට සීමිත ප්‍රමාණයකට. අපට ඒ පහසුකම ලබා දීලා පළාත් සභාවේ තිබෙන වටිනාකමත්, පළාත් අධ්‍යාපනයෙන් කරන මහඟු ක්‍රියාදාමයත් ලෙසට මෙය බස්නාහිර පළාත් සභාවෙන් කරන වටිනාම වැඩ සටහනක් බවට අපි පත් වෙන බව මතක් කරන්න ඕනෑ.

අපට මතකයි. ග්‍රාමීය පාසල් සංවර්ධනය ක්‍රියාත්මක කරවීම. නගරයේ පාසල්වලට ඇතුළත් කිරීමේ වැඩ පිළිවෙළ. මන්ත්‍රීවරුන්ට සෑම වසරකදීම දෙසැම්බර් මාසය වන විට අපේ ගෙවල්වලට වැඩියෙන්ම එන්නේ පාසල්වලට දරුවන් ඇතුළත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නගරයේ පාසල්වලට දරුවාව දාලා දෙන්නය කියලයි. අපි පසුගිය කාලයේ දැක්කා. අපේ රජයේ ජාතික අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ව්‍යාපෘති ගණනාවක්, ග්‍රාමීය මට්ටමේ ජනතාවට නගරයේ ජීවත්වන පාසල්වල දරුවන්ට හා සමානව වැඩ පිළිවෙළක් ගමට ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු කළා. ඒ අනුව ශ්‍රී ලංකාවේ සෑම පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවකටම සුරක්ෂා

[ ගරු කිත්සිරි කහටපිටිය ]

රක්ෂණය කියන රක්ෂණ ආවරණය ලබා දීලා, පෝසත් අයගේ දරුවාටත්, දුප්පත් අයගේ දරුවාටත් ඒ පහසුකම ලබා දෙන්න වැඩ කටයුතු ක්‍රියාත්මක කළා. ඒ වාගේම තමයි ග්‍රාමීය මට්ටමේ තිබුණු ගුරුවරුන්ගේ අඩුපාඩුව සපුරා දීම සඳහා අවුරුදු 08ට, 10 ට වැඩි එකම පාසලේ ඉන්න ගුරුවරු සිටියා නම් ඒ අයව මාරු කරලා, ඒ ග්‍රාමීය මට්ටමේ ඉන්න ගුරුවරුන්ගේ අවශ්‍යතාවයන්ට ඉල්ලුම් කරන්න නගරයට ගුරුවරු මාරු කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. ඊට අමතරව ළඟම පාසල හොඳම පාසල කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා, ඒ ව්‍යාපෘතිය තුළින් ග්‍රාමීය මට්ටමේ පාසල් දියුණුකොට, සංවර්ධනය කර ග්‍රාමීය මට්ටමේ පාසල්වලට දරුවන් ඇතුළත් කරන්නය කියා දෙමව්පියන් යොමු කිරීමේ වැඩ පිළිවෙළ ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක කරගන්න පුළුවන් වැඩ සටහනක් අපේ ජාතික ආණ්ඩුවේ වැඩ පිළිවෙළ තුළ ක්‍රියාත්මක වුණා.

යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මම කියන්න කැමැතියි. එතුමා දන්නවා, කළුපන විද්‍යාලය. ඉතාමත් අඩු දරුවන් ප්‍රමාණයක් හිටපු විද්‍යාලයක්. එදා අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට රෙජිනෝල්ඩ් කුරේ ඇමැතිතුමා, ඔබතුමා, මම, අපි එකතු වෙලා. ජනතාව වැරැදි මත දැරුවා. අපි ඒ අභියෝගය භාර අරගෙන පාසල් ක්‍රියාත්මක කළාම අද ළමයින් 1000 කට ආසන්න ප්‍රමාණයක් එන පාසලක් බවට අපේ කුළුපන විද්‍යාලය පත් කරලා තිබෙනවා. ඊට පස්සේ අපි දැක්කා, සිරිමෙවන් විද්‍යාලය. ඊට එහා තිබෙන විද්‍යාලය. මම කල්පනා කළා. මහජන නියෝජිතයෙකු හැටියට මම ඉන්න ගමේ ඒ පාසල් දෙක සංවර්ධනය කරන්න ඕනෑය කියන ඒ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළාම අපට ඊයේ පුළුවන් වුණා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැයෙන්, මම හිතන්නේ Smart පන්ති කාමර දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. මම ඉතාමත් සතුටු වෙනවා. ජාතික රජය දීගෙන දීගෙන යන කොට, පළාත් සභාවේ අපටත් - විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තූතිවන්ත වෙන්න ඕනෑ. Smart පන්ති කාමර ක්‍රියාත්මක කරවීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීලා, දැන් සතියකට විතර කලින් සිරිමෙවන් විද්‍යාලයේ ඒ Smart පන්ති කාමර මුලින්ම ආරම්භ කරන්න, මම ගිහින් ඒක විවෘත කළා. එදා සිරිමෙවන් විද්‍යාලයේ විදුහල්පතිතුමා ළමයින් සොයා ගන්න ගෙවල්වලට ගියා. අද සිරිමෙවන් විද්‍යාලයේ එක පන්තියක් නොවෙයි. පන්ති දෙකක් දාලත් ඊටත් වැඩිය ළමයින් ප්‍රමාණයක් ඒ පාසලට ඇතුළත් කරගන්න පුළුවන්කම ඇති වුණා. ඇත්ත වශයෙන්ම එම විද්‍යාලයේ විදුහල්පතිතුමාට විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙන්න ඕනෑ. එතුමා වැඩ භාරගෙන වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේදී ග්‍රාමීය පාසලක් හැටියට, ඒ පාසලට දරුවන් යන්නේ නැති අවස්ථාවක, එතුමා ඒක භාරගෙන වැඩ කටයුතු කරලා, අපි හැමෝගෙන්ම ආධාර උපකාර ලබාගෙන කටයුතු කරලා, ඉතාමත් අලංකාර ලෙසට එම විද්‍යාලයේ ඉස්සරහා ගේට්ටුව, ඉස්සරහා තාප්පය වෙනස් කරලා ගත්ත වැඩ පිළිවෙළේ ප්‍රතිඵලයක් හැටියට රන් පදක්කමක් ගන්න පුළුවන් පාසලක විදුහල්පතිවරයෙක් හැටියට එතුමා නම් වෙලා, එදා පදක්කම් දීමේ උත්සවයේදී එතුමා ඒ පදක්කම ලබා ගත්තා. එහෙමනම් අපි පළාත් සභාවේ මහජන නියෝජිතයන් හැටියට අපේ වගකීම විය යුත්තේ පක්ෂ, පාට දේශපාලනයෙන් ඉවත් වෙලා සෑම වසරකදීම පළමු වැනි වසරට ඇතුළත් වන ළමුන්ගේ අධ්‍යාපනය ශක්තිමත් කරන්න දැවැන්ත වැඩ පිළිවෙළක් අපට හදන්න සිදු වෙනවා. මෙතුමා කිව්වා වාගේ ඒ පාසල් අවට ඉන්න දරුවන්ව පාසලට ඇතුළත් කිරීමේ බැරි තත්ත්වයක් තිබෙනවා, ඡන්ද හිමි නාම ලේඛනයේ නම නැහැයි කියලා. එහෙමත් නැත්නම් තාත්තාගේ නමට ඉඩම තිබෙන කොට. පුතා විවාහ වෙලා ළමයා හදාගෙන පාසලට දාන්න ගියාම ඉඩමේ ඔප්පුව නැහැයි කියන වැඩ පිළිවෙළ තුළ ඒ අය ප්‍රතික්ෂේප වෙනවා. මේක විශාල වැඩ පිළිවෙළක්. අපි බස්නාහිර පළාත් සභාව තුළ අරගෙන බැලුවාම මෙය කොළඹ, ගම්පහ සහ කළුතර කියන සෑම දිස්ත්‍රික්කයේම, ඔබතුමා ඇතුළු මේ මන්ත්‍රීවරුන්ට ජනවාරි මාසයේ පාසල් පටන් ගන්න කොට ඔය ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

එහෙමනම් අපි ඉල්ලීමක් කරන්න කැමැතියි. ඒ පාසල්වල තිබෙන තත්ත්වය, ඉඩකඩ බලලා පන්ති වැඩි කිරීමක් ඇති කරන්න ඕනෑ. එහෙමත් නැත්නම් විශේෂ අවධානය යොමු කරලා ජාතික ආණ්ඩුවෙන් ගත්ත වැඩ පිළිවෙළ, ළඟම පාසල - හොඳම පාසල කිරීමේ වැඩ පිළිවෙළ පළාතේ අධ්‍යාපනය සඳහා අපේ පළාතේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය, අධීක්ෂණය, කැපවීම, ක්‍රියාත්මක කරවීම තුළින් එම පාසල් ටික සංවර්ධනය කරලා, අර ග්‍රාමීය මට්ටමේ දරුවන්ට වෑන් එකෙන් යන එක, බස් එකෙන් යන එක නතර කරලා, අපි පා පැදියක් ලබා දීලා, ළඟම තිබෙන පාසලට දරුවා බයිසකලයකින් යනවා නම්, අද තිබෙන විශාල රෝග අරගෙන

බැලුවාම,බෝ නොවන රෝග ඇති වෙලා තිබෙන්නේ excise කිරීම නැතිවීම තුළින්. එහෙමනම් බයිසිකලයක් පැදගෙන ඒ ළමයා පාසලට යන කොට සෞඛ්‍ය පැත්තෙන් තිබෙන වර්ධනය වැඩි වෙනවා. නිරෝගීකම ඇති වෙනවා. ගමන් පහසුව වාගේම ආර්ථික පහසුකමත් එයාට ලැබෙනවා. ඒ නිසා යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඉදිරිපත් කරපු මෙම යෝජනාව ඉතාමත්ම හොඳ යෝජනාවක්. මම හිතන්නේ අපේ කවුරුත්ම මේකට විරුද්ධ වන එකක් නැහැ. ඒ යෝජනාව ක්‍රියාත්මක කරලා ග්‍රාමීය මට්ටමේ පාසල් යන දරුවන්ගේ අධ්‍යාපනයට බස්නාහිර පළාතෙන් විශාල සහයෝගයක් ලබා දෙන ව්‍යාපෘතියක් හැටියට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අවස්ථාව, සහයෝගය, ශක්තිය අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින්, මගේ කාලය පිළිබඳව ඔබතුමා දක්වන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඔබතුමා කථා කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ කථාව අවසන් කරමින්, මේ යෝජනාව ඔබ සියලුදෙනාගේ සහයෝගයෙන් සම්මත වෙලා ඉතා ඉක්මණින් මේ අවුරුද්දේ අපට ඒ යෝජනාවට ප්‍රතිපාදන ලබා දෙන්න අවශ්‍ය කටයුතු සැලසේවා කියා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[පූ.භා. 11.40]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අපේ යසපාල කෝරළගේ මැතිතුමා හොඳ යෝජනාවක් අද මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. නමුත් මේ යෝජනාවත් මට පෙනෙන්නේ, පළාත් සභා ඉතිහාසයේ මේ සභාවට ගෙනෙන ලද යෝජනා හුඹස් පෙට්ටියට ගියා වාගේ මේකත් යයි කියලා තමයි මම විශ්වාස කරන්නේ. අපි මීට පෙර යෝජනාවක් ගෙනාවා. මේ පළාතේ ඉන්න අඩු ආදායම්ලාභී සහ අංගවිකල දරුවන්ට මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය වාගේ ක්‍රමයක් ගෙනැල්ලා යම් දීමනාවක් දෙන්නය කියලා. අද වනතුරු ඒ සම්බන්ධව වැඩ කරන්න මේ අයවැයෙන් ශත පහක් වෙන් කරලා නැහැ. අනවශ්‍ය ගොඩනැගිලි, අනවශ්‍ය පාරවල්, අනවශ්‍ය දේවල් සඳහා යොදවමින්, මුදල් විනාශ කරන දේවල් සියල්ලක්ම මේ සභාවේ වෙනවා. නමුත් හරි තැනට, හරි දේට මුදල් යොදවන එහෙම ක්‍රමවේදයක් මේ සභාවේ අපේ කැබිනට් එකේ නැහැ. එහෙම දැක්මක්වත් නැහැ. ඒ නිසා අපි ඉදිරියේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යටතේ, පිහිටවනු ලබන ආණ්ඩුව යටතේ පළාත් සභාවේ අපේ අලුත් කැබිනට් මණ්ඩලය මෙවැනි දක්ෂ සෑම යෝජනාවකටම අයවැය හරහාම මුදල් වෙන් කරන්න අපි කටයුතු කරනවා කියන එකත් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අනාගත මහ ඇමති වෙනවද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් ඔක්කොම එකයි නේ. සිරිසේන අයියාගෙන් දැන් ප්‍රශ්නයක් නැහැ. ඔක්කොම එකට ඉන්නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. අපේ විපක්ෂයේ වාඩි වෙලා ඉන්න කාරියවසම් මැතිතුමාට විතරයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔබතුමාද මහ ඇමැති?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒක මහජනයා තීරණය කරයි. ඒක මහජනයා තීරණය කරන්නේ. ඒක මෙතැනට අදාළ නැහැ. ඒ නිසා අපි ගෙනෙන ආණ්ඩුවේ නායකයාගේ - මොකද කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, කෑම වේලක් දෙනවා කියලා. අද කෑම වේල කෝ? අද කිරි වීදුරුව කෝ. දරුවන්ට.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කෝ ඒවා?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කෝ ඒවා. අද නැහැ. අද මේවා නැහැ. තිබෙනවා නම් යූ.ඇන්.පී. එක අත උස්සන්න කෝ. නැහැ නේ අද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

කිරි වීදුරුව දුන්නේ කවුද? කෑම වේල දුන්නේ කවුද? නිදහසේ පොත් ටික දුන්නේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි දෙනවා කෑම පැකට් එකක්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඇඳුම් දුන්නේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි කෑම වේලක් දෙනවා. ඉදිරියට අපි පත් පැකට් එකක් දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉන්ෂුවරන්ස් එකක් දුන්නේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාව අටෙන් එහා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

වවුචරේ දුන්නේ කවුද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අටෙන් එහා දුෂ්කර දරුවන් කවුද? පළමුවැනි පන්තියේ සිටම ඒ දරුවන්ට දෙන්න ඕනෑ. මොකද හේතුව පළමුවැනි පන්තියේ දරුවා Private School Van එකේ යනවාද? බස් එකේ යනවාද? ගෙදර ඉන්න තාත්තාට හරි, අයියාට හරි මේ දරුවාත් දාගෙන ඉස්කෝලේ ගෙනියන්න පුළුවන් නිසා මේ යෝජනාවට පොඩි සංශෝධනයක් ඇතුළු වෙන්න ඕනෑ. පළමුවැනි වසරේ සිට කියලා. පළමුවැනි වසරේ දරුවාට බයිසිකලේ පදින්න බැරි වෙන්න පුළුවන්. ඉස්සර අපේ පුරාණ මුතුන් මිත්තෝ එහෙමයි ගමේ තිරික්කලෙන් ගියේ. තිරික්කලෙත් එක්ක ගියේ, බයිසිකලෙන්. බයිසිකලයෙන් ගිහිල්ලා තමයි කන්නන්ගර මැතිතුමා මේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ගෙනැල්ලා, විශ්ව විද්‍යාල ඇති කරලා, මේ දක්ෂ, උගත් දරුවන් බවට පරිවර්තනය කරන රටක් අපේ නිර්මාණය වුණේ. ඒ නිසා යසපාල කෝරළගේ මැතිතුමාගේ මේ යෝජනාවත් එක්ක ගෙනාවාම, මේ යෝජනාවට අපේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදනවලින් දීලා මේක කරන්න පුළුවන්කමක් නැහැ. මොකද දැන් බයිසිකලයක් රුපියල් 15,000 ක්, 20,000 ක් වෙනවා. එතකොට අපට දෙන්නේ ලක්ෂ 25 යි. නැත්නම් 35 යි. 50 යි. එතකොට මේ percentage එක අනුව, මේ චක්‍රලේඛය අනුව මේකෙන් දෙන්න පුළුවන්ද? ඉස්සෙල්ලාම මේ චක්‍රලේඛය වෙනස් කරන්න අර නිලධාරී මහත්ම මහත්මීන්ට අපි කිව්වා. මේ සභාවේ කී සැරයක් කිව්වාද මරණාධාර සමිතියකට රුපියල් ලක්ෂයක් දෙන්න පුළුවන් විධියට චක්‍රලේඛය වෙනස් කරන්න කියලා. ඒක කළාද? කළේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කළා. කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ලක්ෂයක් දෙන්න බැහැ. තවම රුපියල් 50,000 යි දෙන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ලක්ෂයක් දෙන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙමනම් සමාවෙන්න. එහෙම කළා නම් හොඳයි. අපි ක්‍රීඩා සමාජ ගැන කිව්වා. සමාවෙන්න. සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් දෙන Hut එක, එක සැරයක් දුන්නාම නැවත දෙන්න පුළුවන් වන්නේ තව අවුරුදු පහකින්. Hut එකක් පාවිච්චි කරන්න පුළුවන් වන්නේ මාස 06 යි. Hut එක ඉරිලා යනවා. එතකොට මේ යෝජනාවල් ගේන කොට ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් අදාළ නිලධාරීන්ව කැඳවලා සාකච්ඡා කරන්න ඕනෑ. කිසි දවසක එහෙම රැස්වීමක් අපේ තියලා නැහැ නේ. එහෙම තියලා නැහැ.

ඔබතුමාටත් වගකීමක් තිබෙනවා. ඔබතුමා තමයි මේ 104 දෙනාගේම නායකයා. ඔබතුමාගේ යටතේ තමයි කැබිනට් එක ඉන්නේ. එතකොට ඔබතුමා තමයි සභාවට වග කියන්න ඕනෑ. එතකොට ඔබතුමාගේ යුතුකමක් තිබෙනවා, මේ ගෙනෙන යෝජනාවන්වලට ඔබතුමා නම් කරලා කමිටුවක් දාලා ඒක කරන්න.

ප්‍රසන්න රණතුංග ගරු මහ ඇමැතිතුමා ඉන්න කාලයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ගංවතුර සහනාධාර, වියළි සහනාධාර දෙන්න අපි කමිටුවක් පත් කරලා, සංශෝධන ප්‍රඥප්ති ගෙනැල්ලා, ඒ කමිටුවට මන්ත්‍රීවරුන්ගේ යෝජනා අදහස් අරගෙන කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු ඒකට සහභාගි වුණා. එහෙම අරගෙන කරන්න ඕනෑ. නැත්නම් අපි කාලය නාස්ති කරලා, මහජනයාගේ සල්ලිවලින් මෙතැන ඇවිල්ලා කථා කරලා, හොඳ යෝජනාවක් ගෙනාවා කියලා අපව පත්තරේ වැටෙන්න මාධ්‍ය කිව්වාට ඒක වෙන්නේ නැත්නම් මොනවාටද? මේක වෙන්නයි ඕනෑ. මේක තමයි මහජන සේවය. මේක මහජන සේවා ආයතනයක්. එතකොට මහජන සේවා ආයතනය තමයි නිදහස් ඡන්ද ක්‍රමය පවතින්නේ. ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමය යටතේ ඔක්කොම එකතු වෙලා මේක අනුමත කළත් අතනින් කරන්න ප්‍රතිපාදනයක් දෙන්නේ නැත්නම් කොහොමද කරන්නේ? එතකොට මේ සඳහා පළමුවැනි අයවැයේදී පරිපූරකයක් දාන්න ඕනෑ. පරිපූරකයක් දෙන්න ඕනෑ මුදල් ලේකම්වරයා විසින් ප්‍රධාන ලේකම්වරයා හරහා ගෙනෙන මේ යෝජනාවට අදාළ විස්තර ටික සොයලා, කොච්චර ඉන්නවාද? දිස්ත්‍රික්ක කීයක් තිබෙනවාද? එතකොට මේවාට අවශ්‍ය මොන මොන විධියටද? මේකේ අඩු ආදායම් ලාභී කවුද? එතකොට මේ විධියට කරලා මේක බෙදලා පොඩි proposal එකක් ගෙනැල්ලා ඒකට අනුව මුදල් වෙන් කරනවා නම් අන්න නිසි තැන. මේ පළාත් සභාවේ මහජන සේවාව ඉටු වෙනවා කියලා අපි විශ්වාස කරනවා. එහෙම වෙන්නේ නැහැ. අපේ කාලයේ මීට වඩා හොඳ මිෂන් එකක් තිබුණා. හොඳ වැඩ පිළිවෙළක් තිබුණා. ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ නායකත්වයෙන් හොඳ වැඩ පිළිවෙළක් අපට තිබුණා. එතකොට කෑම ටික කාලා යන්න එන මිනිස්සු නොවෙයි අපි. අපි ආවේ මහජන ඡන්දයෙන් මහජන සේවාවන් කරන්න. කෝරළගේ මැතිතුමාටත් එවැනි දෙයක් තිබෙනවා.

අද බලන්න මේකත් එක්ක ඉස්කෝලෙට දරුවෝ අරින එතුමා මීට පෙර යෝජනාවක් ගෙනැල්ලා අපි ඒ ගැන කථා කළා. පන්ති කාමරයේ දරුවෝ අඩු වෙන එක ගැන. පන්ති කාමරයේ අඩු වෙන දරුවාට කාමරයක් හදන්න කියලා මේ අයවැයේ ශතයක්වත් වෙන් වෙලා තිබෙනවාද? නැහැ. ලබන අවුරුද්දේ 36 දක්වා අඩු වෙනවා. එතකොට කොහොමද පන්ති පහක් තිබෙන පාසලේ හය ගණනේ අඩු වුණාම හයවරක් පහ තිහක් අඩුයි. එතකොට ඒ ළමයින්ට පන්ති කාමරයක් නැහැ. එහෙම වැඩ පිළිවෙළක් නැහැ නේ? මෙන්න මේ නිසා මේ වැදගත් යෝජනාව තමයි අයවැයට එන්න ඕනෑ . එතකොට අයවැය හරහා තමයි මුදල් දෙන්න ඕනෑ. එහෙම නැත්නම් පරිපූරකයක් දෙන්න ඕනෑ. මම කිව්ව කණ්ඩායම හදලා, ඒ Team එකේ යෝජනා ටික ගෙනැල්ලා මේවා සාකච්ඡා කරන්න.

ඒ වාගේම ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා, නියං සහනාධාර, ගංවතුර සහනාධාර දෙන්න පුළුවන් වන යෝජනාවක් ගෙනාවා. අද වනතුරු ඒකට අදාළ ප්‍රඥප්තිය මේ සභාවට ගෙනැල්ලා අනුමත කළාද? නැහැ. නැවත ගංවතුරක් ආවාම නැවත මේක කථා කරනවා. නැවත නියඟයක් ආවාම අපි කථා කරනවා. නමුත් වැඩේ කරන්න ගියාම හිර වෙලා. වැඩේ නැහැ. මේ බලතල දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කැබිනට් මණ්ඩලයට තිබෙනවා, අපට තිබෙන ඕනෑම විෂයකට ප්‍රඥප්ති හදන්න. ප්‍රඥප්ති හදලා මේ සභාවේ අනුමත කළා නම්, මේවා නිකන් ටොයිස් වාගේ වැඩ. එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා තමන්ට ඕනෑ ඕනෑ දෙයට දේශපාලන නම දාගන්න, ඒ බෝඩ් එකක් ගහගන්න, එහෙම නැත්නම් මුල්ගලක් තියලා එතැනට නම ගහගන්න ඒවා මේවාට වෙන්නේ නැහැ. මේවා මහජන සේවාවට වන දේවල්. බිල්ඩින් එකක් හදන කොට මුල් ගලක් තියලා නමක් ගහනවා. මේවා නොවෙයි මේ. අපේ ගමේ දුප්පත් දරුවාට හොඳ අධ්‍යාපනයක් දීලා, රටේ හොඳ පුරවැසියෙක් කරන්න, ජාත්‍යන්තරයට යවන්න, ජාත්‍යන්තර භාෂාව කථා කරන්න පුළුවන් දරුවෙක් ඇති කරන්න අවශ්‍යයි. එතකොට සෑම දරුවෙක්ම ඉංජිනේරුවරයෙක්, වෛද්‍යවරයෙක්, ගුරුවරයෙක්, රාජ්‍ය සේවකයෙක් කරවන්න දෙමව්පියන් වෙහෙසනවා. දරුවාට ආදරය කරලා, දෙමව්පියන් වයසට යන කොට මේ දරුවා හොඳ රස්සාවක් කරලා ඔවුන්ව බලාගනියි කියලා විශ්වාසයක් අපේ රටේ සංස්කෘතියක් එක්ක තිබෙනවා. එතකොට මෙන්න මේවා එක්ක තමයි මේ වැඩ සටහන් තිබෙන්න ඕනෑ. ඒ නිසා අපේ යසපාල

[ ගරු උපාලි කොඩිකාර ]

කෝරළගේ මැතිතුමා මේ ගෙනෙන ලද යෝජනාවට මීට වඩා සළකලා, ඔබතුමාවත් මේකට මැදිහත් වෙලා ඇමැතිවරයාවත් මෙතැන ඉන්නේ නැහැ. මේ යෝජනාව ගැන කථා කරනවා. අද උදේ බලන්න කෝ. ඔබතුමාටයි බැන්නේ. මේ විෂයය සම්බන්ධව කථා කරන කොට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ එක නිලධාරියෙක්වත් මෙතැන ඉන්නවාද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ලේකම් ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කෝ. ලේකම්වරු ඉන්නවා. මේකේ නැහැ. අධ්‍යාපනයේ නැහැ. මේ විෂයය අධ්‍යාපනය. එතකොට ප්‍රධාන ලේකම්තුමාගේ මුදල් අංශයෙන් මේකට ඉන්නවාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒක හරි වැරැදි වැඩක්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා සෑම සභා වාරයකටම සෑම ඇමැතිවරයෙකුගේම ලේකම්වරු, අදාළ නිලධාරීන් න්‍යාය පත්‍රය අනුව අර ගැලරියේ වාඩි වෙන්න ඕනෑ. ඒ කාලයේ එහෙම තිබුණා. අද එහෙම එකක් නැහැ. අද බලන්න. මුදල් වෙන් කරලා ගත්තාම මහ ඇමතිතුමා ගැන ඔක්කොම වාගේ කථා කළා. මම කැමැතියි, කොළඹ දිස්ත්‍රික්කයට වැඩියෙන් දැම්මාට. අපේ ආසනයේ වැඩියෙන් පාරවල් හැදුවාට කැමැතියි. කෝ ඡන්දේ? නැහැ. පසුගිය මැතිවරණයේ ඡන්දය අනුව පළමුවැනියා වුණේ කවුද? ඒක තමයි සුදුසු තැනට නියම ඥානය යොදවන්න. මේ මොළය යොදවන්න ඕනෑ හරි තැනට. ඒක තමයි දේශපාලඥයාගේ යුතුකම වෙන්නේ. මෙන්න මේ වැඩ ටික කරන්න ඒ විධියට සැකසුම් කරන්න වැඩ සටහනක් කරන්න කියලා ඉල්ලමින්, මේ යෝජනාවට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයේ පොල් කඩන මිනිස්සු උණ බම්බු බයිසිකලේ තියාගෙන යනවා. බයිසිකලේ වටිනාකම ඒ. දැන් පොල් ගහේ නඟින්නේ නැහැ. කෙක්කෙන් කඩන්නේ. ලෝකයේ රටවල්වල තිබෙනවා මැෂින් එක පොල් ගහට ගහලා ඒක උඩ යනවා. බයිසිකලේ මේකට විතරක් නොවෙයි. ගෙයකට දුන්නාම වටිනා දෙයක්. දරුවා ඉස්කෝලයට යනවා. පොළට යනවා. දරුවා ටියුෂන් පන්තියට යනවා. දරුවා කලා අංශයට යනවා නම් නැටුම් පන්තියට යනවා. එතකොට මේ වාගේ සෑම දෙයකටම වියදම් කරන කොට ගෙදර පොකට් එකේ සල්ලිත් ඉතුරු වෙනවා. තෙල් ගහන්නේ නැහැ නේ. මොකද තෙල් ගැහෙන්නේ නැහැ නේ. පාරේ Traffic එකත් නැහැ නේ. වාහන තදබදයත් නැහැ නේ. ඒ නිසා මේවා කල්පනා කරලා බලලා මේ යෝජනාව සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා, පැරැණි යෝජනාත් මේවාට එකතු කරලා කටයුතු කරන්නය කියලා ඉල්ලමින් මේ සම්බන්ධයෙන් අවස්ථාව ලබා දීම ගැනත්, මේ යෝජනාව ගෙනෙන ලද යසපාල කෝරළගේ මැතිතුමාටත් අපේ ගෞරවය, ස්තුතිය පුද කරමින්, මේ අවස්ථාව ලබා දුන්නු ඔබතුමාටත් අපේ ස්තුතිය පුද කරමින්, මේ කට්ටිය ඔක්කොම පොර කනවා නේ? දැන් මේ පර්මිට් එක සම්බන්ධවත්. මට අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පෙරෙයිදා තංගල්ලේදී කිව්වා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ආපු ගමන් පර්මිට් හම්බ වුණේ නැති අපේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට ඒ බලපත්‍රය දෙනවා කියලා. ඒක අපි මේ අවස්ථාවේදී දැනුම් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. විශාල මූල ධනයක් වියදම් කරලා හදපු මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට parking දීලා තිබෙන්නේ Basement එකේ. එතකොට මම දැන් lift එකක් එනතුරු විනාඩි 25 කට වැඩිය Basement එකේ සිටියා. lift එක Ground Floor එකට එනවා. උඩට යනවා. Ground Floor එකට එනවා. උඩට යනවා. එක්කෝ මන්ත්‍රීවරුන්ට Basement එකෙන් උඩ parking එකක් දෙන්න. එහෙම නැත්නම් lift එක operate කරන කෙනාට කියන්න Basement එකට ගිහිල්ලා මන්ත්‍රීවරුත් අරගෙන එන්න කියලා. මම විතරක් නොවෙයි.

චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාත් සිටියා. මෙතුමාත් සිටියා. එතුමා සිටියා කියලා කියනවා. මම හිතන්නේ ගරු මන්ත්‍රීවරුන් ගණනාවකටම තිබෙන කාරණාවක්. එක්කෝ Basement එකෙන් උඩ දෙන්න. එහෙම නැත්නම් operate කරන අයට කියන්න Basement එකට ඇවිල්ලා මන්ත්‍රීවරුත් අරගෙන එන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියගේ අදහසට බොහොම ස්තුතියි. මමත් ඒකට එකඟ වෙනවා. මොකද ගිය සභාවේදී ප්‍රශ්නයක් ආවා, සභාව වෙලාවට පටන් ගන්නේ නැහැයි කියලා. ඒ නිසා මම වෙලාවට ආවා. පෙ.ව. 09.10 ට මම ආවා. විනාඩි 10 ක් මමත් බලාගෙන සිටියා. lift එක නවත්වන්නේ නැහැ. උඩට යනවා. පහළට යනවා. පසුව මම එහා lift එකට නැග්ගා. ඒකත් අර බස් එකක් වාගේ තමයි . හැම හෝල්ට් එකකම නවත්වනවා වාගේ හැම තැනම නවත්වනවා. මම ආයේ අනික් පැත්තට බැස්සා. මන්ත්‍රීවරුන්ගේ lift එකේ එන්න ඕනැය කියලා. ඒත් lift එක නැහැ. ඊට පස්සේ මම බොහොම අමාරුවෙන් උඩට බොත්තම ඔබලා සිටියා. ඔන්න lift එක ආවා. මම ඇහුවා, ඇයි මල්ලි ඔයා එහෙට මෙහෙට යන්නේ. ප්‍රමාද වෙන්නේ? ඇයි මේකේ නවත්වන්නේ නැත්තේ කියලා. අහවල් මන්ත්‍රීතුමා ආවා. අහවල් මන්ත්‍රීතුමා ආවා. අහවල් කෙනා ආවා. මම එක්කගෙන ගියා ගියා කියලා කියනවා. ඒ ළමයි අසරණයි. ඒ ළමයින්ට කරන්න දෙයක් නැහැ. නීතියක් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මේක අද ඊයේ ප්‍රශ්නයක් නොවෙයි. අඩුම ගණනේ සභාව දවසට ගරු මන්ත්‍රීවරුන්ට ඉක්මණට උඩට එන්න තිබෙන්න ඕනෑ. ඒක වෙන්නේ නැහැ. ඒ නිසා මම මෙය අදාළ බලධාරීන්ට යොමු කරනවා. ඒවා සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මම මේවාට උත්තර දෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමන්ලාට Basement එකේ තිබෙන්නේ. කතන්දරය ඇත්ත. Basement එකට lift එක එන්නේම නැහැ. මොකද පුරුදු වෙලා තිබෙන්නේ, Ground Floor එකෙන් උඩට යනවා. Basement එකට එන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය අපට බලපාන ප්‍රධාන ප්‍රශ්නයක්. අපේ රණසිංහ මහත්මයාත් ඉන්නවා. එතුමා හැම දෙයකටම ඇහුම්කන් දෙනවා. අපිත් එක්ක බොහොම හිතවත් නිලධාරී මහත්මයෙක්. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මොකද උදේ Parking ප්‍රශ්නයක් ආවා. ගරු මන්ත්‍රීතුමන්ලාගේ Parking ස්ථානවල කැඩුණු වාහන නවත්වා තිබෙනවාලු. ඒ නිසා මොකක් හරි කරලා මෙය නිවැරදි කරලා දෙන්න. මටයි මේ හැම දුක්ගැනවිල්ලම කියන්නේ. සෙනල් ගරු මන්ත්‍රීතුමාටත් ඒ ප්‍රශ්නය වෙලා තිබෙනවා. එතුමාත් මට ඒ කාරණාව කිව්වා. ඒ නිසා lift එකේ ප්‍රශ්නයට නම් ඉක්මණට මොකක් හරි කරලා දෙන්න. මම ඇහුවා lift එකේ එලාම් එකක් නැද්ද කියලා. එලාම් එකක් lift එකේ නැහැයිලු. මට මතකයි සෙත්සිරිපායේ අපි යන කොට බෙල් එක ගැහුවාට පස්සේ lift ඉක්මණට පල්ළෙහාට එනවා. බෙල් එක වැදුනාම දැනුවත් වෙනවා. මේකේ එහෙම එකක් නැහැ. අඩුපාඩු හදා ගනිමු. අලුත් සභාවක් මේක. එකපාරටම අපටත් අඩුපාඩු හදාගන්න අමාරුයි. ගරු මන්ත්‍රීතුමිය, ඊළඟ සභාව වන විටවත් ඒක හදා ගන්න අපි උත්සාහ කරමු.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, සභාව දවසටවත් මේ lift එක අපට වෙන් කළා නම් හරි නේ. 12 වැනි තට්ටුවටයි. Basement එකටයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්. අපි එහෙම තමයි අදහස් කළේ. සභාව දවසට එක lift එකක් දෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

සභාව දවසටවත්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ළමයින් අසරණයි.

**ගරු නිමල් චන්ද්‍රරත්න**
Hon. Nimal Chandraratna

ගරු සභාපතිතුමා, සමහර මන්ත්‍රීවරු නැහලා කියනවා නවත්වන්නේ නැතුව යන් මල්ලී කියලා .

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්න හරි. ඒක තමයි සිද්ධිය.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, හොඳ යෝජනාව. එක්කෙනාට එක lift එක ගණනේ සවි කළා නම් වැඩේ ලේසියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලි නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එක්කෙනාට එක lift එක ගණනේ සවි කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම කියන්නේ ඒ දරුවන්ගේ, ඒ වැඩ කරන සේවකයාගේ වරදක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. අහිංසක ළමයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මමත් ඒ අත්දැකීම වින්දා. අපේ මන්ත්‍රීවරු නැග්ගාම මන්ත්‍රීවරයා කියනවා, මල්ලී නවතින්නේ නැතිව යන් කියලා. එතකොට නවත්වන්නේ නැතිව lift එක අරගෙන යනවා. Basement එකට එන්නේම නැහැ. ඒකයි හේතුව. නීතියක් දැම්මා නම් කවුරු ආවත් යන්න ඕනෑ විධියට යනවා කියලා එතකොට ගැටලුවක් වෙන්නේ නැහැ. නැතිව සේවකයන්ගේ වරදක් නොවෙයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, හොඳ දේ තමයි වේලාසනින් ඇවිල්ලා පයින් එන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මෙහෙම නේ. අපි දැන් සෙත්සිරිපායේ අවුරුදු ගණනාවක් සිටියා. ඒ සෙත්සිරිපායේ VIP lift එකට ඒ අය කවුරුවක්වත් ගන්නේ නැහැ. සෙත්සිරිපායේ VIP lift එකක් තිබුණා. කිසි කෙනෙක් ඒකට ගන්නේ නැහැ. මන්ත්‍රීවරු විතරයි. ඇමතිවරු විතරයි. ඒකේ එන්නේ ලේකම්වරු විතරයි. මේකේ එහෙම නැහැ. අර කථාවට කියනවා වාගේ ඕනෑ කෙනෙක් මේකේ නැගලා යනවා. ඒ ළමයි අසරණයි. මේකට නීතියක් ක්‍රියාත්මක කරමු. අනික් අයට මේකේ යන්නම බැහැයි කියලා. හැබැයි, බෝඩ් එකක් නම් ගහලා තිබෙනවා. ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු සභාපතිතුමා, ගරු අමාත්‍යවරු, ප්‍රධාන ලේකම්තුමා කියලා ගහලා තිබෙනවා. නමුත් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

සභාපතිතුමා කියලා ගහලත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැද්ද?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, අර හැම හෝල්ට් එකේම නතර කරන එකවත් Basement එකට එන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඒක තමයි. ගහලා නැද්ද? මම හිතන්නේ ගහලා තිබෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගහලා තිබෙනවා. ගහලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගහලා තිබෙනවා. හැබැයි 11 වැනි තට්ටුවේ ගහලා නැහැ. 11 වැනි තට්ටුවේ lift එක හරියේ ගහලා නැහැ. ඔබතුමා හරි. ඒක මහ ඇමැතිතුමාටත් හොඳ නැහැ නේ. ප්‍රධාන ඇමැතිතුමා වශයෙන් එතුමා වැඩ කොටසක් කරනවා නේ.

ඊළඟට මම ඉතාමත්ම ගෞරවයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට ආරාධනා කරනවා.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.59]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි. හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාටත් බොහොම ස්තූතියි. මොකද කලින් යන්න ඕනෑ නිසා වෙලාව ඉල්ලා ගත්තේ. විශේෂයෙන්ම මේ ප්‍රශ්නය ගැන කථා කරන්න කලින් මේ සභාවේ අවධානයට යොමු කළ යුතු කරුණු දෙකක් තිබෙනවා. එකක් තමයි මේ යෝජනාව සාකච්ඡාවට ආපු විධිය මම හිතන්නේ එච්චරම සදාචාරාත්මක නැහැ. ගරු සභාපතිතුමා මූලාසනයේ සිටියා නම් මම වඩාත් කැමැතියි. රීති අත්හිටුවීමේ යෝජනාවට බෙදීමක් ඉල්ලවලා, නම කියලා ඉල්ලාගෙන තමයි මේ රීති අත්හිටුවීමේ යෝජනාව වෙනුවට මේක ගත්තේ. ගන්න යෝජනාව මොකක්ද කියන එක පක්ෂයක් ලෙස අපට කිසිසේත්ම ප්‍රශ්නයක් නැහැ. අපේ වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවද? යසපාල කෝරළගේ නියෝජ්‍ය සභාපතිතුමාගේ යෝජනාවද? කියන එක. නමුත් ගත්ත විධිය පිළිබඳව ඒක එච්චරම සදාචාරාත්මක නැහැ. මොකද ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ අතේ යෝජනාවවත් තිබුණේ නැහැ. එතුමාගේ නම කියලා තමයි, ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා බෙදීමක් තිබෙනවාද කියලා අහලා මේ බෙදීමක් ඉල්ලලා ගත්තේ. ඒක නිසා මම හිතන්නේ ඒක එච්චර සදාචාරාත්මක නැහැ.

දෙවැනි එක මීට කලින් lift එක ගැන ආපු ප්‍රශ්නයේදී - මම උදේ වරුවේදී පාසලක අතිශය වැදගත් ප්‍රශ්නයක් කථා කරන්න නැඟිටිද්දී - මම ඉතාම අමාරුවෙන් වෙලාව ගත්තේ. එතකොට මේ ගරු මන්ත්‍රීවරුත් කිව්වා, සභාපතිතුමාට බාධා කරනවා කියලා චෝදනාවකුත් දැම්මා. lift එක ගැන විනාඩි 10 ක්, 12 ක් පමණ සංවාදය ගියා. ප්‍රශ්නය හරි. ප්‍රශ්නය ගත්තා. ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්නය ඉදිරිපත් කළා. මේ ඕනෑ නැති ඒවාට කාලය ගන්නවා. මේ සභාවේ වටිනා කාලය. පැය හතරයි, පහයි තිබෙන්නේ. අනවශ්‍ය ලෙස අරගෙන අනවශ්‍ය සංවාදවලට යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ යෝජනාව සම්බන්ධයෙන් ගත්තොත් මම හිතන්නේ යෝජනාව පිළිබඳව කිසි ගැටලුවක් නැහැ. විශේෂයෙන්ම දරුවන්ට පා පැදි ලබා දීමේ ප්‍රශ්නය සම්බන්ධව කථා කරද්දී මම හිතන්නේ අවධානයට ගත යුතු කරුණු කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම ලෝකය පුරාම ගත්තොත් පාසල් දරුවන්ගෙන් 5% කට අඩු ප්‍රමාණයක් තමයි පා පැදි යොදාගෙන පාසල් යන්නේ. ලෝකයේ වැඩියෙන්ම පා පැදි පාවිච්චි කරන රටක් තමයි නෙදර්ලන්තය. නෙදර්ලන්තයේ ප්‍රාථමික දරුවොත් 49% ක් පා පැදිවලින් පාසල් යනවා. ප්‍රාථමික දරුවන්. ලෝකයේ පිළිගත් සම්ප්‍රදාය තමයි අඩුම තරමේ පාසල් දරුවෙක් වයස 12 වත් ඉක්මවන්න ඕනෑ, ඔබතුමාගේ යෝජනාවේ තිබෙන්නේ 8 ශ්‍රේනිය කියලා. ඒ අනුව වයස 12 ත්, 13 ත් ඉක්මවපු දරුවෝ. ලෝකය පිළිගත්ත එක තමයි පාසල් දරුවන්ට පා පැදි ලබා දෙනවා නම් ඒ අය අවුරුදු 12 ට වැඩි වෙන්න ඕනෑ කියන එක. පා පැදිවල යනවා නම් කියන එක පිළිබඳව. කෙසේ වෙතත් නෙදර්ලන්තය කියන රටේ ප්‍රාථමික දරුවන් 49% ක් දරුවෝ පා පැදිවලින් පාසල් යනවා. ඒ වාගේම 70% කට වැඩි ප්‍රමාණයක් ද්විතික අංශයේ දරුවන් පා පැදිවලින් පාසල් යනවා. මම මේ නෙදර්ලන්තය උදාහරණයක් ලෙස ගත්තේ වෙන කිසිවක් නිසා නොවෙයි. නෙදර්ලන්තය කියන රට පාරිසරික වශයෙන් ගත්තොත් හොඳ පරිසරයක්

[ ගරු මහින්ද ජයසිංහ ]

තිබෙන, දූෂිත නොවුණු පරිසරයක් තිබෙන රටක්. ඒ වාගේම මාර්ග පද්ධතිය අතිශයින්ම දියුණු රටක්. ඒ වාගේම මාර්ග විනය ගත්තාම අතිශයින්ම විනයක් සහිත රටක්. ඒ වාගේම 2014 එක් මොහොතක මට ලැබුණා මගේ දේශපාලන කටයුත්තක් සඳහා බෙල්ජියමේ සහ නෙදර්ලන්තයේ යන්න. මම ඒ පාරේ යන කොට ඉතාම හොඳින් දැක්කා සුදු ඉරක් තිබෙන කොට, සුදු ඉරක් ළඟ කෙනෙක් හිටගෙන සිටියත් අතදාලා, වනලා නවත්වන්න ඕනෑ නැහැ. කෙනෙක් හිටගෙන සිටියත් වාහන නවත්තලා ඔවුන්ට පාර මාරුවෙන්න ඉඩ දෙන එවැනි විනයක් සහිත රටක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මේ යෝජනාව ගෙනෙද්දී අපේ රට කොහොම රටක්ද? අපි ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කළ යුතු වෙනවා. අපේ රට කොහොම රටක්ද? එහෙම විනයක් තිබෙනවාද? පාරේ එහෙම විනයක් තිබෙනවාද? පාර පනින්න අපට එහෙම ඉඩක් තිබෙනවාද? මම හිතන්නේ අපි ඇති තරම් රූප රාමුවල දැකලා තිබෙනවා. පාරවල් පනිද්දී දරුවන්ව යට කරගෙන ගියපු ඒවා. වාහනවලට දරුවන් යට කරගෙන යනවා. ඒ නිසා අපේ රටේ ඉතාමත්ම අනාරක්ෂිත මාර්ග පද්ධතියක් තමයි තිබෙන්නේ. ඉතාමත් අනාරක්ෂිත එකක් තමයි තිබෙන්නේ. විශේෂයෙන්ම පාසල් දරුවන් පා පැදිවලින් යන්න කියන යෝජනාව ගෙනෙද්දී. අපි කොහොමද පාරේ විනයක් අපේක්ෂා කරන්නේ, රටේ පාලකයින්ගේ විනයක් නැති වෙන කොට. පාලකයින්ගේ විනය අපි දැක්කා. පසුගිය දේශපාලන කුමන්ත්‍රණය සිදු කරලා ඔක්තෝබර් 26 වැනිදා. ඉන්පසුව පාර්ලිමේන්තුව ඇතුළේ සිදු වුණු ක්‍රියාවලිය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, රටට ආදර්ශයක් දෙන්න ඕනෑ පිරිස්, රටට ආදර්ශයක් දෙන්න ඕනෑ කණ්ඩායම් මන්ත්‍රීවරු, ඇමැතිවරු කොහොමද හැසිරුණේ කියලා අපි දැක්කා. පුටුවලින් ගහ ගත්ත විදිය දැක්කා. එවැනි විනය පිරිහුණු රටක්. මුදුණේ සිට. මිරිස් කුඩු ගහගත්ත ඒවා. මිරිස් කුඩු නොවෙයි නේ. අර පාට වතුර නේ. අර එස්.බී. දිසානායකට අනුව කොකාකෝලා නේ දිය කරලා ගැහුවේ. ඩයි දාලා. එවැනි රටක පාරේ විනයක් අපට අපේක්ෂා කරන්න බැහැ. අපට හොඳ අත්දැකීම් තිබෙනවා. අපි කාටත් අත්දැකීම් තිබෙනවා. අපි පාරක පුංචි වැරැද්දක් වුණොත් එහෙම ගහ මරා ගන්නවා. ගෙදර යනතුරු බැණ බැණ යනවා. (බාධා කිරීමක්) බණින්නේ කාටද කියලා දන්නවා නේ? අපේ රටේ ආතතියට පත් වුණු කොටසක් තමයි ඉන්නේ. ඒ අතරේ මාර්ගයට බැස්සාම ඒ ආතතියෙන් පත් වුණු කෙනා තමයි මාර්ගයේ වාහන එළවන්නේ. ඔහු හොඳ පියවි සිහියෙන් නොවෙයි මාර්ගයේ ගමන් කරන්නේ. ඒ නිසා මේ යෝජනාවත් එක්ක එවැනි පැත්තක් තිබෙනවා අපට අවධාය යොමු කළ යුතු. ඒ නිසා දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුයි.

ඒ විතරක් නොවෙයි. දූෂිත පරිසරය. අපේ රටේ පරිසරය අතිශයින්ම දූෂිතභාවයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි පා පැදියක් ලබා දෙන කොට ඔක්සි හිරෝ එකක් වාගේ එකකුත් ලබා දෙන්න වෙයි. ඔක්සි හිරෝ එකක් වාගේ. දරුවන්ට ගන්න බැහැ නේ. පා පැදිය දෙන්නේ සල්ලි දීලා ගන්න බැරි නිසා නේ. එහෙමනම් ඔක්සි හිරෝ එකක වාගේ එකක් දෙන්න වෙනවා මේ මාර්ගවල දරුවෝ පා පැදිවලින් ගමන් කරනවා නම්. මොකද, ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කරගන්න නම් එවැනි දෙයකුත් අනුගමනය කළ යුතු වෙනවා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම ඔබතුමා යෝජනා කරලා තිබෙනවා වාගේම මේක සෞඛ්‍යයටත් හොඳයි. දැන් අපේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් නැහැ. අපේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් ඉතිහාසයේ තිබුණා. අද වන විට ඒ ක්‍රීඩා සංස්කෘතිය සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා තිබෙන්නේ. අපේ දරු පැටව් ටිකත් මේ අධ්‍යාපනයේ දැවැන්ත තරගයට යොමු වෙලා, ඔවුන් අද ක්‍රීඩාවෙන් ඈත් වෙලා තිබෙන්නේ. ඈත් කරලා තිබෙන්නේ. දෙමව්පියන් ක්‍රීඩාවට දරුවන් යොමු කරන්නේ නැහැ. දරුවන් ක්‍රීඩාවට යොමු කරන කාලයත් පොතට පතට යොමු කරන්න තමයි උත්සාහ කරමින් තිබෙන්නේ. බැට් එකක් අතේ තියාගෙන ඉන්න දරුවාටත් අම්මා තරවටු කරන්නේ, බැට් එක වනලා උඹට කන්න හම්බ වෙයි. උඹේ බඩ පිරෙයි. ඒ නිසා එහෙම තල්ලු කරන වට පිටාවක් ඇතුළේ මේ තුළින් අපට ක්‍රීඩා සංස්කෘතියකුත් හදාගන්න පුළුවන්. අපි දන්නවා, ප්‍රංශය වාගේ රටක් ගත්තොත් එහෙම ප්‍රංශ සවාරිය තිබෙනවා. ප්‍රංශ සවාරිය දවස් 30 ක් විතර යනවා. ඒ දවස් 30 පුරාවටම ඒ මුළු රටේම ක්‍රීඩා සැණකෙළියක්. ක්‍රීඩා සැණකෙළියක් බවට රට පත් වෙනවා. නමුත් අපේ රටේ එහෙම සංස්කෘතියක් නැහැ. අපේ රටේ ඉතිහාසයේ තිබුණා. වෙල් ඉපණැල්ලේ සෙල්ලම් කරපු කාලය. අපට කුඩා කාලයේ ඒවා මතකයි. අපට හම්බ වෙන හම්බ වෙන දෙයින් අපි බෝල ගහනවා.

සෙල්ලම් කරනවා. එහෙම සංස්කෘතියක් තිබුණා. මේ තරගකාරී අධ්‍යාපන රටාව ඇතුළේ ඒක සම්පූර්ණයෙන්ම ගිලිහිලා තිබෙනවා. ඒ නිසා ඒ පැත්තෙනුත් ගත්තොත් මේ යෝජනාවේ වටිනාකමක් තිබෙනවා, මේ දරුවන්ගේ සෞඛ්‍ය නඟා සිටුවීම පැත්තෙන් ගත්තත්.

විශේෂයෙන්ම අධ්‍යාපනයේ ගැටලු කීපයකුත් මෙහිදී මතු වුණා. ඒක පිළිබඳවත් යම් අදහසක් එකතු කරන්න මම කැමැතියි. මොකද, සමහරුන්ගේ පැත්තෙන් අදහස් දක්වද්දී විශේෂයෙන්ම මේ ගුරු හිඟය සම්බන්ධයෙන් සාකච්ඡාවක් මතු වුණා. මම හිතන්නේ ඔබතුමාගේ පෞද්ගලික ප්‍රකාශය කරද්දීත් ඔබතුමාගේ පැත්තෙනුත් මේ කාරණය මතු කළා. වසර තුනක් විද්‍යා පීඨ සඳහා ගුරු සිසුන් බඳවාගෙන නැහැ. සාමාන්‍යයෙන් වසරකට 3500 ක් වාගේ බඳවා ගන්නේ. ඒ කියන්නේ විද්‍යාපීඨවලට ඇතුළත් වෙන්න බලාගෙන 10,500 ක් විතර එළියේ ඉන්නවා. විද්‍යා පීඨය තමයි අපේ රටේ ගුරුවරු බිහි කරන හොඳම තෝතැන්න. ගුරුවරයා, පරිපාලන ගුරුවරයෙක් බවට පත් කරලා එළියට දාන තැන තමයි විද්‍යා පීඨය. නමුත් මේ වර්තමාන ආණ්ඩුව වසර තුනක් තිස්සේ විද්‍යාපීඨ සඳහා ගුරු සිසුන්ව බඳවා ගන්න අසමත් වෙලා තිබෙනවා. ඒ අතරේ ගුරු හිඟයක් තිබෙනවා. පාසල්වල විශාල ලෙස ගුරු හිඟයක් තිබෙනවා. අපේ පළාතේ සමහර දුෂ්කර පාසල්වල විශාල වශයෙන් ගුරු හිඟයක් තිබෙනවා. ඒ නිසා එවැනි වටපිටාවක් තුළ ඒ කටයුතු කරලා නැහැ. ළපාහොපා - ළඟම පාසල හොඳම පාසල -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අරලියගහ මන්දිරයට ගිහින් ඔබතුමාගේ මතය, ඔබතුමන්ලාගේ නායකයාට, අගමැතිතුමාට කියන්න, කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊට වඩා මහින්ද රාජපක්ෂට කිව්වා නම් රනිල් වික්‍රමසිංහ ඊට වඩා ඒක කරනවා. මොකද රනිල් වික්‍රමසිංහ තමයි මේ කියන විදියට - මහින්ද රාජපක්ෂ, ගෝඨාභය, බැසිල්, යෝෂිත, නාමල්, සිරිලිය සවිය. මේ ඔක්කෝම බේරගෙන ඉන්නේ රනිල් වික්‍රමසිංහ තමයි. ඉතින් අපේ අනුර දිසානායක සහෝදරයා කියනවාට වඩා මහින්ද රාජපක්ෂ කිව්වා නම් -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපට එහෙම බේරගන්න දෙයක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මහින්ද රාජපක්ෂ කිව්වා නම්, මේ ඔක්කොම බේරගන්නවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපේ හොර වැඩ නැහැ. අපි මිනී මරලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇයි නැත්තේ? තාජුඩීන් මැරුවේ කවුද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි මිනී මරලා නැහැ. අපි හොරකම් කරලා නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තාජුඩීන් මැරුවේ කවුද? ලසන්ත මැරුවේ කවුද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා අණ්ඩු පිහිටුවලා තමයි මිනී මැරුවේ. එක්සත් ජාතික පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි තරගෙට මිනී මැරුවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තාජුඩීන් මැරුවේ කවුද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා මොනවද කළේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

යන්න මහත්තයෝ යන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

විජේවීරව මැරුවා එක්සත් ජාතික පක්ෂය. තමුන්නාන්සේලා මොකක්ද කළේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රදීප් එක්නැලිගොඩ කෝ. ලසන්ත කෝ. තාජුඩීන් කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා පත් කර ගත්තේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හතර දෙනයි නේ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

තාජුඩීන්ගේ නඩු තීන්දුව දෙන්න පුළුවන්ද ඔයාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

නඩු තීන්දුව ගැන කථා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නියෝජ්‍ය සභාපතිතුමා මේ ඔබතුමාගේ යෝජනාවට සළකන හැටි ජේනවද? මේ ඔබතුමාගේ යෝජනාවට සළකන හැටි. වැඩක් නැති ඒවා ඇදලා අරගෙන. ලැජ්ජයි. ලැජ්ජයි. මොකක්ද මේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ලැජ්ජයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වන්න. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

මේ රටේ වුණු මිනීමැරුම් ඔක්කොම මේ අය දන්නවා. ඇයි අප්පා මේ අයව තියාගෙන ඉන්නේ? සියලුදෙනාම සාක්ෂිවලට කැඳවලා මේවා විසඳලා දැම්මා නම් ඉවරයි නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නෙදර්ලන්තයේ ජේ.වී.පී. නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගෙන් අහගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කරන්න එපා. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යසස් මන්ත්‍රීතුමාට කියන්න පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගෙන් අහගන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරිද? ඉවරද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරිද? අපි ඔය තප්පුලන අයට තප්පුලන්න ඉඩ හැරලා, පොඩ්ඩක් නිහඬව ඉඳලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න. බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩි ආතල් එකක් ගන්න දෙන්න එපැයි. මෙහෙම හරි පොඩි ආතල් එකක් ගන්න. දැන් ළ.පා.හො.පා. තිබෙනවා. ළඟම පාසල හොඳම පාසල. හැබැයි අපි උදේ සාකච්ඡා කළා වාගේ අද වන විටත් පාසල්වලට යන්න විධියක් නැතිව, පාසල්වලට ඇතුළත් වෙන්න විධියක් නැතිව. විශාල දරුවන් පිරිසක් ඉන්නවා, ගේ ඉදිරිපිට ඉස්කෝලේ තියාගෙන දරුවාට යන්න පාසලක් අහිමි වෙලා තිබෙනවා. දහස් ගණනක් දරුවන් පසුගිය දිනවල පාසල්වලට ඇතුළත් කර ගත්තා. නමුත් ළමුන්ට පාසලක් නැතිව අදටත් තිබෙනවා. මේකේ ප්‍රධානම හේතුව වෙන මොකක්වත් නොවෙයි. සීතල කාමරවල ඉඳලා මේ හදන චක්‍රලේඛ. සීතල කාමරවල ඉඳලා චක්‍රලේඛ හදනවා. බිමේ ප්‍රායෝගික යථාර්ථය තේරුම් ගන්නේ නැතිව. බිමේ තත්ත්වයන් තේරුම් ගන්නේ නැතිව. බිමේ දරුවාට පාසලක් දෙන්නේ කොහොමද කියන එක නොවෙයි. මේ ගහපු හැම චක්‍රලේඛයක්ම, 1 වැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය කියලා කියන්නේ වෙන මොකක්වත් නොවෙයි. දරුවන්ට ඉස්කෝලයක් කපන්නේ කොහොමද කියලා ගහන චක්‍රලේඛයක්. ඒක මේ දරුවන්ට ඉස්කෝල දෙන චක්‍රලේඛයක් නොවෙයි. දරුවන්ට පාසලක් අහිමි කිරීම සඳහා ගහන චක්‍රලේඛයක් මිසක් දරුවන්ට පාසලක් ලබා දෙන චක්‍රලේඛයක් නොවෙයි. ඒ වාගේම තමයි මේ අකිල විරාජ් මහත්මයාගේ සමහර වික්‍රමයන් ටිකකුත් කථා කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ කාලයේ ජේ.වී.පී. එකෙන් ගිනි තියපුවා, ගණන් බලන්නත් බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කෑ නොගහා ඉන්න කෝ. මොකක්ද මේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය ටික කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ කාලයේ ඉස්කෝල ගිණි තියපුවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

බස් ඩිපෝවල්, කෘෂිකර්ම අමාත්‍යාංශ, පුස්තකාල -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි යන්නද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් අපි යන්නද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි එළියට යන්නද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්රීතුමා, හොඳ විග්‍රහයක් කරන්නේ. මේ සමාජයේ අවශ්‍ය දෙයක් මේ කථා කරන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ඔබතුමන්ලා කථා කරගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ නිසා බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මගේ කථාවත් නවත්වනවා. මම සභාවෙන් පිට වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. නැහැ. ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකක්ද මේ විහිළුව?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කිරි පණු ගායට බෙහෙත් දෙන වෙද මහත්තයෙක් අපේ ගමේ ඉන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සමාජයේ ප්‍රශ්නයක් එතුමා මේ කථා කරන්නේ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, මොනවද කියනවා. පැහැදිලි නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෙහෙමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සමහරු තමන්ට නැති බලයක් අරුඬ කරගෙන, ව්‍යවස්ථාවේ නැති දේවල් පාවිච්චි කරගෙන, මේ රටේ මූලික නීතිය කඩලා,

ව්‍යවස්ථාව කඩලා, දේශපාලන කුමන්ත්‍රණයක් කරලා ඒ කුමන්ත්‍රණය පරාද වුණාට පස්සේ, ඒ වේදනාවෙන් කෙඳිරි ගානවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ වේදනාවෙන් සුසුම් හෙළනවා. ඉතින් අපි මොකද කරන්නේ? බලය අල්ල ගන්න බැරි වෙලා, ඒක අසාර්ථක වෙලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා යෝජනාවට කථා කරන්න. ඔබතුමා හොඳ කථාවක් කරගෙන ආවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ වේදනාවාවෙන් කෙඳිරිගානවා. ඉතින් මොකද කරන්නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳ කථාවක් කරගෙන ආවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාවට අදාළව කථා කරන්න කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒවට දෙන්න බෙහෙත් අපට නැහැ. ඒවාට බෙහෙත් නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාවට අදාළව කථා කරන්න කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලා කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කථා කරන්න දෙන්නේ නැහැ නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

යෝජනාවට අදාළව කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපි කථා කරගෙන ආවා. ඔබතුමන්ලා නේ බාධා කරන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මරු විකලෙන් දඟලන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ මරුවිකල් වෙලා, ඔළුව අවුල් වෙලා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අරයා කඩේ යනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා තමයි කරදර කරන්නේ.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

පක්ෂ පාට බේදයකින් තොරව හොඳ කථාවක් කරගෙන ආවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. හරි. ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර ළඟ ඉන්න කිදෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට කරදර කරන්න එපා කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් මේ වන කොට මේ අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂයෙන් බරපතළ ගැටලු තිබෙනවා. හැබැයි පාසල ළඟම දරුවාට ඉස්කෝලයක් නැති වුණාට, ඒ අයගේ දරුවන්ට ඉස්කෝල ලැබෙනවා. මට ඉතා විශ්වාස කටයුතු ආරංචි මාර්ගවලින් තොරතුරු තිබෙනවා. මම ගරු සංගමයේ ලේකම්වරයා විධියට තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මම මේ සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලුවා. 2015 ජනවාරි 08 වැනිදායින් පසුව අකිල විරාජ් අධ්‍යාපන ඇමතිතුමාගේ කාලයේ පාසල්වලට, විශේෂයෙන්ම ජනප්‍රිය පාසල්වලට ජාතික පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේ තොරතුරු මට දෙන්න කියලා. තවම ලැබිලා නැහැ. ඒ විතරක් නොවෙයි. මම තොරතුරු ඉල්ලුවා ඔක්තෝබර් මස 26 වැනිදා කුමන්ත්‍රණයෙන් පස්සේ, කුමන්ත්‍රණකාරී ලෙස පත් වුණු අධ්‍යාපන ඇමැතිවරයාගේ ළමයි දාපු ඒවා. ඒ කාලයේත් දාලා තිබෙනවා. අධ්‍යාපන ඇමතිකමේ සති දෙකයිද කොහේද සිටියේ. ඒ කාලයේත් දාලා තිබෙනවා. ගම්පහ ප්‍රසිද්ධ පිරිමි පාසලක ළමුන් දාපු බවට මට ඊයේ දවසේ තොරතුරු ලැබුණා. ඒ නිසා එහෙම දාලා තිබෙනවා. එහෙම තමයි මේ ළ.පා.හො.පා. නේද? ඒක විහිළුවක් බවට අද පත් වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අද වන විට ආණ්ඩුවෙන් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා, ටියුෂන් තහනම් කරන්න. අපි පක්ෂයක් ලෙස ටියුෂන්වලට එකඟ නැහැ. හැබැයි අද වන විට ටියුෂන් එක කියන්නේ යථාර්ථයක් බවට පත් වෙලා තිබෙන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි. පාසල් අධ්‍යාපනය අද බිඳ වැටීමේ ප්‍රතිඵලයක් ලෙසයි. පාසල් අධ්‍යාපානය අද බරපතළ ලෙස බිඳ වට්ටලා තිබෙනවා. අද ඒක හිතාමතා බිඳ වට්ටලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් ලෙස අද ටියුෂන් එක උඩට ඇවිල්ලා තිබෙනවා. දැන් වන විට පාසල් යන වයසේ දරුවන්ට ටියුෂන් තහනම් කරන චක්‍රලේඛ නිකුත් කරන්න කටයුතු කරලා තිබෙනවා. යෝජනා කරලා තිබෙනවා. අපි හිතනවා ඒක ඒ තරම් සුවදායී එකක් නොවෙයි. එහෙමනම් ටියුෂන් එක නතර කරන්න, තහනම් කරන්න නොවෙයි ඕනෑ. පෙර පැවැති තත්ත්වයට පාසල් අධ්‍යාපනය නඟාසිටුවලා, 60,70,80 දශකයේ ඒ මට්ටමට නැවත වතාවක් පාසල් අධ්‍යාපනය නඟාසිටුවන්න. උපකාර පන්ති, ටියුෂන් එක ඉබේ අහෝසි වෙලා යාවි. මොකද මේ දෙමව්පියන් කැමැත්තෙන් හරි, පුළුවන්කමකට හරි නොවෙයි ටියුෂන් එකට දරුවන් යවන්නේ. ඒ නිසා එවැනි ප්‍රශ්න ගණනාවක් හමුවේ තමයි අද මේ අධ්‍යාපන ක්‍රමය තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. තව විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. මේ සියල්ල ගැන සාකච්ඡා කරන්න මෙය අවස්ථාව නොවෙයි. කෙසේ වෙතත් ඔබතුමාගේ යෝජනාව කලෝචිතයි. උචිතයි. නමුත් මම අර කියපු ගැටලු ටික. ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නය. දූෂිත පරිසරයක තමයි දරුවන්ට පා පැදියක යන්න වෙන්නේ. ඒ පිළිබඳ ප්‍රශ්න. ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුයි කියන කාරණයත් අවධාරණය කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.17]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාවට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ මේ යෝජනාව හොඳයි. අර ගම්වල වැසීගෙන යන කුඩා පාසල්වල දරුවන්ට පා පැදියක් දෙනවා කිව්වොත් මම හිතන්නේ ඒ පාසල්වලට යන ප්‍රවණතාවය වැඩි වෙයි. හැබැයි පා පැදියක් රුපියල් 15,000 ක්, 20,000 ක් අතර වෙනවා. ප්‍රායෝගික වෙන්නේ නැහැ. මම යෝජනා කරන්නේ අපේ ජා-ඇළ, කටාන පැත්තේ ජපානයේ පාවිච්චි කරපු පා පැදි ගේනවා. ජපානයේ රුපියල් 1000 යි. මම හිතන්නේ මෙහේ ඩියුටි ගහලා ගෙනාවත් 1000 යි. රුපියල් 3000 ක් වෙද්දී හොඳ ජපන් බයිසිකලයක් ගේන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙයා deal එකක් දාන්න හදන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ක්‍රමවේදයක් තිබෙනවා නම් අපේ කර්මාන්ත අමාත්‍යාංශය හරහා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රසන්න මෙතුමා ඩීල් එකක් දාන්න හදන්නේ. හරි හරි කමක් නැහැ. ඔහොම යන්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපේ කර්මාන්ත අමාත්‍යාංශය හරහා රුපියල් 4000 කට, 5000 කට හොඳ බයිසිකලයක් ගේන්න පුළුවන්.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

රුපියල් 3000 යේ එක 4000, 5000 වුණා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

යසස් මන්ත්‍රීතුමා, කොහොමද ටිකිරි මොළේ. නියමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කර්මාන්ත අමාත්‍යාංශය හරහා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔන්න අල්ල ගන්න පුළුවන් නේ වැඩේට.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මම දන්නේ නැහැ කොහොමද කියලා. කාව හරි අල්ලගෙන මම හිතන්නේ රුපියල් හාර පන්දාහකට ගන්න පුළුවන්. කර්මාන්ත අමාත්‍යාංශයෙන් හොඳ බයිසිකලයක් දෙන්න පුළුවන්. බයිසිකලයක් මේ වර්තමානයේ කඩෙන් ගන්න රුපියල් 15,000 ක්, 20,000 ක් දීලා ගන්න එකට වඩා වටිනවා. ශක්තිමත්. සොයලා බලන්න. එහෙම වුණොත් එහෙම විශාල ප්‍රමාණයක් දෙන්න පුළුවන් වෙයි. ඒක එකක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කථා කළා ළපාහොපා ගැන. ළඟම පාසල හොඳම පාසල කියලා වර්තමාන අධ්‍යාපන ඇමතිතුමා ලොකු මේවා එකක් කළා කියලා. මම හිතන්නේ අපි හැම අවුරුද්දේම, අපේ මේ ගරු මහ ඇමතිතුමා නොසිටින්න ඒ ළපාහොපා පාසල්වලට දීපු සල්ලි හම්බ වුණෙත් නැහැ. ඒ වැඩේ වුණෙත් නැහැ. මෙතුමාගේ ටිකිරි මොළේ පාවිච්චි කරලා ඒ පාසල් ටික හදලා ඉවර කර ගත්තේ නැත්නම් තවම දීපු සල්ලියකුත් නැහැ. මේ වෙද්දී මධ්‍යම රජයෙන් පළාත් සභාවේ පාසල්වලට මිලියන 7000 ක් දෙන්න තිබෙනවා. මුදල් හම්බ වුණේ නැහැ. ඒ නිසා ළ.පා.හො.පා. ගැන කථා කරන්න අයිතියක් නැහැ, කියෙව්වාට.

ඒ වාගේම, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ගිහිල්ලා නේ. එතුමා කිව්වා වාගේ ඕක ගිහිල්ලා කිව්වා නම් එහෙම අර කඩේ ගිය අගමැතිතුමාට - මොකද ඒ අයගේ නායකයාව මරපු රනිල් වික්‍රමසිංහ මහත්මයලාගේ කණ්ඩායම බලයට ගේන්න තමයි මේ අය පසුගිය දවස්වල කුමන්ත්‍රණයක් කියලා කෑ ගැහුවේ. ඒ කුමන්ත්‍රණය දිනුවා කියලා අත උස්සගෙන කෑ ගහගෙන උසාවියෙන් එළියට එනවා. හැබැයි මේ අගමැති වෙන්නේ, තමන්ගේ නායකයා මරපු කණ්ඩායමේ කෙනෙක්. ඒකට තමයි ඔය කඩේ ගියේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සම්බන්ධව කථා කරලා වැඩක් නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා. වෙන කවුරුවත් නොවෙයි. මම නැවත කථා මතක් කරනවා. ඔබතුමාගේ යෝජනාව හොඳයි. එය ක්‍රියාත්මක කිරීමට ඇමති මණ්ඩලය වෙහෙස ගන්නය කියලා මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මට දාන්න එපා. අධ්‍යාපන ඇමතිතුමා ඉන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එහෙම කියලා බැහැ. මහ ඇමතිතුමා තමයි ඇමති මණ්ඩලය හරහා මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ. අර ජපානයෙන් ගේන බයිසකලයක් ගේන්න පුළුවන් නම් වැඩි ප්‍රමාණයක් දෙන්න පුළුවන් කියන අදහස ඉදිරිපත් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.21]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ගෙනෙන ලද යෝජනාවට එකඟව කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ස්තුතිවන්ත වෙනවා. මම හිතනවා මේ යෝජනාව කාලෝචිතයි. මේකේදී කොළඹ දිස්ත්‍රික්කයට වැඩිය මම හිතනවා කළුතර පැත්තේ දුෂ්කර ගම්මාන තිබෙනවා. ගම්පහ පැත්තෙත් කුරුණෑගල පැත්තට වෙන්න දුෂ්කර ගම්මාන තිබෙනවා. මේවායේ ජීවත්වන දරුවන්ට මෙයින් නියම ප්‍රයෝජනය ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. අපේ ගරු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් දැන් අදහස් දැක් වූවා. එක මන්ත්‍රීවරයෙක් ප්‍රකාශය කළා, පාරේ යන කොට තිබෙන අවදානම ගැන. ඔබතුමා යන්න එපා. අහගෙන ඉන්න. මගේ කථාව ඇතුළේ වැදගත් කාරණාවක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මහ ඇමතිතුමා අහනවා, කොළඹ දුෂ්කර නැද්ද කියලා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ මාතෘකාවට, මේ බයිසිකල් දීම සම්බන්ධව කිව්වේ. අපේ පළාතේ නොදියුණු පැති තිබෙනවා. පාසල් ගරාගෙන වැටිලා වැහීගෙන යන තැන් තිබෙනවා. නමුත් ඒකට අදාළව නොවෙයි. ඔබතුමාගේ මේ යෝජනාවත් එක්ක අල්ලලා මම මේ බයිසිකලය සම්බන්ධවයි කථා කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර ගරු මන්ත්‍රීවරු අදහස් දැක් වූවා පරිසර හිතකාමී ප්‍රශ්නයක් ගැන. ආරක්ෂාව ගැන කිව්වා. ඇත්ත. ලෝකයේ බොහෝ රටවල්වල දරුවන් බයිසිකල්වල යනවා දැන් අඩුයි. ඉස්සර අපි පරණ Film එහෙම බැලුවාම -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අධ්‍යාපන විෂය ගැන තමයි කථා කරන්නේ. අපි මේ විෂයය ගැන කථා කරන කොට හැම මන්ත්‍රීවරයෙක්ම අධ්‍යාපනයට තිබෙන ලැදිකම නිසා කථා කරන්නේ. අධ්‍යාපන ඇමතිතුමාට එන්න කියලා කියන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු මන්ත්‍රීතුමා, මේක හැප්පෙන්න යන්න එපා. අධ්‍යාපන ඇමතිතුමාගේ විතරක් නොවෙයි. මම ගිය සභා වාරයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා යෝජනාවක් ගෙනාවා. ඒකට ඇමතිවරු කවුරුත් සිටියේ නැහැ. මීට වැඩිය කාලෝචිත වටිනා යෝජනාවක් ගෙනාවේ. ඒවා ගැන කථා කරන්න එපා. මේකත් හුඹස් පෙට්ටියට යයි කියලා අපේ කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ වාගේ වෙයිද දන්නේ නැහැ. අපි උත්සාහයක් ගමු. අපි බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් මේක කාලෝචිතයි. යෝජනාව වටිනවා. අපි ඒකට උත්සාහ කරමු. ඒකේ ප්‍රතිඵලයක් යම්කිසි විධියකින් හම්බ වෙනවා නම් අපට ලැබෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝකයේ දියුණු රටවල, අපි Film එහෙම බැලුවාම දකින්න ලැබෙනවා අවුරුදු 20, 30 පරණ Film එහෙම, ඉංග්‍රීසි Films අරවා මේවා බැලුවාම අපට දකින්න ලැබෙනවා, බයිසිකල්වලින් ඉස්කෝලේ යනවා. බයිසිකලෙන් තමයි ගොඩක් වැඩ කළේ. දැන් ලෝකය දියුණු වෙලා, පා පැදි භාවිතා කරන යුගය අවසන් වෙලා තිබෙනවා. හැබැයි සමහර තැන්වල සුළුවෙන් පාවිච්චි වන තැන් ජපානයේ එහෙම තිබෙනවා. ජපානයේ එහෙම සුළුවෙන් පාවිච්චි වන අවස්ථාවන් තිබෙනවා. මම මේ කියන්න උත්සාහ ගන්නේ ලෝකයේ බොහෝ රටවල්, යුරෝපයේ, ඇමරිකාවේ, ජපානයේ, ප්‍රංශයේ අරහේ මෙහේ ගත්තාම රජයෙන් - ඒකයි දියුණු රටවල වෙනස. රජයෙන් සෑම පාසල් සිසු සිසුවියකටම රාජ්‍ය අනුග්‍රහයෙන්ම ගමනා ගමන පහසුකම් ඇති කරලා දීලා තිබෙනවා. අපට ඒකත් Film වලින් දකින්න පුළුවවන්. ප්‍රශ්නයක් ඇති වුණාම News වලින් දකින්න පුළුවන්. ඒක හොඳටම සොයා ගන්න පුළුවන්. කහපාට ගහලා තමයි - ලෝකයේ පාසල් සිසුන්ට පොදු පාටක් තිබෙනවා, ඒක කහපාටින් තමයි ලෝකයේම තිබෙන්නේ. ඒත් තවම දරුවන් ගෙනියන Private වැන් තියෙන අයට පාටක් නියම කරගන්න බැරි වුණු රටක අපි ඉන්නේ කියන එක මම මේ අවස්ථාවේ මේ සමඟම මතක් කරනවා. ලෝකයේ ඒ කහපාට වාහනයක් දැක්කාම වාහන නවත්තලා ඉඩ දෙන තත්තවයක්, ඒක අපට Film එකක් බැලුවත් බලාගන්න

පුළුවන්. ප්‍රශ්නයක් වුණාම News එකකදීත් බලන්න පුළුවන්. ඒ වාගේ කාලයක් තමයි තිබෙන්නේ. මේකේ වටිනාකම ගම්වල ඉන්න දරුවන්ට ලැබෙයි. මේක බස්නාහිර පළාතේ ඔය මම කිව්ව දිස්ත්‍රික්ක දෙකේ කෙරවළවල්වල ඉන්න දරුවන් මේකේ ප්‍රයෝජනය ගනියි කියලා මම විශ්වාස කරනවා. මේ දේ අපි කරලා දෙන්නත් උත්සාහ ගන්නවා. හැබැයි මම හිතන්නේ අනික් පළාත් සභාවල්වලට මේක ඉතාම වැදගත් වෙන යෝජනාවක් වශයෙන් තමයි මම දකින්නේ. මට මතක් වෙනවා. අපි එක එක වැඩවලට දුෂ්කර ගම්මානවල ඉන්න කොට දරුවන් පාසලට යන්න පයින් ඇවිදගෙන යනවා. ඒ වාගේ යුගයක් තිබෙනවා.

යසපාල කෝරළගේ මැතිතුමනි, ඔබතුමාගේ යෝජනාවේදී මේක ක්‍රියාත්මක වෙනවා නම් අපි මේකට ක්‍රමවේද ටිකක් දාගන්න ඕනෑ. ඒ මොකද, මේකට ක්‍රමවේදයක් අවශ්‍යයි. අපි මේ බයිසිකලයට පාටක් වෙන් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවෙන් අපි මේ යෝජනාව ක්‍රියාත්මක කරමු. කරන වෙලාවට අනිවාර්යයෙන් මේ බයිසකලයට කහපාට - ලෝකයේ සමස්ත පාටක් තිබෙනවා නම් ඒ පාට යොදවා ගනිමු කියන එක මම මේ සභාවට යෝජනාවක් වශයෙන් මේ යෝජනාවත් එක්ක ඒ යෝජනාවත් ඇතුළත් කරනවා. එතකොට තව ප්‍රශ්නයක් ඇති වෙනවා. මේ බයිසිකලය පැදගෙන යන්නේ දුප්පත්, අහිංසක දරුවෙක්. මේ දරුවාගේ බයිසකලේ තිබෙන කෑළි ගෙවෙනවා. Chain Spokes යනවා. අපිත් පොඩි කාලයේ බයිසිකල් පැදලා තිබෙනවා නේ. බ්‍රේක් පලු ගෙවෙනවා. මේ ළමයින් බසිකලේ ක්‍රමවේදය දන්නෙත් නැහැ නේ. බයිසිකලය විනෝදෙටත් පදිනවා නේ. අපි බයිසිකලේ ළමයින්ට නේ දෙන්නේ. ඒකටත් ප්‍රතිපාදන අපේ පළාත් සභාවෙන් වෙන් වෙන්න ඕනෑය කියන එක මම ඔබතුමාට මේ හරහා යෝජනා කරනවා. මොකද එහෙම නැති වුණොත් අපි මේ දෙන බයිසිකලය මාස තුනක්, හයක් හෝ අටක් - අපට දැන් මේ යෝජනාව හරහා හම්බ වෙන්නේ Chinese බයිසිකලයක් නේ. කොහෙන් හරි අනුමත වෙලා එන්නේ Chinese බයිසිකල්.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

තව අවුරුදු 15 කින් විතර හම්බ වෙයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

කමක් නැහැ. අපි මොනවා හරි දැන් කථා කරමු කෝ යෝජනාවට අදාළව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේකට යම්කිසි ප්‍රතිපාදනයක් දාගන්න වෙනවා, මේ බයිසිකලේ නඩත්තුව සඳහා තව වර්ෂයකින් දෙකකින් ඒ බයිසිකලය තිබෙන අයට දෙන්න. අනික් එක අපි තව එකක් හදන්න ඕනෑ. මේ බයිසිකලය එම නිවසේ දරුවා පාවිච්චි කරනවාද නැද්ද කියන එක සොයා බලන්න ක්‍රමවේදවල් කිහිපයක් අපි ඇතුළත් කරගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙය ඉතාම හොඳ යෝජනාවක්. ඒ වාගේම මෙහි ගැටලුවක් තිබෙනවා. ආරක්ෂාව ගැන -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

පක්ෂයේ අයට දෙයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නැහැ. නැහැ. ඒක වෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා, මම කවදාවක්වත් එතැන ඉන්න මන්ත්‍රී කෙනෙක් නොවෙයි. පාට බේදයෙන් නොවෙයි මම හැමදාම මගේ මන්ත්‍රීකමත් එක්ක වැඩ කළේ. මගේ පළාත් සභා මුදල්වලින් මම ගමේ ප්‍රතිපාදනයක් බෙදන කොට, ගම්වල මිනිස්සුන්ගෙන් ඇවිල්ලා අහන්න. ඔබතුමන්ලාගේ පාක්ෂිකයන් වුණත් ඇවිල්ලා උදව්වක් ඉල්ලුවොත් මම දීලා තිබෙනවා. සිමෙන්ති ඉල්ලුවොත්, මැෂිමක් ඉල්ලුවොත්, මොනවා හරි ඉල්ලුවොත් මම දීලා තිබෙනවා. මම එහෙමම යන මනුෂ්‍යයෙක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක තමයි අපට කෙළවුණු තැන. මේ අදහස් කියන එක මම සඳහන් කරනවා. මේ ආරක්ෂාව ගැනත් බලන්නත් ඕනෑ. මොකද, මේ පාට ඉතා වැදගත්. පාටක් අපි තීරණය කළොත් මොකද වෙන්නේ? මිනිස්සු දැන ගනියි මේ යන්නේ පාසල් සිසුවෙක්. අවේලාවේ යනවා නම් මේ පාසල් ළමයාට දුන්නු බයිසිකලය, කසිප්පු පොළේ තිබෙනවා. තැබෑරුමේ තිබෙනවා කියන එක අපට සොයාගන්න පුළුවන්. විනිවිද හොඳට පෙනෙයි. ඒවා ඇතුළත් කරලා බයිසිකලයක් දෙන්නය කියන එක හොඳයි කියලා මම අදහස් කරනවා. මෙය හොඳ යෝජනාවක් කියලා කියනවා.

[ ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා ]

ඒ වාගේම මම අධ්‍යාපනයට සම්බන්ධ යෝජනාවක් විවාද කරන අවස්ථාවේ සුරක්ෂා රක්ෂණය ගැන යමක් කියන්න කැමැතියි. මම මේ යූ.ඇන්.පී. යෙන් කරනවා කියලා මෙතැන හංවඩු ගහන්න හදනවා නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම අදහස් කරන්න යන්නේ, මේ සුරක්ෂා රක්ෂණය දැන් කවුරු හරි දීලා නේ තිබෙන්නේ. මේ රටේ ජනතාවට භුක්ති විඳින්න අවස්ථාව සලසලා තිබෙන්නේ. මේ ගැන දරුවන් සහ දෙමව්පියන් දැනුවත් වෙලා තිබෙනවා මදි. ඔබතුමන්ලා වුණත් බලයි. මේ ලක්ෂ තුනක් දීලා මොකක්ද බන් මේ ඉන්ෂුවරන්ස් එකෙන් කරන්නේ කියලා සමහරු හිතන්න පුළුවන්.

මම පෞද්ගලිකව මගේ අත්දැකීමක් කියන්නම්. ඒ දරුවාට ඒක භුක්ති විඳින්න බැරි වුණා. මේ රක්ෂණයේ වටිනාකම තිබෙන්නේ, Hospital එකේ නවතින එක නොවෙයි. මේකෙන් බෙහෙත් ගන්න පුළුවන්. මගේ කළ්‍යාණ මිත්‍රයෙක්ගේ දරුවෙක් තුන් වතාවක් - මම මේ වැදගත් වෙයි කියලා හිතලා කියන්නේ. දැනුවත්වීම උදෙසා. පුතෙක්. එයාට අවුරුදු 12 යි. අවස්ථා තුනකදී කලන්තේ දාලා වැටුණා. රාත්‍රියේදී වැටුණා. ඒ වැටෙන ප්‍රමාණය වැඩි වුණා. වැඩි වෙලා මේ දරුවාට බැරිම වුණාම - දුප්පත් මනුස්සයෙක්. කළුබෝවිල රෝහලට අරගෙන ගියාම, හතරවැනි වතාවේ වැටුණාම, පාසලේදී කලන්තේ දාලා වැටුණාම කළුබෝවිල රෝහලට ගියාම වෛද්‍යවරයා බලලා අහවල් කාමරයට යන්න කියලා ඒ තුණ්ඩුවක් ලියලා දුන්නා. මේ තුණ්ඩුව අරගෙන කාමරයට ගියාම එතැන හිටපු මනුස්සයා පොතේ රෙජිස්ටර් කරලා දුන්නා, සති 3 ½ කින් විතර පරීක්ෂණයකට එන්න කියලා. ඒ දුප්පත් දෙමව්පියන් දරුවා අරගෙන Scan පරීක්ෂණයට යන කොට මොළේ ගෙඩියක් ඇවිල්ලා, කැන්සර් එකක් ඇවිල්ලා ඒක ඉදිමිලා ලොකු වෙලා. අන්තිමට ඒ පරීක්ෂණත් එක්ක ඔපරේෂන් එක කරන්න යන කොට ඒ වෛද්‍යවරයා කිව්වේ මට සති තුනකට, හතරකට උඩදී මේක අහු වුණා නම් මම කපන්නේ නැතිව ගොඩින් ඇරලා වැඩේ කරනවා කියලා. බොහොම සංවේදීයි. මේ දරුවා තවම ජීවත් වෙනවා. පොඩ්ඩක් අවුලක් තිබෙනවා. ඔළුව කපලා පොඩ්ඩක් අයින් කරලා තිබෙනවා. අපි කවුරු කළත් හොඳ දේ සමාජගත කරන්න ඕනෑ. මෙහිදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රක්ෂණය ගැන අපි වැඩ සටහනක් කරලා මිනිස්සු අතරට යවන්න ඕනෑ. මේකේ credit එක මේ ආණ්ඩු - දැන් ලලිත් ඇතුළත්මුදලි මැතිතුමා උසස් අධ්‍යාපන ආධාරය දුන්නා කියලා හැමදාම යූ.ඇන්.පී. තිබුණේ නැහැ නේ. යූ.ඇන්.පී. යෙන් කළා කියලා මේවා හැමදාම තියෙන්නේ නැහැ. හොඳ. හැමෝම තට්ටු මාරුවට පෙරළී පෙරළී දෝලනය වෙවී මේ පක්ෂ යන්නේ. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මේ රක්ෂණයෙන් කරන්න පුළුවන් එකම දෙයයි. වෛද්‍යවරයා දුන්නා නම් මේ පරීක්ෂණය කරගෙන එනවා. මේ බෙහෙත් ටික ගන්නවා කියලා. දරුවාව එක්කගෙන ගිහින් පෞද්ගලික රෝහලෙන් අර කාඩ් එක දීලා මේක නොමිලේ කරගන්න පුළුවන්. මම ඒකත් මේ අවස්ථාවක් කර ගන්නවා මේ ගරු සභාව හරහා මේ බයිසිකලෙත් සමඟම මේක දැනුවත් කරන්න. මම මේක Budget එකෙත් කථා කරන්න සිටියා. මම ඒ ඇති වුණු සිදුවීම් එක්ක Budget එකේ එක එකටවත් කථා කරන්න සිටියේ නැහැ. අවස්ථා එකක්වත් ගත්තේ නැහැ. එවකට සිදු වුණු සිදුවීම්. කෙසේ හෝ වේවා. මේ බයිසිකලය දිය යුතුයි. මේක තෝරලා බේරලා අපි දිය යුතුයි.

තව ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන්නේ මේ සභාවේ ගරු මන්ත්‍රීවරු ඔක්කොම මේකට එකඟ වෙයි. දැන් අඩු ආදායම් ලාභී කියලා නිර්ණායකයක් තිබෙනවා, අඩු ආදායම්ලාභීන්ට ස්වයං රැකියාවලට, නිවාස ආධාර දීම. මොකක්ද අඩු ආදායම්ලාභී නිර්ණායකය. රුපියල් 6000/- යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඉතා ඉක්මණින් වෙනස් කරන්න ඕනෑ. Chief Sectorary හිටියා. දැන් ගියා. නමුත් කෙසේ හෝ වේවා, අපි මේකත් වෙනස් කරන්න ඕනෑ. මොකද දැන් රුපියල් 6000/- ක් ගන්න අඩු ආදායම්ලාභියෙක් නැහැ. මේසන් බාස්උන්නැහැත්, ගෝලයාත් රුපියල් 2000 ක්, 2500 ක් ගන්නවා. ග්‍රාමසේවක මහත්මයා කරන්නේ මොකක්ද දන්නවද? යූ.ඇන්.පී. කාරයෙක් දෙන ප්‍රතිපාදනයක් තිබෙනවා නම් ග්‍රාමසේවකයා දන්නවා, මේ දෙන්නේ හරිස්චන්ද්‍ර කොස්තාගෙන්. නැහැ, නැහැ. ඔයාට බැහැ. ඌ යූ.ඇන්.පී. නම් ගහලා ඇරියා. මම මේ කියන්නේ ප්‍රායෝගික දේ. ඔබතුමන්ලාටත් මේක වෙනවා ඇති. මෙන්න මේක කාලෝචිත ප්‍රශ්නයක්. රුපියල් 6000 යි කියන අඩු ආදයම්ලාභීයා දැන් රුපියල් 20,000 කට විතර දාන්න ඕනෑ. ගිය වර්ෂයේ අපි ඇස් කණ්ණාඩි බෙදා දෙන්න දුන්නා. මට කියන්න කනගාටුයි. ග්‍රාමසේවක මහත්වරු. කවුද මේ? කොස්තා මන්ත්‍රීතුමා. ඔයාට මෙච්චර නැහැ, මෙච්චරයි

කියලා කියනවා. පපුවට වදිනවා. රුපියල් 10,000 ක්, 20,000 ක් ගත්තා කියලා මේ ගෙදර මිනිහෙකුට රුපියල් 6000 ක් දීලා කණ්ණාඩියක් ගන්න පුළුවන්ද? ප්‍රායෝගිකයි නේ? හැබැයි සමහර ග්‍රාමසේවක මහත්වරු බොහොම සාවදානව කථා කරලා - ඒ මිනිස්සු පක්ෂ බැලුවේ නැහැ. ඒ මිනිස්සු Call කරලා අහනවා, මන්ත්‍රීතුමා මගෙත් එක්කෙනෙක් ඉන්නවා. එවන්නද කියලා. මම කිව්වා, එවන්න. ඒක අපි කළුද, සුදුද බැලුවේ නැහැ. ජේ.වී.පී. ද , ශ්‍රී ලංකා ද, යූ.ඇන්.පී. ද කියලා බැලුවේ නැහැ. අපි සමස්තයක් වශයෙන් රටේ ජීවත් වෙන්නේ. එහෙම නම් එසේ කථා කරමින්, ඔබතුමා ගෙනෙන ලද මේ යෝජනාවට අපි කිසිම පැකිලීමකින් තොරව උදව් උපකාර කරමින් මේක යාවත්කාලීන වේවා, මෙය සිට ක්‍රියාත්මක කරන්න ලැබේවා කියලා ප්‍රාර්ථනය කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.34]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේගේ යෝජනාව පිළිබඳව අපේ ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ විවිධ අදහස් පළ කරලා පාසල් දරුවන්ට මේ පා පැදිය ලබා දීම පිළිබඳව ඉතාම කලෝචිත යැයි කියන එක තමයි හැමදෙනාගේම මුවින් පිට වුණේ. අපි දන්නවා මේ වන කොට පාසල් යන දරුවන් විශාල ප්‍රමාණයක් දුෂ්කර වූ ගම්මානවල පා පැදිවලින් තමයි යන්නේ. අපි උදේට දකිනවා, අපේ ප්‍රදේශවලත් සමහර තාත්තලා, සමහර අම්මලා එක බයිසිකලේ තුන් හතර දෙනා වාඩි කරගෙන, පිටිපස්සේ ලැගිජ් එකේ තුන්දෙනයි. ඉස්සරහා Frame එකේ තුන් දෙනයි. එහෙම අරගෙන පොත් බෑග් ටික ගැට ගහගෙන තවමත් මේ විධියට පාසලට දරුවාව අරගෙන යනවා. සල්ලි තිබෙන මිනිස්සු වාහනවලින් දරුවාව පාසලට යවනවා. ඒ යවන කොට ආරක්ෂාව පිළිබඳව, එහෙම නැත්නම් ඒ දරුවන්ගේ ආර්ථිකය පිළිබඳව නොයෙකුත් කථාබහට ලක් වෙනවා. අද අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා පා පැදියක් ලබා දීමේ ක්‍රමවේදය. අද ලංකාවේ විවිධ විවිධ වර්ගවල පා පැදි තිබෙනවා. ඒ පා පැදි කොපමණ මුදල් දීලා ගත්තත්, තිස්දාහ, හතළිස්දාහ මුදල් දීලා ගත්තත් ටික දවසක් යන කොට, මාස හතරක් පහක් යන කොට මේ බයිසිකලේ මළකඩ කනවා. මේ ලංකාවේ නිෂ්පාදනය කරන භාණ්ඩවල ප්‍රමිතිය පිළිබඳව. ඉක්මණින්ම මළකඩ කනවා. එහෙම නැත්නම් ඉක්මණින්ම කැඩී බිඳී යනවා. මේ විධියට තමයි මේ සියල්ල නිෂ්පාදනය කරන්නේ. උදාහරණයක් ගත්තොත් අපි ස්වයං රැකියාවට දෙන පා පැදිය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ටෙන්ඩර් දාලා අපි ඉල්ලුවොත් Asia බයිසිකලයක් ගෙනත් දෙන්න කියලා. ඔහු Asia බයිසිකලයක් ගේනවා. නමුත් උසස්ම ප්‍රමිතියේ තිබෙන Asia බයිසිකලයක් නොවෙයි ගෙනෙන්නේ. ඒක විවිධ විධියට, වක්‍රානුකූලව සමහර කණ්ඩායම් එකතු වෙලා තමයි මේක ගෙනෙන්නේ. අර අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, ජපානයේ නිෂ්පාදනය කරන බයිසිකල් අද මේ වන විට ඕනෑ තරම් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. අද පාසල් දරුවන් වැඩි හරියක් පරිභණය කරන්නේ මේ පා පැදි තමයි. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්නවා. අපේ අනිකුත් අමාත්‍යතුමන්ලා ඉන්නවා. මෙන්න මේ ගෙනෙන බයිසිකලය ජපන් රජයත් එක්ක සම්බන්ධ වෙලා, ඉතා වටිනා කියන පා පැදියක් මේ දරුවෙකුට ලබා දෙන්න පුළුවන් නම් ඒක උචිතයි කියලා මම කියනවා. මොකද ඒකේ ඉස්සරහා කූඩයක් තිබෙනවා. ඩයිනමෝ එක තිබෙනවා. දවල් කාලයේත් ඒක පත්තු වෙනවා. බයිසිකලේ පිටිපස්සේ එළිය වැටුණාම දිලිසෙන හොඳ රතු ලයිට් එකක් තිබෙනවා. විවිධ, විවිධ දේවල් ඒ බයිසිකල්වල තිබෙනවා. ඒවා අවුරුදු තුන හතරක් එක දිගට පාවිච්චි කරන්න පුළුවන්කම තිබෙනවා.

ඒ වාගේම තමයි දැන් මේ වන විට ලංකාවේ වැඩි හරියක් පා පැදි පාවිච්චි කරන්නේ යාපනය පැත්තේ ඉන්න දමිළ දරුවන් සහ මේ පළාත්වල ඉන්න මුස්ලිම් දරුවන්. අපේ ප්‍රදේශවල පළමුවැනි ශ්‍රේණියේ සිට පාසලට යන්නේ බයිසිකලයෙන්. මේ පුංචි දරුවා උදේට පැදගෙන යනවා. කිසිම භයක් සැකක් නැතිව පාරේ යනවා. හැබැයි සිංහල දරුවන්ව පා පැදියෙන් පාසල් යවන්න හැම ආදරණීය අම්මා කෙනෙක්ම, තාත්තා කෙනෙක්ම භයයි. ළමයාව භය කරනවා. නමුත් අපේ ප්‍රදේශවල මුස්ලිම් දරුවන් මෝටර් සයිකල්වලින් පවා - දැන් ඉලෙක්ට්‍රික් මෝටර් බයිසිකල් ඇවිල්ලා තිබෙනවා. ඒවායේ තුන් හතර දෙනා දාගෙන යනවා. ඒවා පොලිසියෙන් අල්ලන්නෙත් නැහැ. නමුත් මේ මුස්ලිම් පුංචි දරුවන් වැඩි හරියක් මේවායේ පාසල්වල යනවා. ඔබතුමාගේ මේ යෝජනාව ඉතා වටිනා කියන යෝජනාවක් වුණත් අපි පළාත් සභාවට නවක මන්ත්‍රීවරු

[ ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ]

වශයෙන් ඇවිල්ලා දැන් අවුරුදු පහ ඉවර වෙන්න යනවා. දැන් මේ පහ ඉවර වනතුරු මේ පළාත් සභාවට විවිධ විවිධ යෝජනා ගෙනැල්ලා කථා කළා. හැබැයි අපි ආපස්සට හැරිලා අහනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගෙනාපු එක යෝජනාවක්වත් මේ වන විට ක්‍රියාත්මක වෙලා තිබෙනවාද? තමුන්නාන්සේ ගෙනාපු යෝජනාව ඉතා වටිනා යෝජනාවක්. අපි උදේ පාන්දර පාසල් ගියාට පස්සේ ශරීර සුවතා වැඩ සටහන් ක්‍රියාත්මක වුණා. අද පාසල්වල තිබෙනවාද? අද එකම පාසලකවත් මම නම් දැකලා නැහැ. ඒ ශරීර සුවතා වැඩ සටහන විනාඩි 10 කට සීමා කරලා තිබුණා. උදේ වරුව දරුවාව ප්‍රබෝධමත් කරන. පා පැදියෙන් දරුවෙක් පාසලට එනවා. ඔහුට ව්‍යායාමයක්, ශරීර සුවතාවයක් යොමු වෙලා ඔහු නිරෝගී දරුවෙක් බවට පත් වෙනවා. ඊට අමතරව අපි දකිනවා. පාසල්වල ක්‍රියාත්මක වෙන්න ඕනෑ. පළමුවැනි ශ්‍රේණියේ සිට, නැත්නම් මොන්ටිසෝරියේ සිට ක්‍රියාත්මක වන කසළ කළමනාකරණය, පාසල්වල විෂයයට ඇතුළත් කරලා මෙය ගේන්න ඕනෑ. මේක ගෙනැල්ලා 1 සිට 5 දක්වා ක්‍රියාත්මක කරලා 6 වැනි ශ්‍රේණියට යන කොට, එහෙම නැත්නම් දරුවා වෙනත් පාසලකට ගියත් ඒ දරුවා ඒකට පුරුදු වෙනවා. මම හිතන්නේ ලංකාවේ විතරයි මේක බැරි. අවුරුදු ගණන් රට ගිහිල්ලා කසළ කළමනාකරණය හරියාකාරව ක්‍රියාත්මක කරලා, ගෙවල්වල වැඩ කරලා, ආයතනවල වැඩ කරලා එනවා. ඒවා හරියට ක්‍රියාත්මක වෙනවා. නමුත් ලංකාවට ඇවිල්ලා එන බස් එකේ හරි, තමන් එන වාහනේ හරි වමනේ දාලා ෂොපින් බෑග් එක කරකවලා එළියට විසි කරලා දානවා. හැබැයි අවුරුදු ගණනක් අරහේ කරපු සාර්ථක වැඩ පිළිවෙළ ලංකාවට බැස්ස ගමන් අමතක වෙනවා.

අන්න ඒ නිසා තමුන්නාන්සේට අපි මතක් කරනවා. අධ්‍යාපන විෂයයත් එක්ක සමගාමීව යන කොට අද පාසල්වල දරුවන්ට හදිසි කරදරයක් පැමිණි වෙලාවට, අපි හිතුවොත් ගංවතුරක් ආවොත් මේ දරුවන්ට පීනන්න කරන්න දන්නේ නැහැ. මෙන්න මේවා පිළිවෙළකට, සෑම පාසලකම දරුවෙකුටම හැම ඉස්කෝලෙම දරුවෙකුටම පීනන්න පුරුදු කරන්න ඕනෑ. මෙවන් වූ වැඩ පිළිවෙළක් අධ්‍යාපන විෂයයත් එක්ක ඇතුළත් වෙලා හැම දරුවෙකුටම මේ කටයුතු ක්‍රියාත්මක කළොත් අපේ රටට යම්කිසි ශක්තියක් නිර්මාණය කරගන්න පුළුවන්කම තිබෙනවා. මේ පා පැදිය ලබා දීම පිළිබඳ, මෙතැන අපි කථා කරලා ගිහිල්ලා තව අවුරුදු 15 කින්වත් මේක ක්‍රියාත්මක වෙයිද දන්නේ නැහැ. හැබයි අපේ ප්‍රතිපාදනවලිනුත් මේක දෙන්න මදි වෙනවා. සීමිත ප්‍රමාණයක් තමයි අපට ලැබෙන්නේ. ඒක නිසා මේක වෙනම වැඩ සටහනක් වශයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක තමුන්නාන්සේලා අපි ඔක්කොම එකට සාකච්ඡා කරලා අර පිට රටින් ඉතා අඩු මිලකට ගෙන්වන්න පුළුවන් ඒ බයිසිකල් විශාල ප්‍රමාණයක් ගෙන්නලා ඒ අවශ්‍ය කරන දරුවන්ට ලබා දුන්නොත් මේ කාර්යය ඉතාමත් ශක්තිමත් වෙන්න පුළුවන්. අපි මුලින්ම බස්නාහිර පළාතෙන් මේ කාර්යය හරියාකාරව ආරම්භ කළොත් සමස්ත රට පුරාම මේක ක්‍රියාත්මක කරගන්න පුළුවන්කම ලැබෙනවා.

අද අපි දකිනවා, සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා ජපානයත් එක්ක සම්බන්ධකම් තිබෙන, ඒ ව්‍යාපාර කටයුතු සාර්ථකව කර ගෙන යන, වාහන ගෙන්වීම සහ ඔවුන්ගේ අනෙකුත් කටයුතු දියත් කරන කොට අපි දකිනවා, පොළොන්නරුව ප්‍රදේශයේ ඉඳන් රොෂාන් මන්ත්‍රීතුමන්ලා වාගේ බයිසිකල් කන්ටේනර් ගණන් ගෙනැල්ලා, ජපන් බයිසිකල් ගෙනැල්ලා මුළු පොළොන්නරු දිස්ත්‍රික්කයටම, හැම ගෙදරකටම, ඒ ඉන්න හැම දරුවෙකුටම පාපැදි ලබා දීලා තිබෙනවා. එක ගෙදර තුන් දෙනෙකු ඉන්නවා නම් පාපැදි තුනක් ලබා දීලා තිබෙනවා. අන්න ඒ කටයුත්ත හරියට කරන්න පුළුවන් වෙනවා. මම හිතන්නේ, සාර්ථක වැඩ පිළිවෙළකට තමුන්නාන්සේගේ මේ යෝජනාවත් එක්ක ඒක උචිතයි. මම හිතන්නේ, දීර්ඝව කථා කරන්න දෙයක් නැහැ. මේ යෝජනාව පිළිබඳව කථා කරන්න විතරක් නොවෙයි. මම හිතන්නේ, මේක කථාවට සීමා නොකර පසුගිය කාලයේ යෝජනා ඉහළට ගෙනැල්ලා නැවත මේවා සිහිපත් කරලා ගරු නියෝජ්‍ය සභාපතිතුමා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරලා, මේ යෝජනාවත්, පසුගිය යෝජනාවත් - ඒ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරන මන්ත්‍රීවරු ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳව මම හිතන්නේ, මේ සභා ගැබට විතරක් අද දවසට විතරක් සීමා නොකර අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න තමුන්නාන්සේගේ මේ යෝජනාවත් එක්ක අපේ ශක්තිය, ධෛර්යයත් එකතු කරලා ඒ සියලු දෙනාත් එක්ක එකතු වෙලා කටයුතු කරන්නය කියලා මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.42]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාලය වෙන් කරලා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ඔබතුමාගේ මේ යෝජනාව ඉතාමත් වටිනා යෝජනාවක්. නමුත් මට පුදුමයි. විද්‍යාත්මක ක්‍රමය විශ්වාස කරන, විද්‍යාව තමන්ගේ විෂය කර ගත්ත ගුරුවරයෙකු වන ඔබතුමා මිත්‍යාව පරාජය කරන්න දරපු උත්සාහය පරාජය කරමින් ඔබතුමාගේ යෝජනාව ගෙන ඒම ගැන. කෙසේ වෙතත් ඔබතුමාගේ යෝජනාව වටිනා යෝජනාවක්. ඇතැම් විට මම මේ කියන්න හදන කාරණා අපේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් පෙන්වා දීපු කාරණා එක්ක එකිනෙක ගැටෙන්න පුළුවන්. අතිපිහිත වෙන්න පුළුවන්. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ප්‍රතිපත්තියක් හැටියට අපි තීරණයක් අරන් ක්‍රියාත්මක කරන්න යන කොට ඔබතුමන්ලාට අපි බර තැබූ ප්‍රමාණය පිළිබඳව යම් යම් කාරණා සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්න සහ තීරණයකට එන්න මේ කරුණු ප්‍රයෝජනවත් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකාව වාගේ රටක දරුවන්ට ඉස්කෝලෙට යන්න බයිසිකල් ලබා දෙනවාය කියන කොට මට පොඩි භයක් ඇති වුණා. ඔබතුමාගේ යෝජනාව මම කියෙව්වේ අද නොවෙයි. මම සභාවට එන්න කලින් ඊයේ දවසේ ඔබතුමාගේ යෝජනාව කියෙව්වම, මට යෝජනාව කියවන කොටම භයක් ඇති වුණා. මට නිකම් මැවිලා පෙනුනා මගේ පුතා බයිසිකලයක් පැද ගෙන ඉස්කෝලේ යන කොට මට කොයි තරම් භයක් ඇති වෙයිද කියලා. ඒ භය සාධාරණ භයක්. ඒ නිසා මම හිතන්නේ, අපේ රටේ සාමාන්‍යයෙන් බයිසිකලයෙන් එන එකට දෙමව්පියෝ උනන්දු කරවන්නෙත් නැහැ. පාසලෙන් උනන්දු කරවන්නෙත් නැහැ. මේක තමයි ඇත්ත කථාව. පාසල පැත්තේ තව මීට වඩා කාරණා තිබෙනවා. කෙසේ වෙතත් අවදානම තමයි මේකේ පළමුවැනි දේ කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා. කොහොමද මේ අවධානම ජය ගන්නේ. අපේ රටේ වාහනවල හැසිරීම, රියදුරන්ගේ හැසිරීම සැලකිල්ලට ගත්තාම මේ වාගේ රටක කොහොමද අපි දරුවෝ පාසලකට බයිසිකලයෙන් යවන්නේ කියන භය ඇති වන එක සාධාරණයි. කෙසේ වෙතත් අපි මෙවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා නම්, කොහොමද දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නේ. එතකොට මේ බයිසිකලය ලබා දෙන්නේ කොතරම් දුරක් එන දරුවාටද? මේක නගරයේ ලබා දෙන්න ඕනෑද? නගරයේ ලබා දෙන්න පුළුවන්ද? නගරය වඩාත් අනාරක්ෂිතයි. දැන් විශේෂයෙන් මම ජීවත් වන, මම ඉපදුනු කොළොන්නාවේ පාසල් හතරක් තිබෙනවා. සේදවත්ත සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලය. කොටුවෙල ගාමිණී විද්‍යාලය. වේරගොඩ කනිෂ්ඨ විද්‍යාලය. ඒ වාගේම ටිබෙට් එස්. මහින්ද විද්‍යාලය. මේ පාසල් හතරම තිබෙන්නේ ප්‍රධාන ප්‍රවාහනයෙන් හුදෙකලා වෙලා. මේ පාසල් හතරට පළමු වන වසරට ළමයින් ඇතුළත් කරන කොට තිබෙන තවත් ප්‍රශ්නයක් තමයි මේක. දැන් මේක අර වැඩ සටහන යටතේ, කලින් ක්‍රියාත්මක කළා නේ වැඩ සටහනක්. සමහර ඒවායේ ප්‍රාථමික පන්ති විතරයි තිබෙන්නේ කියලා. ඒ වැඩ සටහන යටතේ ඇති වුණු ප්‍රධානම ප්‍රශ්නය තමයි වේරගොඩ ඉන්න ළමයාට වේරගොඩ ඉඳලා සේදවත්තට එන්න වුණොත් සෑහෙන දුරක් වාහනයක් නැහැ. ඒ පළාතේ ඉන්නේ ඉතාමත් දුප්පත් දරුවෝ. වෑන් එකක් හයර් කරලා එවන්න දෙමව්පියන්ට පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා මේ නගරයේ වුණත් බයිසිකලයක් ලබා දීමේ වැඩ සටහන හොඳ එකක්. හැබැයි, ඊට වඩා අභියෝගයක් තිබෙනවා.

මම කලින් කිව්වා වාගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආරක්ෂාව පිළිබඳ අභියෝගය. ඊළඟට දරුවාට බයිසිකලයක් ලබා දෙන එකෙන් මොකක්ද ලැබෙන වාසිය. මේකත් අපි තේරුම් ගන්න ඕනෑ. අපි ප්‍රතිපත්තියක් හදනවා නම් ඇත්තටම, ජාතික වශයෙන් මේක ක්‍රියාත්මක කරන්න ඕනෑ වැඩ සටහනක් කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම දරුවාට නිදහසේ තමන් ජීවත් වන ප්‍රදේශයේ බයිසිකලයක් පැදගෙන පාසලට යන්න ඉඩ ලැබෙන එක කොයි තරම් හොඳ අත්දැකීමක්ද? විශේෂයෙන්ම දරුවාට මේකෙන් ලැබෙනවා, ස්වයං තීරණයක් ගැනීමේ අයිතිය. බයිසිකලයක් පදිනවා කියන්නේ, වාහනක් එළවනවා කියන්නේ පොඩි දරුවෙකු තුළ යම් ස්වයං තීරණ ගැනීමේ අයිතිය වර්ධනය කරන්න එක හේතුවක් වෙනවාය කියලා. ඒක මම නොවෙයි කියන්නේ. මේක ලෝකය විශ්වාස කරන එකක්. පර්යේෂණවලින් සොයා ගත්ත දෙයක් ගැනයි මම මේ කියන්නේ. ඒ නිසා ඒක හොඳ අවස්ථාවක්. ඒ විතරක් නොවෙයි. දරුවාට විශේෂයෙන් පළපුරුද්දක් ලැබෙනවා. පළපුරුද්දක්, අවස්ථාවක් ලැබෙනවා යම් දෙයක් ඉගෙන ගන්න. අපි මේකට කියනවා, Learning experience එකක් ළමයාට ලැබෙනවා කියලා. විශේෂයෙන්ම දැන් සමහර රටවල දරුවන්ට - මේ ළඟදී

[ ගරු සුසිල් කිඳෙල්පිටිය ]

සමීක්ෂණයක් කරලා තිබෙනවා. මෑත කාලයේදී එංගලන්තයේදී. ඒ සමීක්ෂණයේදී 50% ක් පාසල් දරුවෝ කියලා තිබෙනවා, මම කැමැතියි public transport එකේ එනවාට වැඩිය, සාමාන්‍ය බස් එකේ එනවාට වැඩිය බයිසිකලයෙන් ඉස්කෝලෙට එන්න. හැබැයි, ඒ එක්කම ඒ දරුවන්ට පාසල්වල ගොඩක් රටවල අපේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා පෙන්වලා දුන් නෙදර්ලන්තයේ හරිම කදිම අත්දැකීමක්. එතුමා කියපු කාරණා මම යළි කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. පාසලේම උගන්වනවා දරුවන්ට කොහොමද පාරේ බයිසිකලය පැදගෙන යන්නේ. මාර්ග නීතිවලට අනුව කොහොමද මේ වැඩේ කරන්නේ. යම්කිසි වාහනයක් ඉදිරියට ආවොත් කොහොමද ඒකෙන් ආරක්ෂා වෙන්නේ. ඒ විතරක් නොවෙයි. පාසලට එන කොට හදිසියේ බයිසිකලයේ ටයර් එක ගියොත් මේ ටයර් එක ගිය බයිසිකලයට මොකද කරන්නේ. ඒ වාගේම ඉස්කෝලේදී කොහොමද දරුවෝ එකතු වෙලා ටයර් එක මාරු කර ගන්නේ. ඒ කියන්නේ, මේකෙන් ලොකු Learning experience එකක් දරුවාට ජීවිතයට එකතු වෙනවා. ඒ නිසා ඒ අතින් බැලුවාම ඉතා වැදගත්. ඒ වාගේම පාසලට එන දරුවා බයිසිකලයේ එන කොට දරුවාගේ අවධානය නිසි ලෙස යොමු වෙනවා. දරුවා පුරුදු වෙනවා එක කාරණයක් කෙරෙහි අවධානයෙන් වැඩ කරන්න. විශේෂඥයෝ කියනවා, බයිසිකලයෙන් පාසලට එන දරුවා පන්තියට ආවාට පස්සේ පන්තියේදී තමන්ගේ මනස ඒ කරන වැඩේට යොමු කරන්න යම් පුහුණුවක් ලබා ගන්නවාය කියලා. Concentration එක ඇති කර ගන්න පහසුවක් වෙනවා කියලා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාව ඉතාම හරවත්. ඒ කියන්නේ මේක ක්‍රියාත්මක කළ යුතු හොඳ යෝජනාවක්. යෝජනාවක් එන කොට අපි බලන්න ඕනෑ යෝජනාවේ දේශපාලන අරමුණු නොවෙයි. දැන් අපට ලැබෙන ප්‍රතිපාදනවලින් බයිසිකල් අරන් දෙනවාය කිව්වාම, මේක පිටිපස්සේ ආර්ථික හා දේශපාලන අරමුණු තිබෙන්න පුළුවන්. මම මේ චෝදනාවක් කරනවා නොවෙයි. අපේ ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. මේ බයිසිකලය දිරනවා කිව්වා. එක එක ප්‍රශ්න කිව්වා. ඒක ඇත්ත. දැන් මෙහෙම බාල බයිසිකලුත් එන්න පුළුවන්. මේවා පිටිපස්සේ වෙන ආර්ථික වාසිත් සමහරුන්ට ලැබෙන්න පුළුවන්. ඒ වාගේ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. මේකේ දේශපාලන වාසිත් වෙන්න පුළුවන්. බයිසිකලය දෙන්නේ කාටද? බයිසිකලය දෙන්නේ පාක්ෂිකයාට. නැත්නම් බයිසිකලය දෙන්නේ කාටද? ඊළඟ සැරේ ඡන්දේ බලාගෙන තමයි බයිසිකලය දරුවාට දෙන්නේ. ගෙදර අම්මාගෙයි තාත්තාගෙයි. එහෙම දේවල් තිබෙනවා. නමුත් ඒක නොවෙයි මම මේ කියන්නේ. ඔබතුමාගේ යෝජනාවේ මේ ඇත තිබෙන කාරණය කියන්නේ. අපි හඳුනා නොගත් ඉතාම වටිනා කාරණා ගණනාවක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඇතුළේ තිබෙනවා. ඒ නිසා ඒ ගැන අපි අවධානය යොමු කළ යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම දරුවා බයිසිකලයට උදේ ගෙදරින් පිට වෙලා ආපහු සවස ආරක්ෂා සහිතව ගෙදර එනවාය කියන්නේ, දරුවා එදා දවසේ ජයග්‍රහණයක් ලබනවා. එක අතකින් ඒක දරුවාට අනාගතය දකින්න, අධ්‍යාපන ජයග්‍රහණ කරා යන්න යම්කිසි පිටිවහලක් වෙනවාය කියලා විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා ඒ අතින් බැලුවාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙය ඉතාම වටිනවා. හැබැයි, දෙමව්පියන්ගේ හා ගුරුවරුන්ගේ අධීක්ෂණය, මග පෙන්වීම ඒ වගේම නිලධාරීන්ගේ හා වාහන හිමියන්ගේ කැපවීම, අවධානය අත්‍යවශ්‍යයි මෙය ඉදිරියට ක්‍රියාත්මක කරන්න නම්. විශේෂයෙන්ම යුරෝපය වාගේ බොහෝ රටවල මා දැකලා තිබෙනවා, බයිසිකලයේ යන දරුවෝ වෙනුවෙන් වෙනම පුංචි ඉරක් ඇඳලා තිබෙනවා. ඒ ඉරේ තමයි බයිසිකල් යන්නේ. මොකද, ඒක කරන්නේ එක පැත්තකින් බයිසිකලයේ යන කෙනා විනය ගරුක බයිසිකල් ධාවකයෙක් කරන්න. අනෙක් පැත්තෙන් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න. ඒ නිසා මෙවැනි වැඩ පිළිවෙළවල් ලංකාවේ ක්‍රියාත්මක කිරීම ලෙහෙසි නැහැයි කියලා ඔබතුමාට මම හිතන්නේ මේකෙන් තේරෙනවා. කෙසේ වෙතත් අපි කැප වුණොත් අපට මේ වැඩේ ඉස්සරහාට ගෙනියන්න පුළුවන්.

ඒ වාගේම තවත් විශ්වාසයක් තිබෙනවා, සෞඛ්‍ය අංශවල. අවුරුදු පහත් දහඅටත් අතර දරුවන්ට දවසකට පැයකවත් ප්‍රමාණයක් අඩුම ගණනේ ව්‍යායාම අවශ්‍යයි කියලා. ඔබතුමා මේ කියන වයස් කාණ්ඩය ඊට වඩා ඉහළයි. අවුරුදු පහේ නොවෙයි. හැබැයි දැන් යුරෝපයේ රටවල ඉතාම කුඩා ළමයින් පවා පුරුදු කරනවා. දැන් දෙමව්පියන්ට කියනවා, පුළුවන් නම් දරුවා තියාගෙන එන්න පුළුවන් පුංචි බයිසිකලයක් පොඩි කාලේම දරුවා ඉස්කෝලෙට එන කොට අරන් ඇවිල්ලා ළමයාට පුරුදු කරන්න. මේ Learning experience එක ඉස්සෙල්ලා අම්මාටයි තාත්තාටයි දරුවා අරගෙන ඇවිල්ලා පුරුදු කරන්න කියලා.

දැන් සමහර පාසල්වල යුරෝපයේ අවුරුදු පහ හය වෙන කොට බයිසිකලය ගෙනැල්ලා ඉස්කෝලේම බයිසිකලය පදින විධිය පුරුදු කරනවා. බයිසිකල් වැඩ සටහන් වෙනම තිබෙනවා. ඒක විශේෂ හැකියාවක්. ඒක Skill එකක්. ඒ Skills පුරුදු කරන්න පුළුවන්. ඒ නිසා ඒ අතින් බැලුවාම සෞඛ්‍ය අංශයේ ඔබතුමාගේ යෝජනාවේත් සඳහන් වෙනවා. පැයකවත් ප්‍රමාණයක් දරුවාට යම් ව්‍යායාමයක් ලැබෙනවා. ඒක ලොකු දෙයක්. ඒ නිසා ඒ අතින් බැලුවාම ස්ථූලතාවයට, බර වැඩි වීමට යම් පිළියමක්. අද කාලේ දරුවන්ට බර වැඩි වෙන එක ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා අපි නිරෝගී දරුවන් බිහි කරන්න, නිරෝගී දරුවන් ඇති කර ගන්න මේක හොඳ පිළියමක් වෙනවා. ඒ වාගේම දරුවන්ගේ ජීවන කුලසලතාව පුළුල් කර ගන්න පුළුවන් වෙනවා. ආරක්ෂිතව කොහොමද පරිසරය ජය ගන්නේ කියලා. කුසලතා ඇති කර ගන්නේ කියලා. මේ සියල්ල අතින් බැලුවාම මේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්.

ඒ වාගේම අද අපි ඉතාම අනාරක්ෂිත ලෝකයක ජීවත් වෙන්නේ. දරුවෙකු නිකම් පාරක ඇවිදගෙන යන්නවත් බැහැ. අපි දකිනවා, කහ ඉරේ අනන්ත අනතුරු වෙලා දරුවෝ නැති වෙනවා. ඉතින් එවැනි පරිසරයක දරුවා කොහොමද මේ අභියෝගයට මුහුණ දෙන්නේ? ආරක්ෂාව පිළිබඳව දරුවා පරිසරය ජය ගන්නේ කොහොමද? ආරක්ෂාව කියන එක ගැන හැඟීම වැඩියෙන් දරුවා තුළට ඇති කරන්නත් මේ යෝජනාව, ඉතාම හොඳ යෝජනාවක්. දරුවන්ට බයිසිකල් ලබා දීම. හැබැයි, අපට ජාතික මට්ටමේ standards, ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ මේක ඉස්සරහාට කරන කොට. ඒ වාගේම දරුවාට තාක්ෂණික දැනුම විශේෂයෙන් ලබා දිය යුතුයි. ඒ නිසා මේක කඩිනම් ප්‍රවාහන මාධ්‍යයක් හැටියට කොහොමද යථාර්ථයක් බවට පරිවර්ථනය කරන්නේ කියන අභියෝගය අපට තිබෙනවා. ඊළඟට තව මතු වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අමතක වුණා කාරණයක්. අපේ අද මේ කාබන් දුම. සාමාන්‍යයෙන් අපේ පාරවල් ඉතාම අපිරිසිදුයි. මේ දුම. ඒ නිසා දරුවන් වෙනත් සෞඛ්‍ය ප්‍රශ්නවලට, ශ්වසන ආබාධවලට ලක් වෙන්න පුළුවන්. ඒ වාගේම මේ දුම නිසා වෙනත් ආබාධවලට ලක් වෙන්න පුළුවන්. ඒ නිසා ඒ ගැනත් අපට සැලකිල්ල යොමු කරන්න වෙයි. මේ වාගේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන කොට. ඒ නිසා අපි පාසල හරහා මේක කරන්න ඕනෑ. ඊළඟට ප්‍රාදේශීය බලධාරීන්ට ලොකු වගකීමක් තිබෙනවා. පළාත් පාලන ආයතනවලට ලොකු වැඩ කොටසක් කරන්න තිබෙනවා. දරුවන්ට පාසල්වලට, පාසල් බලධාරීන්ට ලොකු වැඩ කොටසක් කරන්න තිබෙනවා. පාසල්වලට ළමයා බයිසිකලයෙන් ආවාම මේ බයිසිකලය ආරක්ෂා කරලා දෙන්නේ කොහොමද? මේකේ Parking facility එක. කොහොමද මේ බයිසිකල් ගාල් කරන්නේ. මේ වාගේ ප්‍රශ්න ගොඩක් ගොඩ නැගෙන්න පුළුවන්. කෙසේ වෙතත් මේ යෝජනාව ඉතාමත් වටිනා යෝජනාවක්. මේක වෙනම සංස්කෘතියක්. මේ බයිසිකල් භාවිතා කිරීම කියන එක. අපට හුරු නැති, නමුත් කළ යුතු, නමුත් ප්‍රවාහන ප්‍රශ්නයට ලොකු විසඳුමක් වන යෝජනාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක කදිම යෝජනාවක්. මේක අපි ක්‍රියාත්මක කළ යුතුයි. නමුත් මේකේ අපි සියලු මාන අවබෝධ කර ගෙන, සියලු අංශ ගැන අවධානය යොමු කරලා හුදු දේශපාලන යෝජනාවක් හැටියට බයිසිකල් දෙන්න නොවෙයි. ඊට වඩා එහා ගිය ක්‍රමවේදයක් ඇතිව බයිසිකල් ලබා දීමේ වැඩ සටහනක් විශේෂයෙන් අමාත්‍යාංශ අතර යම් සම්බන්ධීකරණයක් හරහා ක්‍රියාත්මක කළ යුතු වැඩ සටහනක් බවට පරිවර්ථනය කරන්නේ නම් මේක ජාතියට ඉතා වටිනා යෝජනාවක් වන බව මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා.

[අ.භා. 12.55]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M. Shafi Raheem

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මේ ග්‍රාමීය පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට බයිසිකලයක් ලබා දීම සම්බන්ධව යෝජනාව වඩාත් කාලෝචිත යෝජනාවක්. ඇත්ත වශයෙන්ම මේකේදී නගරවල ජීවත් වන ළමයින් ගැනත් අපි පොඩ්ඩක් අවධානය යොමු කරන්න වෙනවා. පාසල් අවට ඉන්න ළමයින්ට නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. හැතැප්ම දෙකක් තුනක් එන ළමයින් ගැනත්. අපි ඒ ගැන නගරවල ජීවත් වන ළමයි ගැනත් අවබෝධ කර ගෙන ඒ ළමයින්ට ඒ අවස්ථාව ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කළා. මේ සම්බන්ධව ළමයින්ට තිබෙන exercise, එයාලාගේ ව්‍යායාම සම්බන්ධව. ඇත්ත වශයෙන්ම දැන් නගරයේ ඉන්න ළමයින්ට වෙලා තිබෙන්නේ අද බයිසිකලයකින් යන්න කැමැතිත් නැහැ. කඩේට ගියත් මෝටර් බයිසිකලයකින් තමයි යන්න බලන්නේ. පයින් යන්න කැමැති නැති ළමයින් තමයි දැන්

[ ගරු ෂාෆි රහීම් ]

හැදීගෙන එන්නේ. මේකේදී අපි දකිනවා. ඉස්සරහාට අපේ ළමයින්ට ලොකු ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. දැන් Sugar Patient ලා ඉන්නවා. Sugar Patient ලා හැදෙනවාය කියන්නේ අපි දැක්කා, වයස 45, 48, 50 වාගේ. නමුත් දැන් ඉන්න ළමයින්ව දකින කොට හිතෙනවා, වයස අවුරුදු 20 න් 22 න් හැදෙන්න පුළුවන් තත්ත්වයක් උදා වෙලා තිබෙනවා කියලා. ඔබතුමාගේ මේ යෝජනාවේදී ඇත්ත වශයෙන්ම ළමයින්ට ව්‍යායාම ලැබෙනවා. ඒ වාගේම පාසල්වල තිබුණා උදේ වරුවේ exercise කිරීම. ළමයින්ට ව්‍යායාම කටයුතු කළා. දැන් මම හිතන හැටියට සමහර තැන්වල ඒක වෙන්නේ නැහැ. නමුත් අපි ප්‍රායෝගිකව අපේ ළමයින්ට, පාසල් යන ළමයින්ට අපේ දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වෙනවා. මේකේදී නගර කියලා නැහැ. ග්‍රාමීය කියලා නැහැ. මේකේදී දුප්පත් ළමයින්ට සමහර පාසල්වල මෙහා පැත්තේ ගේට්ටුව තියලා අනික් පැත්තේ ගේට්ටුවෙන් අරිමුයි කිව්වොත්, මේ ගේට්ටුව වහමු කිව්වොත් ඒකටත් ලොකු උද්ඝෝෂණ කරන දෙමව්පියන් ඉන්නවා. නමුත් අපි දකින්නේ කොහොම හරි එයාලා ළඟපාතම ඇවිදින්නේ නැතිවම කොහොමද මේක කරන්නේ කියන තත්ත්වයට තමයි දැන් ඉන්න හුභාක් දෙමව්පියෝ, ළමයින්. නමුත් මේකේදී ඇත්ත වශයෙන්ම පොඩි ළමයින්ට - අපි හිතනවා, අපේ රටවල තිබෙන පාරවල්වල බයිසිකල් පැදගෙන යාමට හරියට නිසි ලෙස ක්‍රමවේදයක් හදලා නැහැ. මම දකින සමහර දේශපාලඥයෝ එක එක කාලවල කාපට් ගැහුවා. නමුත් ෆ්ලැට් ෆෝම් එකක් නැහැ. කාණු පද්ධති නැහැ. සමහර පාරවල්වල පොඩ්ඩක් මිස් වුණොත් එහෙම කාණුවේ ගිහිල්ලා තමයි කෙළින්ම වැටෙන්නේ. කෙළින්ම කාපට් එක ගහලා දාලා තිබෙනවා. දෙපැත්තේ ඇවිදීමටවත් කිසිදු ඉඩක් මහජනතාවට නැහැ. කාණු පද්ධතියකුත් නැහැ. නමුත් මේ වාගේ දේවල්වලින් අපි ප්‍රවේශම් කරන්න ඕනෑ.

ඒ වාගේම බයිසිකල් සම්බන්ධව ඇත්ත වශයෙන්ම අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මේ ලංකාවේ නිෂ්පාදනය කරන බයිසිකල්වල අනිවාර්යයෙන්ම quality බලන්න වෙනවා කියලා. දැන් ජපානයේ ඉඳලා එන බයිසිකල්වලට හොඳ quality යක් තිබෙනවා. පාවිච්චි කරන්නත් පුළුවන්. කාලයක් යන කොට ඒක මොන වර්ගයේ වුණත් අපි ඒ ගැන අවධානය යොමු කරලා ඒක මිලදී ගන්න කොට ඒවාවල quality ය හරියට බලන්න ඕනෑ. අනික් එක තමයි අපි ළමයින්ට තවත් GPS tracking system එකක් - බයිසිකලයක් දුන්නොත් දෙමව්පියන්ට ළමයින්ව track කරන්න පුළුවන් විධියට, තමන්ගේ ගෙදර ඉඳගෙන මොබයිල් ෆෝන් එකෙන් හරි, desktop එකකින් හරි track කරන්න පුළුවන් විධියට බයිසිකලයට සවි කරලා දෙන්න පුළුවන්. වැඩි වියදමක් යන්නේ නැහැ. එතකොට ළමයා පාසලේ ඉන්නවාද? තව කොහේ හරි ඉන්නවාද කියන එකත් අපට තව අලුත් option එකක් දා ගන්න පුළුවන්. මේක කාලෝචිත යෝජනාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මම ස්තුති කරනවා. මේවා ලැබෙන්න ඕනෑ ළමයින්ට නිවැරදි ලෙස, ඒ කියන්නේ නගරයේත් මේකට සම්බන්ධ කර ගෙන නගරයේ ඉන්න ළමයින්ගේ දුර බලලා ඒ ළමයින්ටත් බයිසිකලයක් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න ඕනෑය කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.00]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලීන වශයෙන් ඉතාම වැදගත් යෝජනාවක් ඔබතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. මම හිතන්නේ, මේක කාලයක් තිස්සේ න්‍යාය පත්‍රයේ තිබුණා. සාකච්ඡාවට ගන්න මම හිතන්නේ ප්‍රමාද වුණා. කෙසේ වුණත් අද දිනයේදී රීති අත්හිටුවීමකින් යෝජනාවක් මම ගෙනාවා. එම යෝජනාව තුළිනුත් මම අපේක්ෂා කළේ අද මේ රටේ අපි දරුවන්ට බයිසිකල් දෙන්න, පාපැදි දෙන්න යෝජනා කරනවා වාගේම මේ සමස්ථ සමාජයම ග්‍රහණයට අරගෙන ඉන්න මිත්‍යාව, එහෙම නැත්නම් අපේ සමාජය තුළ මුල් බැස ගනිමින් තිබෙන මේ විවිධ ආකාරයේ තක්කඩි, හොරු, අපරාධකාරයෝ, ජාවාරම්කාරයෝ අපේ සමාජය අද ගිල ගනිමින් තිබෙන මේ මිත්‍යා විශ්වාසවලට කොතෙක් දුරට ගොදුරු වෙමින් තිබෙනවාද කියන එක පිළිබඳව සාකච්ඡා කිරීම අරමුණු කර ගෙන තමයි ඒ යෝජනාව ගෙනාවේ. කෙසේ නමුත් ඒ යෝජනාවට අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් අපි අද මේ ගත කරමින් තිබෙන්නේ 21 වන සියවස. 21 වන සියවසේ නවීන තාක්ෂණය, විද්‍යාවේ දියුණුවේ හිනි පෙත්තටම අපි ගමන් කරමින් තිබෙනවා. නමුත් අපි විවිධ මිත්‍යා විශ්වාසවලට ඉතාම තදින් බැඳිලා ඉන්න සමාජයක්. විශේෂයෙන්ම මේ නාගරික සමාජය තුළත් ඒක අපට බහුලව දැක ගන්න පුළුවන්. ධනය, බලය, වාසනාව, නිරෝගීකම, ග්‍රහ දෝෂ, වස්තු

දෝෂ, භූමි දෝෂ, රැකියා ජයග්‍රහණ, පවුලේ දියුණුව, දේශපාලනයේ ඉහළට යාම, ජයග්‍රහණයන් ලබා ගැනීම, සතුරන් මැඩලීම, අධ්‍යාපන ජයග්‍රහණ, වාසනාවන්ත විවාහ ආදී මෙකී නොකී හැම දෙයක්ම, මේ සිතු පැතු සම්පත් ලබා ගන්න අපි විවිධාකාරයේ මිත්‍යාවන් පිටුපස හඹා යනවා. ඉතින් මේකත් අපේ සමාජයේ අද වෙලාගෙන තිබෙන එකක්. දේශපාලනයත් අද වෙලාගෙන තිබෙන්නේ. අද දේශපාලඥයන්ගේ අත් දෙක දිහා බැලුවාම අපට පේනවා ඔවුන්ගේ අත් දෙක මුදුවලින් පිරිලා ගිහිල්ලා. රත්තරන් කැලිවලින්. එහෙම නැත්නම් මැණික්වලින්. විවිධාකාරයේ දේවල්වලින් පිරිලා ගිහිල්ලා. වශී බෝල, වශී චක්‍ර, සමහරු රත්තරන් පොරවා ගෙන ඉන්නවා. සමහරු මේ බෝල කරකවනවා. ඉතින් මේක අපේ සමාජයේ බහුලව තිබෙනවා. අද දේශපාලනයේ විතරක් නොවෙයි. සෑම ක්ෂේත්‍රයකටම මේ මිත්‍යාව පැතිරිලා ගිහිල්ලා තිබෙනවා. ඉතින් එහෙම කාලයක අපේ දරුවන්ට බයිසිකල් ලබා දෙන්න යෝජනා කිරීමත් එක පැත්තකින් හොඳ යෝජනාවක්. මොකද, මේ දරුවෝ ගෙදරින් එළියට බස්සවන්න හයයි. ඒවාටත් රාහු කාලය බලනවා. නැත්නම් ඉර, හඳ, තාරකා දිහා බලලා තමයි දරුවන්ගේ කටයුතු විතරක් නොවෙයි. දෙමව්පියන්ගේ කටයුතුත් හැම දෙයක්ම කරන්නේ.

ඉතින් මේක ඇත්ත වශයෙන්ම අපි බලන්න ඕනෑ. අපේ සමාජයේ මේ මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. මම කැමැතියි, විද්‍යාව තාක්ෂණය ගැන කථා කරන්න. නමුත් ඊට කලින් හක්ගෙඩි ගැන, වාලම්පුරි ගැන, බෙලි කටු ගැන, ෆෙංෂුයි ගැන. මේවා ගැන අද කථා කරන්න ඕනෑ. මේ සමාජය පුරා පැතිරී තිබෙන මිත්‍යා විශ්වාස, මේවා වපුරන්න අද මාධ්‍ය අවකාශයත් ලබා ගෙන තිබෙනවා. ඔබතුමාගේ ඔවැනි යෝජනාවකට අඩුම ගණනේ මේ මාධ්‍ය අවකාශය ලබා දෙනවා නම් කොපමණ හොඳද. උදේට නැගිට්ටාම පැය ගණන් මේ රූපවාහිනී නාලිකා හැම එකකම උදේට සාස්තර කියනවා. අනාවැකි කියනවා. එහෙම නැත්නම් ග්‍රහ අපල දෝෂ බලනවා. අඳින්න ඕනෑ වර්ණය මොකක්ද කියලා කියනවා. ඉතින් මේවාට තමයි උදේ වරුවේම කාලය ගත වෙන්නේ. මේවා ප්‍රවර්ධනය කරන දේශපාලඥයෝත් ඉන්නවා. මේ ජාවාරම්කාරයින්ට, තක්කඩින්ට, බොරුකාරයින්ට, මේ අපරාධකාරයින්ට මාධ්‍ය අවකාශය ලබා දෙනවා. මේ මාධ්‍ය අවකාශය කියන්නේ මොකක්ද? මේ රටේ ජනතාවට අයිති දෙයක්. අද ටී.ආර්.සී. එක මොකක්ද කරන්නේ කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. කොහොම නමුත් මේ කාරණා පිළිබඳව අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. මට මතකයි. එක කාලයක හේතුවාදී සංගමය ඇවිල්ලා මේ විද්‍යාවේ, තාක්ෂණයේ තිබෙන වැදගත්කම පිළිබඳව, අපේ මිනිස්සු අවිද්‍යාවෙන් මුදවා ගන්න. ඒ වාගේම අපේ මිනිස්සුන්ගේ තිබෙන මේ මිත්‍යා විශ්වාස, යාග හෝම, ඒ වාගේම මේ ග්‍රහ විශ්වාස පිළිබඳව තිබෙන ඒවායින් මුදවා ගන්න විශාල ව්‍යාපාරයක් කර ගෙන ගියා. ආචාර්ය ඒබ්‍රහම් ටී. කොවූර් මැතිතුමා. ඊට පස්සේ එතුමාගේ ඒ ව්‍යායාමය ඉස්සරහාට ගෙන ගියා. මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමා. ඒ හැම කෙනෙකුම මේ විද්‍යාව හා තාක්ෂණයේ වැදගත්කම තමයි අවධාරණය කළේ. විද්‍යාත්මක කරුණු. දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි. මෙන්න මේ මිත්‍යා විශ්වාසත් අපේ සමාජයෙන් විශේෂයෙන්ම අද අපි මේ බස්නාහිර පළාත් සභාවේ මේ යෝජනාව ගෙනාවාම ඒ යෝජනාව මොකක්ද කියලාවත් දන්නේ නැතිව, ඒ යෝජනාව ඉදිරිපත් කරන්නවත් අවස්ථාව දෙන්නේ නැතිව තමයි ඒක ප්‍රතික්ෂේප කළේ. ඒ ගැන මම කනගාටු වෙන්නේ නැහැ. මොකද, මිත්‍යාවටම ගොදුරු වුණු වහල්ලු පිරිසක් ඉන්න සමාජයක, ඒ වහල්ලු පස්සේ යන, වශී බෝල කරකවන කට්ටිය පස්සේ යන සමාජයක් මේක.

දැන් ඔබතුමාගේ මේ යෝජනාව ඉතාම වටිනා යෝජනාවක්. මානව ඉතිහාසයේ, මානව ශිෂ්ඨාචාරයේ මිනිස්සුන්ගේ සොයා ගැනීම් අතරින් ඉතාම වැදගත්ම සොයා ගැනීම තමයි මේ බයිසිකලය කියලා කියන්නේ. ඇත්ත වශයෙන්ම මේ බයිසිකලය සොයා ගැනීමත් එක්ක අපේ කාර්යක්ෂමතාවය වැඩි වුණා. සමහරු කියනවා, මේ බයිසිකලයේ කාර්යක්ෂමතාවයක් නැහැයි කියලා. නමුත් බයිසිකලය තරම් - සමස්තය දෙස අරගෙන බැලුවාම, සමස්තයට ඇති කරන බලපෑම අරගෙන බැලුවාම මේක තරම් කාර්යක්ෂම උපකරණයක්, එහෙම නැත්නම් වාහනයක් තවත් නැහැ. මේක ඉතාම වටිනා සොයා ගැනීමක්. මේ සොයා ගැනීම නිසා අපේ මානව සමාජය කාර්යක්ෂම වුණා. සමාජය ඉස්සරහාට ගියා. අපේ ශරීර සෞඛ්‍ය, මානසික සෞඛ්‍ය දියුණු වුණා. නමුත් කාර්මික විප්ලවයෙන්, විශේෂයෙන්ම මේ රෝද හතරේ වාහන සොයා ගැනීමත් එක්ක සම්පූර්ණයෙන්ම මේක කිසියම් ආකාරයකට අඩ පණ වෙලා ගියා. නමුත් අපි කියන්න ඕනෑ. මේ බයිසිකලය කියන එක පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් විදියට අපි හඳුනාගන්න ඕනෑ. අපේ ළමා

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

කාලයේදී අපි සියලු දෙනාම බයිසිකල් පැද්දා. ඒ කාලේ අපට මේ බයිසිකල් පදිනවාය කියන එක ඇත්ත වශයෙන්ම අපේ ජීවිතයේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. ඒක ඇත්ත වශයෙන්ම අපේ ජීවිතයේ ඉතාම සුන්දරව කරපු, ඒ වාගේම අපේ ජීවිතවලට අලුත් අත්දැකීම් එකතු කරපු, ලෝකය හරහා යන්න - ඇත්ත වශයෙන්ම අපි ගෙදරට කොටු වෙලා හිටියා නම් ගෙදරින් එළියට පැන්නේ බයිසිකලේ අරගෙන. බයිසිකලයෙන් තමයි ගම දැක්කේ. ලෝකය දැක්කේ. ගම හරහා ගියේ. ලෝකය හරහා ගියේ. මේ අවස්ථාව සැලසුණේ බයිසිකලයෙන්. මොකද, බයිසිකලයක් පැද ගෙන යන කොට ඒක හරහා පරිසරය, මිනිස්සු, සතා සිව්පාවා, මේ හැම දෙයක් ගල්, වැලි, බොරළු, පස් කඳු මේ හැම එකක් හරහාම අපට යන්න අවස්ථාව ලැබුණා. ඒකට අපේ කාය ශක්තිය අවශ්‍යයි. මානසික ශක්තියත් අවශ්‍යයි. එහෙම නම් මෙවැනි වටිනා ප්‍රවාහන මාධ්‍යයක් ලෝකයට දායාද කරපු, ඒ සොයා ගැනීම කරපු මනුස්සයාට මම හිතන්නේ අපි සියලු දෙනාගේම ගෞරවය හිමි වෙන්න ඕනෑ. දැන් මේක අපට අහිමි වෙමින් තිබෙනවා. නමුත් විශේෂ කලාපවල අපි දන්නවා තවමත් මේ බයිසිකලය ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය බවට පත් වුණු තැන් තිබෙනවා. සමහර රටවල් ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු තීරණ අරගෙන තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ප්‍රවර්ධනය කරන්න. විශේෂයෙන්ම ආසියානු කලාපයේ රටවල් අතරින් චීනය මාඕ සේතුංගේ නව මහජන චීන සමූහ ආණ්ඩුව තුළ මුලින්ම ප්‍රවර්ධනය කරපු ප්‍රවාහන මාධ්‍ය තමයි බයිසිකලය.

ඒ වාගේම තමයි අපි තායිලන්තයට ගියොත්, වියට්නාමයට ගියොත්, මියැන්මාරයට ගියොත් මේ සෑම රටකම අද ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යයක් විධියට ඒ රටවල්වල, නගරවල පවා. කොරියාවට ගියත් එහෙමයි. මේ රටවල්වල ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යයක් බවට බයිසිකලය පත් වෙලා තිබෙනවා. ඇයි අපේ රටට මේක භාවිතා කරන්න බැරි වෙලා තිබෙන්නේ. අද අපේ රටේ මාර්ග පද්ධතිය තුළ ඇති වෙලා තිබෙන මේ විශාල තදබදය මේකට මූලික හේතුවක්. සහ අනාරක්ෂිත බව. අවදානම. ඒ නිසා කිසියම් ආකාරයකට මේ සඳහා අවශ්‍ය වෙලා තිබෙනවා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සහ යටිතල පහසුකම්වල විධිමත් භාවයක් ඇති කරන්න ඕනෑ. මාර්ග පද්ධතිය තුළ අනිවාර්යයෙන්ම පාපැදි සඳහා වෙනම මංතීරුවක් ඇති කරන්න ඕනෑ. ඒ මංතීරුවට වෙනම කලර් කෝඩ් එකක් දෙන්න ඕනෑ. ඒ මං තීරුව අනාරක්ෂිත නොවෙන්න ඕනෑ. ඒ වාගේම ඒකේ පාසල් දරුවන්ට විතරක් නොවෙයි. මේ රටේ රාජකාරි සඳහා යන සෑම කෙනෙකුටම ඒ මංතීරුව පාවිච්චි කරන්න පුළුවන් ආකාරයට එය සකස් කරන්න ඕනෑ. විශේෂයෙන්ම නගර ආශ්‍රිතව.

අපට උදාහරණයක් විධියට ගත්තොත් අද කොළඹ නගරයේ කොටුව දුම්රියපොල ඉදිරිපිට කොටුව දුම්රියපොලට එන ඒ මගීන්ට තමන්ගේ සේවා ස්ථාන කරා යන්න පුළුවන් ආකාරයට ඒ දුම්රියපොල ඉදිරිපිට නොමිලයේම ලබා ගන්න පුළුවන් ආකාරයට බයිසිකල් අපි ලබා දුන්නොත් ඒ අයට තමන්ගේ සේවා ස්ථානය කරා යන්න පුළුවන් ආකාරයට මං තීරු සකස් කරලා නොමිලයේම ඒ පා පැදි ලබා දෙන ක්‍රමවේදයක් අපි සකස් කරන්න ඕනෑ. දැන් මෙවැන්නක් අපට දැක ගන්න පුළුවන් චීනයට ගියාම. චීනයේ බීජිං නගරයේ තැනින් තැන දහස් ගණන් බයිසිකල්, පාපැදි අද දාලා තිබෙනවා. ඕනෑම කෙනෙකුට බයිසිකලයක් ගත්තා. තමන් කැමැති සේවා ස්ථානයට ගියා. ඒ කටයුත්ත කර ගෙන බයිසිකලය එතැන දාලා එන්න පුළුවන්. ඒක නැවත ගෙන එන එක. ඒ සඳහා ඔවුන් හදලා තිබෙනවා අලුත් තාක්ෂණය යටතේ, මේ තොරතුරු තාක්ෂණය යටතේ අලුත් ඇප් එකක් හදලා තිබෙනවා. බයිසිකලය කොහේද ගිහිල්ලා දැම්මේ කියලා ඔවුන්ට බලාගන්න පුළුවන්. ඒ වාගේ අපි බලන්න ඕනෑ කොහොමද මේ බයිසිකලය අපි පාවිච්චි කරන්නේ. හැබැයි, විශේෂයෙන්ම මේ සමකය ආසන්න කලාපයේ උෂ්ණත්වය අධික අපේ රටවල්වල තිබෙන ප්‍රශ්නයක් තමයි දූවිල්ල සහ අධික උණුසුම. ඒ නිසා බොහෝ දෙනා පාරට බැහැලා මේ බයිසිකල් පැදගෙන යන්න අකමැතියි. මම දැක්කා පසුගිය කාලයේ. විශේෂයෙන්ම අපට ආදර්ශයක් වුණා කොළඹ විද්‍යාලයේ මහාචාර්යවරයෙක් විධියට කටයුතු කරන පුද්ගලයෙක්. ඔවුන් දිනපතා බයිසිකලයෙන් තමයි විශ්ව විද්‍යාලයට ආවේ. දැන් මේ වාගේ ඔවුන් අද මේක විලාසිතාවක් බවට පත් කරන්න අවශ්‍ය කරන ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. මේ විධියේ කලාප හඳුනාගන්න ඕනෑ. කොළඹ නගරයේ මොන කලාපයට ද අපි මේ බයිසිකල් යොදවන්නේ. ප්‍රවාහනයෙන් යම්කිසි, බස් රථවලින් එහෙම නැත්නම් පාසල් වෑන් රථවලින් එන දරුවන්ට එක ස්ථානයක ඉඳලා තමන්ගේ පාසල කරා විනාඩි 15 ක් හෝ පැය භාගයක් හෝ පාපැදිය පැදගෙන තමන්ගේ පාසලට යන්න පුළුවන් ආකාරයට කණ්ඩායම් වශයෙන් උදේට

ඒ දරුවන්ට පාසලට යන්න අවශ්‍ය කරන ක්‍රමවේදය සකස් කරන්න ඕනෑ. එතැන සිට නැවත වතාවක් තමන්ගේ පාසල් වෑන් රථයට එන්න විනාඩි 15 ක් හෝ පැය භාගයක කාලයක් මේක ඔවුන්ගේ දෛනික ක්‍රියාවලියේ ශාරීරික අභ්‍යාසයක් විධියටම ඔවුන්ට කරන්න පුළුවන්. ඒ වාගේම උදේට කොටුව දුම්රියපොලට රාජකාරී සඳහා එන අපේ රාජ්‍ය සේවකයින්ට හා පුද්ගලික අංශයේ සේවකයින්ට තමන්ගේ සේවා ස්ථානවලට යන්න අවශ්‍ය ආකාරයට බයිසිකල් නොමිලයේ ලබා දෙන ක්‍රමවේදයක් සහ මංතීරු සකස් කරන්න ඕනෑ. ඒ තුළින් අපට මේ රටේ ඇති වෙමින් තිබෙන මේ විශාල මාර්ග තදබදයට විසඳුමක් විතරක් නොවෙයි. අපේ ජනතාව අතර වේගයෙන් පැතිර යමින් තිබෙන බෝ නොවන රෝගවලටත්, ඒ වාගේම මේ මානසික වශයෙන් ඇති වෙමින් තිබෙන ආතතිය සහ පීඩනයටත් කිසියම් ආකාරයක විසඳුමක්, පිළිතුරක් මේකෙන් සොයන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ඉතාම වටිනා යෝජනාවක්. හැබැයි, මේවා අරගෙන ක්‍රියාත්මක කරන්න පුළුවන් ඒ නවීනත්වය පිළිබඳව, ඒ වාගේම තාක්ෂණය පිළිබඳව අදහසක් තිබෙන ඒ පිළිබඳව දැක්මක්, දර්ශනයක් තිබෙන නායකයෝ අද මේ රටට අවශ්‍යයි. නිකම් ඇවිල්ලා වල්පල් කථා කරනවා. කුණුහරුප කියනවා. බණිනවා. අතීත කථා කියනවා. මේවායින් ඇති වැඩක් නැහැ. මේ රට අනාගතයට ගෙනියන්න නම්, මේ රට දියුණුව සංවර්ධනය, නවීන තාක්ෂණය සහ නව්‍යකරණය ඔස්සේ මේ රට ඉස්සරහාට ගෙනියන්න නම්, ඒ නව උත්පාදනය ඔස්සේ මේ රට ඉදිරි පියවරක් තියන්න නම්, ඒ තාක්ෂණික විප්ලවය අවශ්‍යයි. අද මේ රටේ ආර්ථිකය බෙලහීන වෙලා තිබෙන්නේ. සමාජය බෙලහීන වෙලා තිබෙන්නේ. දේශපාලනය බෙලහීන වෙලා තිබෙන්නේ. එක පැත්තකින් පවුල්වාදයට දේශපාලනය යට වෙලා. එහෙම නැත්නම් ගජමිතුරුවාදයට දේශපාලනය යට වෙලා. තමන්ගේ යාළු මිත්‍රයෝ ටික පමණක් රජ කරවන්න යන, එහෙම නැත්නම් පාසල් දෙක තුනක ඉන්න ඒ අයට විතරයි මේ රට පාලනය කරන්න පුළුවන් කියලා කල්පනා කරනවා. ඒ අයට විතරයි මේ DNA තිබෙන්නේ, ජාන තිබෙන්නේ කියලා ඒ අය හිතනවා. අනික් අයට මේක කරන්න බැහැ. අනික් අයගේ ඇඟේ තිබෙන්නේ මඩ. ඒ අයගේ ඇඟේ විතරයි ලේ තිබෙන්නේ කියලා ඒ කට්ටිය හිතනවා. තව කට්ටිය හිතනවා, පවුලෙන් - මේක අර රාජාණ්ඩු ක්‍රමය වාගේ ජන සම්මතවාදයෙන් රාජාණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක කරන්න සමහරු උත්සාහ කරනවා. තමන්ගේ පස්සෙන් පුතාට. ඊට පස්සේ මාමාට. එහෙම නැත්නම් ඊළඟට නෝනාට. මේක මේ ක්‍රමයක් විධියට. කුසලතාවාදයට මුල් තැන් දීලා මේ රට ඉදිරියට ගෙනියන්න අපි කල්පනා කළේ නැත්නම් මේ රට අගාධයට යන එක වළක්වන්න බැහැ. අද මේ කලාපයේ සියලු රටවල් ඉස්සරහාට යන්නේ, චීනය වේවා. ජපානය වේවා. කොරියාව වේවා. මේ හැම රටක්ම ඉස්සරහාට යන්නේ ඒ කුසලතාවාදය මත.

ඒ නිසා අපි කවුරුවත් ඔබතුමාවත් මමවත් කවුරුවත් මේ රත්තරන් හැන්ද කටේ ගහගෙන එන අය නොවේ. නිදහස් අධ්‍යාපනයේ ඉනිමග දිගේ ඉහළට නැගපු අය. සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමාට පින් සිද්ධ වෙන්න. අන්න එතුමා ඒ ලබා දුන්න නිදහස් අධ්‍යාපනය නිසයි අපි මධ්‍ය මහා විද්‍යාලවලින් ඉහළට නැගලා මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි දකින්නේ, මේ රට වෙනස් කරන්න ඕනෑ නම් මේ විද්‍යාවේ, තාක්ෂණයේ වෙනසක් අපි ඇති කර ගෙන, විප්ලවයක්, පෙරළියක් ඇති කර ගෙන මේ රට අනාගතයට ගෙනියන්න ඕනෑ. එහෙම නැතිව මේ පවුල්වාදය මත බුද්ධං සරණං, ධම්මං සරණං, සංඝං සරණං කියලා එකම පවුලේ කට්ටියක් වැඳ මාන කර ගෙන යන මේ දේශපාලන ගමන නතර කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මේ රාජකීය තෝමස් කියන සෙන් තෝමස්, ආනන්ද, නාලන්ද මේකෙන් විතරයි මේ රට පාලනය කරන්න පුළුවන් කියලා කට්ටියක් හිතනවා. ඒ නිසා මේ Royal මානසිකත්වයෙනුත්, මේ ගජමිතුරුවාදයෙනුත් අපේ රට මුදා ගෙන දේශපාලනයේ කුසලතාවය මත ඉස්සරහාට යන්න කල්පනා කළේ නැත්නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනාගතයක් නැහැ. ඔබතුමාට අනාගතයක් නැහැ. මටත් අනාගතයක් නැහැ. අපි කාටත් අනාගතයක් නැහැ. අපේ දරුවොත් අවසාන වශයෙන් වහල්ලු බවට පත් වෙලා මේ රට අතහැරලා යන පිරිසක් බවට පත් වෙන එක වළක්වන්න බැහැ. ඒ නිසා මේ යෝජනාව ඉතාමත් කදිම යෝජනාවක්. අපි මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අපි වැඩ පිළිවෙළක් සකස් කරමු. ඒ සඳහා අපි සියලු අමාත්‍යාංශ ඒකාබද්ධ වෙලා අවශ්‍ය කරන ක්‍රියාන්විතයක් අපි ක්‍රියාවට නංවමු. මේවා සංකල්පීය තලයේ විතරක් අදහස් යෝජනා විධියට තියාගන්නේ නැතිව ප්‍රායෝගික තලයට ගෙනැල්ලා ප්‍රායෝගික මිනිස්සු විධියට මේ රට අපි වෙනස් කරන්න කල්පනා කරමු. එහෙම නැත්නම අපේ රට

[ ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

අගාධයට යනවා විතරක් නොවෙයි. මේ ඉන්දියන් සාගරයේ කඳුළු සලන පාරාදීසය බවට අපේ රට පත් වන එක වළක්වන්න බැහැයි කියන එක ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.18]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා විසින්ම ඉදිරිපත් කරන මේ කාලෝචිත යෝජනාව සම්බන්ධව මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. මොකද, ඇත්තටම ඔබතුමාත් මමත් කළුතර දිස්ත්‍රික්කයේ පදිංචි අය. කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව තමයි අපි ජනතා නියෝජිතයෝ හැටියට පත් කරලා එවන්නේ. ඉතින් පැහැදිලිවම මම හිතනවා, මේක ඉතාමත් වැදගත් වෙනවා. අනික් දිස්ත්‍රික්වලට වැදගත් නොවෙනවා නොවෙයි. මෙම යෝජනාව කළුතර දිස්ත්‍රික්කයට බොහොම වැදගත් යෝජනාවක් වෙනවා. මොකද, ඒකට හේතුව. අපි දන්නවා. තවමත් අපේ පාසල් පද්ධතිය ගත්තාම අපේ දුෂ්කර පාසල් ප්‍රමාණය වැඩියි. අනික් එක අපේ පැතිවල අඩු ආදායම්ලාභී ජනතාව වැඩියි. පාසල් නොයන ප්‍රමාණය වැඩියි. මේකට හේතු අරන් බැලුවාම ගොඩක් වෙලාවට මේ ජනතාවට, දෙමව්පියන්ට තිබෙන ආර්ථික පීඩනයත් එක්ක තමයි ගොඩක් වෙලාවට පාසල් නොයන ප්‍රමාණය වැඩි වෙන්න ප්‍රධානම හේතුව. ඒ නිසා අද ජනතාවට අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ, ලොකු පහසුවක් වෙනවා මේ දුප්පත් දරුවෙකුට පාපැදියක් ලබා දීම. ඒ පාපැදිය ලබා දුන්නාට පස්සේ මේකේ පැහැදිලිවම අර මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ ගොඩක් දේවල්වලට අපි එකඟ වෙනවා. මොකද, මේක පාසල් දරුවෙකුගේ පාපැදියක් කියන එක හඳුනාගන්න තිබෙන එක බෙහොම වැදගත්. මම කියන්නේ, මෙන්න මේවා පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙම යෝජනාව පිළිබඳව මේක කථා කළාට පස්සේ, මේක සම්මත වුණාට පස්සේ මේක අත්හැරලා දාන්න එපා. මේක පළාත් සභාවේ කමිටුවක් පත් කරලා, මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් බලලා, මේ ටික හරි තැනකට ගෙනැල්ලා මේක ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියන ගෞරවනීය ඉල්ලීම මම ඔබතුමාගෙන් කරනවා. මොකද, එහෙම කරන්න හේතු ගණනාවක් තිබෙනවා. මට මතකයි, මම පළමුවෙන්ම පළාත් සභාවට ආපු වෙලාවේ - මගේ මේ දෙවැනි පළාත් සභාව යන්නේ. පළාත් සභාවට ආපු වෙලාවේ ඔබතුමා දන්නවා. අපි පළාත් පාලන ආයතනවල හිටපු සභාපතිවරු. අපි ඒවායේ කරපු දේවල්. අපට මතකයි අපි පළාත් පාලන ආයතන මේ ලංකාවේ තිබෙන හොඳම පළාත් පාලන ආයතන බවට පරිවර්ථනය කරපු අය. අපි ඒවායේ හොඳ දේවල් අරගෙන අපි මේ පළාත් සභාවට යෝජනාව ගෙන ආවා. යෝජනා ගෙනාවාට පස්සේ මම කියන්න කනගාටුයි. අද මේ වන කල් ඒ එක යෝජනාවක්වත් මේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වෙලා නැහැ. දවසක් පුරා මන්ත්‍රීවරු කථා කරලා, අපි කරුණු කාරණා සොයාගෙන ඇවිල්ලා මේක බොහොම මහන්සියෙන් තමයි අපි ගොඩක් වෙලාවට කථා කළේ. මට අද වාගේ මතකයි. කොළඹ දිස්ත්‍රික්කයෙන් පත් වුණු දැන් අප අතර නැති දිවංගත අපේ රාජා මන්ත්‍රීතුමාව ඒ පළාත් සභාවේ ඉන්න කොට මට අද වගේ මතකයි මන්ත්‍රීතුමා එළියේ ඉන්න කොට මම ඇහුවා, මන්ත්‍රීතුමාගෙන්. කවදාවත් මේ යෝජනාවක්වත් දාන්නේ නැත්තේ ඇයි කියලා. ඒ ගමන එතුමා මට කිව්වා. මල්ලී, අපිත් උඹලා වාගේ තමයි. මුලින් ආපු කාලයේ අපි ඕනෑතරම් යෝජනා දැම්මා. ඒ යෝජනා එකක්වත් වැඩක් නැහැ.

ඒ නිසා අපි යෝජනා දාන එක නවත්වලා තිබෙන්නේ කියලා. ඉතින් මට හරිම කනගාටු හිතුනා මේ පළාත් සභාව පිළිබඳව. ඒ නිසා මම කියන්නේ. මේක මෙහෙම යන්න දෙන්න හොඳ නැහැ. ඒ නිසා තමයි ජනතාවට මේක දැනෙන්නේ නැත්තේ. පළාත් සභාවක් තිබෙනවාය කියලා ජනතාවට දැනෙන්නේ නැත්තේ ඒකයි. අපි හැමදාම කරන්නේ අපට අවුරුද්දට ලැබෙන ලක්ෂ 25 හරි 30 හරි 50 හරි නැත්නම් ලක්ෂ 100 හරි අපි පාරවල් වාගේ ඒවාට දානවා. අපට නිර්මාණශීලී දෙයක් කරන්න මේ මුදල මදි. මොකද ඒකට හේතුව. ඒකට යම් යම් නිර්ණායකයන් තිබෙනවා. අපට දෙන මුදලේ. පරිසරයට මෙපමණයි. මහාමාර්ගවලට මෙපමණයි. ආර්ථික සංවර්ධනයට මෙපමණයි කියලා නිර්ණායක තිබෙනවා. ඒ නිර්ණායකයන් එක්ක බැලුවාම අපට නිර්මාණශීලී දෙයක් කරන්න මෙතැන හරි අමාරුයි. ඒ නිසා මම කියන්නේ මේ වාගේ හොඳ යෝජනා මේ ඉතිහාසයේ ඉඳන් අරගෙන

ආපු මේ යෝජනා අරගෙන වෙනම කමිටුවක් පත් කරලා මේ හොඳ යෝජනා ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. මට මතකයි. අපි බස්නාහිර පළාතේ අපේ පූර්ව ළමා විය මධ්‍යස්ථාන පිළිබඳව. බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කරන්න ඕනෑ විධිය මම මේ පළාත් සභාවට යෝජනාවක් ගෙනාවා. මොකද, ඒක සාර්ථක වැඩ පිළිවෙළක්. මොකද, මම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් ඉන්න කාලයේ මේ බස්නාහිර පළාතේ නිලධාරීන් ගිහිල්ලා තමයි මේක බලලා, මේක හොඳ වැඩ පිළිවෙළක් කියලා මට ලකුණු දුන්නේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට. හැබැයි, ඒ ලකුණු දීලා, ඒ ලකුණු දීපු පෙර පාසල් පද්ධතිය ඒ වාගේම අපි ගෙනාපු ඒ කසළ කළමනාකරණ ව්‍යාපෘති, ඒ වාගේ අපි කරපු වැඩ සටහන් පළාත් සභාව තුළ ලකුණු දුන්නාට පළාත් සභාවෙන් ඒක කෙරෙන්නේ නැහැ. පළාත් සභාවෙන් ඒක අපි කරපු විධියට කරන්න ඉඩක් නැහැ. ඉතින් ඒ නිසා මම දැකපු දේ තමයි. ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. ඊට පස්සේ මම මෑතකදී පෙර පාසල් ගුරුවරු සම්බන්ධව යෝජනාවක් දැම්මා. ඒවා ක්‍රියාත්මක කරනවාය කියලා ගිය අවුරුද්දෙත් කිව්වා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. මම බලාපොරොත්තු වුණා මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙයිද කියලා. මේ අවුරුද්දේවත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. ඉතින් මේ වාගේ විටින් විට යෝජනා දාලා තිබෙනවා. ඒ යෝජනා ක්‍රියාත්මක නොවීම පිළිබඳව අපි බොහොම කනගාටු වෙනවා.

ඒකත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කනගාටු වෙනවා. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය ගත්තාම ද්‍රවිඩ පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. වතු පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අද අපි කනගාටු වෙන්න ඕනෑ. මම ඒ පාසල්වලට ගියාම ඒ පාසල්වල ගුරු පුරප්පාඩු තිබෙනවා. පාසල් පටන් ගත්ත දවසේ ඉඳන් ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය ගුරුවරු. මම හිතන්නේ, පළාත් සභාව පටන් ගත්ත දවසේ ඉඳන් පළාත් සභාව තිබෙන දවසේ ඉඳන් අපි බැලුවාම ඒ පාසල්වල විද්‍යාව, ගණිත ගුරුවරු නැහැ. අද නිකම් හිතන්නකෝ විද්‍යාව, ගණිතය ගුරුවරයෙකු නැතිව කොහොමද දරුවෙක් සාමාන්‍ය පෙළ සමත් වෙන්නේ කියලා. ඒ අයට අසාධාරණයක් නොවෙයිද මේක. මම කියන්නේ, වෙනත් රහස් සංවිධානයක් ආවොත් ඒකට බැඳෙන එක අරුමයක් නොවෙයි. මොකද, ඒකට හේතුව ඉතිහාසයේ ඉඳන් අරගෙන බැලුවාම මම දැකලා නැහැ. මම මේක පළාත් සභාවේ විටින් විට කථා කළා. කථා කළාට පස්සේ අධ්‍යාපන ඇමතිතුමා, ඒ නිලධාරී මණ්ඩලය, මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. දැන් මේ කාලය තුළවත් වැඩ පිළිවෙළක් හදන්න. තව අවුරුද්දකින් දෙකකින් හරි ඒ පාසල්වලට ගුරුවරු ටික දෙන්න. ඒ පාසල් ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. මේක හරිම ඛේදවාචකයක්. විද්‍යාව, ගණිතය ගුරුවරු මම හිතන්නේ ඒ පාසල් පටන් ගත්ත දවසේ ඉඳන්ම ඒ පාසල්වල ඒ ගුරුවරු නැහැ. මේ පළාත් සභාව පටන් ගත්ත දවසේ ඉඳන්ම ඒ පාසල්වල නැහැ. ඉතින් එහෙම පළාත් සභාවක් මොකටද තිබිලා, මම අහන්නේ. ඉතින් ඒ නිසා තමයි මේ ජනතාව කියන්නේ මේවා සුදු අලි කියලා. ඒ නිසා මෙන්න මේවා නැති කරන්න පුළුවන්, ජනතාවගේ ඒ අදහස් නැති කරන්න පුළුවන් මේ පළාත් සභාවේ ඉන්න විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩලයට. අද අපි කනගාටුයි. අද මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය ගැන අපි කථා කරන්නේ. අද අධ්‍යාපන අමාත්‍යවරයා නැහැ මෙතැන. අමාත්‍යවරයා තමන්ගේ විෂයයට ආදරේ නම්, තමන්ගේ අමාත්‍යාංශයට යමක් කරන්න ඕනෑය කියලා හිතනවා නම් තමන් සියලු දේ දන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ වෙන්නේ. ඒවා මෙතැන ඉඳගෙන සටහන් කර ගෙන ඒවා ක්‍රියාත්මක කරන්න වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. මේක විහිළුවක් නොවෙයි. තමන් මේකේ සුරසැප විඳලා හරියන්නේ නැහැ. තමන් මේ දෙන වරප්‍රසාද අරගෙන හරියන්නේ නැහැ. ඒකට නොවෙයි මේවාට එන්නේ. අමාත්‍යාංශ භාර ගන්නේ. ඒ වරප්‍රසාද භුක්ති විඳින්න විතරක් නොවෙයි. මේ ජනතාවට සේවයක් කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවුරුද්දේ පළමුවැනි වසරට ඇතුළත් කර ගන්න බැරි වුණාම අවුරුද්ද අවසාන වෙනකල් දරුවාට පාසලට යන්න බැරි වෙනවා. බස්නාහිර පළාත තුළ. මේවා කනගාටුදායක සිදුවීම්. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මේ යෝජනාවත් ඒ විධියටම හමස් පෙට්ටියට යවන්න එපා. එහෙම කරන්නේ නැතිව මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්නය කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක කරන කොට පැහැදිලිව පළාත් සභා, ප්‍රාදේශීය සභා පාරවල් තිබෙන්න පුළුවන්. මහ ආණ්ඩුවේ පාරවල් තිබෙන්න පුළුවන්. මෙන්න මේ අයත් එක්ක මේක සම්බන්ධීකරණය කරන්න ඕනෑ. සම්බන්ධීකරණය කරලා මේ දරුවන්ට යන්න වෙනම

[ ගරු ලලිත් එල්ලාවල ]

ඒ පාරේ වෙනම කොටසක් වෙන් කරන්න වෙනවා. අද අපි ගත්තාම පාරේ අපි දරුවා යවලා - එදා එල්.ටී.ටී.ඊ. කාලයේ භය තිබුණේ, කොහේ හරි බෝම්බයක් පුපුරලා, යන කෙනාට මොකක් වෙයිද දන්නේ නැහැයි කියලා. මිය යයි කියලා භය තිබුණේ. හැබැයි, ඒක නිදහස් කළා අපේ පස් වැනි විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් යුතුව. අද ඒ කටයුත්ත එහෙම කරලා අද පාරට බැස්සාට පස්සේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපට එන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. පාරේ වාහනවල යන කොට ඒවායේ විනයක් නැහැ. විනයක් නැතිව ගිහිල්ලා අපි අනන්තවත් දකිනවා මේ කටයුතු වෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මේ දරුවෝ යන කොට දරුවාට වෙනම කොටසක් වෙන් කරන්න වෙනවා. මේ දරුවාට පාරේ යන්න. එහෙම වුණොත් තමයි විදුහල්පතිවරු, ගුරුවරු මේ කටයුත්ත කරන්නේ. අපි පැහැදිලිව මතක් කරන්න ඕනෑ. අපි ඉතිහාසයේ ඉඳන් ගත්තාම මේ යෝජනා එකක්වත් ක්‍රියාත්මක වෙලා නැත්නම් මේ හොඳ යෝජනා. අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ අප්‍රේල්වලින් අපේ කාලය ඉවරයි. ඊට පස්සේ මේ බස්නාහිර පළාත් සභාව අපි පොහොට්ටුවේ පාලනයට අරගෙන සියලුම හොඳ යෝජනා ක්‍රියාත්මක කරන්න අපි වැඩ පිළිවෙළක් හදනවාය කියන එක මතක් කරමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.30]

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ බලාපොරොත්තුව නම් ඉටු වෙයිද කියලා නම් කියන්න බැහැ. මොකද, අනිවාර්යයෙන්ම ඊළඟ සැරේ එක්සත් ජාතික පක්ෂ බලයක් පිහිටුවනවා. ඒකයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පළාත් පාලන මැතිවරණයත් පරාදයි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය දීර්ඝ කිරීමකින් තොරව සභාව පවත්වාගෙන යන්න හැකිද කියලා ඔබතුමාගෙන් පොඩ්ඩක් අහනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් පස්වරු දෙක වෙනකල් යන්න පුළුවන්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ගෙනාපු මේ යෝජනාව ඉතාම කාලෝචිතයි. නමුත් ගැටළුව තිබෙන්නේ, ඔබතුමා මේකේ දාලා තිබෙනවා මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන උපමාන පාදක අරමුදල් මගින් යම් ප්‍රතිශතයකට යටත්ව ප්‍රතිපාදන වෙන් කර දීමට අවස්ථාව සලසා දීම සුදුසුයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ලැබෙන්නේ ඉතාම සොච්චම් මුදලක්. මෙවර ඒකත් ලැබෙයිද කියන්න බැහැ. ඒ ලැබෙන මුදල් ප්‍රමාණයෙන් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට අර ප්‍රතිශතයක් හැටියට යම් යම් ශීර්ෂයන්වලට ගියාට පස්සේ අපට ලැබෙන්නේ ඉතාම සුළු මුදල් ප්‍රමාණයක්. එතකොට දරුවන් සඳහා බයිසිකල් ලබා දීමට මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත වෙන්න පුළුවන්. නමුත් යම් පිරිසක් ලබා දෙන කොට තවත් පිරිසක් අහනවා, ඇයි අහවල් මන්ත්‍රීවරුන් මේ විදියේ බයිසිකල් එහෙම ලබා දෙනවා. ඇයි ඔබතුමන්ලාට ඒ දේ කරන්න බැරි කියලා කිව්වාම අපට ලැබෙන සුළු මුදලින් දැන් බයිසිකලයක් සාමාන්‍යයෙන් වෙළඳපොළේ රු. 15,000 ක් වාගේ මුදලක් වෙනවා. එතකොට රු. 15,000 ගණනේ 10 ක් අරන් දුන්නත් පාසල්වල විශාල දරුවෝ සංඛ්‍යාවක් ඉන්නවා. ඒ නිසා මේක ඉතාම හොඳ යෝජනාවක්. මේ යෝජනාව පොදුවේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා භේදයකින් තොරව සියලුම ගරු මන්ත්‍රීවරුන්ට යම් විධියකින් ලැබෙන යෝජනාවක් විධියට ගෙනාවොත් මම හිතනවා ඉතාමත් සාර්ථකයි කියලා. නැත්නම් ප්‍රතිපාදන බෙදා දීමේදී ලැබෙන සුළු මුදලත් එක්ක ගැටළුවක් ඇති වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ගෙන ඒමේදී ඔබතුමා මේකේ සඳහන් කරලා තිබෙනවා, පාසල් දරුවන් ප්‍රවාහනය කරන වාහනවල තිබෙන සංස්කෘතිය මත යම් යම් ගැටළු මතු වෙනවාය කියලා. එතකොට දැන් හරි ගැටළුවක් තිබෙනවා. පළමු වැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදී අපි ඇතුළත් කර ගන්නේ ආසන්න පදනම මත. එතකොට ආසන්න පදනම මත දරුවන් ඇතුළත් කර ගන්න කොට කොහොමද මේ වැන් සංස්කෘතියක් ඇති

වෙන්නේ. අපි අර උගුරට හොරා බෙහෙත් බොනවා වාගේ මේකට පිටින් දරුවෝ එන්න ඕනෑ. අපි ගත්තොත් එහෙම කොළඹ පාසල්. පස් වන ශ්‍රේණිය සමත් පාසල්, අපි හිතමු ශිෂ්‍යත්වයෙන් එන ළමයින් කියලා. නමුත් ශිෂ්‍යත්වයෙන් එන ළමයින්ට පෙර පළමුවැනි ශ්‍රේණියේ ඉඳන් පස් වැනි ශ්‍රේණිය දක්වා විශාල ළමුන් සංඛ්‍යාවක් තමුන්ගේ බල ප්‍රදේශයේ, නැත්නම් පාසල් ආසන්නයේ නොවන ප්‍රදේශවලින් එනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංස්කෘතියක් ඇති වෙන්න මූලිකම හේතුව අර ප්‍රදේශවලින් තමන්ගේ දරුවන් ලබා ගන්නේ නැති වීම. එසේ නොවුණා නම් අපි නම් ඉස්සර පාසල්වලට යද්දී, අපි සමහර විට කොළඹට එන්න ඉස්සෙල්ලා මම ඉගෙන ගත්ත එක් පාසලක් තමයි කන්තලේ ගංතලාව මහා විද්‍යාලය. ඇත්තටම පාසලට ගියේ බයිසිකලයෙන් තමයි. බයිසිකලයේ යන්න කිලෝ මීටර් තුනක්, තුනහා මාරක් බයිසිකල් පැදගෙන යන්න ඕනෑ. ඒක අපේ සංස්කෘතිය. ඒක එදා එහේ ඒ වියලි කලාපයේ, ඒ ත්‍රිකුණාමලය වාගේ ප්‍රදේශවල බහුල වශයෙන් දරුවෝ පාසල්වලට එන්නේ බයිසිකලයෙන් තමයි. දැන් අදත් ඒ සංකල්පය එහෙම්මයි. මම මෑතකදීත් ගියා යාපනයේ ත්‍රිකුණාමලයේ ප්‍රදේශයේ. යාපනයේ දරුවෝ උදේ පාන්දර ගත්තාම රොත්ත පිටින් මහ පාරේ බයිසිකල් පාවිච්චි කරන්නේ. එතකොට මාර්ග ආරක්ෂාව පිළිබඳවත් එහෙම ගැටළුවක් මොකුත් නැහැ. ඒ දරුවෝ එක දිගට, එක පෙළට විශාල වශයෙන් පාවිච්චි කරන්නේ බයිසිකලය.

ඒ නිසා ඔබතුමාගේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්. මේ යෝජනාව ගෙන ඒමේදී දැන් අපේ මහින්ද මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට දැන් සංස්කෘතිය, එහෙම නැත්නම් විද්‍යාත්මකව දියුණු වුණු රටවල් තමයි යුරෝපීය රටවල්. මේ යුරෝපීය රටවල්වල පවා අදත් බයිසිකල් පාවිච්චි කරනවා. අද නෙදර්ලන්තය, චීනය, ජපානය, ජර්මනිය, ජපානය, ස්වීඩනය, ස්විස්ටර්ලන්තය, නෝර්වේ, ඩෙන්මාර්ක් වාගේ ඒවා තමයි ප්‍රමුඛස්ථානයේලා තිබෙන්නේ. මම ටික වෙලාවක් තිස්සේ අන්තර්ජාලය ඔස්සේ බල බලා හිටියේ. අද ලෝකයේ වාහන පාවිච්චි කරන එකෙන් වැඩිපුර භාවිතා කරන්නේ බයිසිකලය. ඒ නිසා මේක හොඳ සංකල්පයක්. දැන් මම දැක්කා පිළියන්දල ඉඳන් මොරටුව දක්වා මංතීරුවක් ඈලා තිබෙනවා, බයිසිකල් සඳහා. දෙපැත්තෙන්ම තිබෙනවා. යන්නත් තිබෙනවා. එන්නත් තිබෙනවා. පිළියන්දල ඉඳන් විශ්ව විද්‍යාලය ඔස්සේ මං තීරු දෙකක් තියලා තිබෙනවා. දැන් මෑතකදී ආරම්භ කළා අපේ බස්නාහිර පළාත් සංවර්ධන ඇමතිතුමා. පායලී චම්පික රණවක ගරු ඇමතිතුමා. අලුතෙන් හඳුන්වලා දුන්න සංකල්පයක්. බස් මංතීරුවක්. උදේ පාන්දර. ඉතාම සාර්ථකයි. ඒ තීරුවේ යන්නේ බස් එක. ඒ බස් එක එහාට මෙහාට ඉස්සර වාගේ යන්නෙ නැහැ. ඒ නිසා ඔබතුමා අර මීට පෙර සාකච්ඡා කරපු ආකාරයට මේකේ නගර සභාවට අයිති පාරවල් තිබෙනවා. පළාත් සභාවට අයිති පාරවල් තිබෙනවා. මධ්‍යම රජයට අයිති පාරවල් තිබෙනවා. මේක ජාතිකමය වශයෙන් වැදගත්කමක් ඇති දෙයක් හැටියට ඔය මහා මාර්ග හා සම්බන්ධ වුණු ඒ ආයතනත් එක්ක සාකච්ඡා කරලා මම දැන් මේ අන්තර්ජාලයේ සැරිසරද්දී මම දැක්කා කහ පාටින් තීරුවක් තිබෙනවා. නෙදර්ලන්තයේ එහෙම එහෙම තමයි තිබෙන්නේ. ඒ තීරුව ඔස්සේ තමයි ගමන් කරන්නේ. එතකොට එක පැත්තට ගමන් කරන කොට බයිසිකල් යන්නේ ඒකේ. ලොරි යන්නේ ඒකේ. දැන් ඔබතුමාට මතක ඇති. ඔබතුමාත් එක්ක අපි ගියා ගෝවේ රටට. ඒ යද්දී ලොරිය දාන්නේ ලොරි මංතීරුවේ. බස් එක යන්නේ බස් මංතීරුවේ. එතකොට අපට එපමණ විශාල පාරවල් නැති වෙන්න පුළුවන්. නමුත් සංකල්පයක් හැටියට එහෙම හඳුන්වා දුන්නොත් අපේ පාරවල් හරි කෙටියෙන් මම හිතන්නේ මේ අදහස ඉතාමත් සාර්ථක දෙයක් වෙනවා. මීට පෙර සාකච්ඡා කෙරුණා යම් මන්ත්‍රීවරයෙක් කථා කරද්දී මේ ටියුෂන් තහනමක් පිළිබඳව කථා කරනවාය කියලා. මේක එදා ඉඳන්ම දිගටම ආපු කටයුත්තක්.

ඔබතුමාත් නියැලුනේ මේ ක්ෂේත්‍රයේ. මම නියැලෙන්නේත් ඒ ක්ෂේත්‍රයේ. ටියුෂන් කියන එක අර මීට පෙර සාකච්ඡා කරපු ආකාරයට පාසලේ නිසි අධ්‍යාපනයක් නොලැබුණු නිසා තමයි ඇත්තටම උපකාරක පන්තිවලට යොමු වෙන්න මූලික හේතුව. අද මේක තමන්ගේ පඩි පතෙන් මෙතැන කවුරු හරි රැඳී සිටින නිලධාරීන් පවා ගත්තොත් එහෙම තමන්ගේ දරුවන් ඉන්නවා නම් පඩි පතෙන් යම්කිසි මුදලක් වෙන් කරනවා උපකාරක පන්ති සඳහා. ඒක හදලා ඉවරයි. යම් විධියකින් ටියුෂන් පන්ති තහනම් කළාය කියලා කිව්වාට බුද්ධිය තහනම් කිරීමක් කරන්න බැහැ නේ? එතකොට මම ටියුෂන් ක්ෂේත්‍රයේ නියැලෙන්නේ. එතකොට මේ වන කොට දැන් මම දන්නවා. ගොඩක් ටියුෂන් ක්ෂේත්‍රයේ නියැලෙන ගුරුවරුන් අමාත්‍යවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ දැන් ඔය Summit Flats වල එහෙම ගිහිල්ලා ගොඩක් මන්ත්‍රීවරුන්ගේ ඇමතිවරුන්ගේ ගෙවල්වල

[ ගරු රොඩ්නි රුඩෝෆ් ප්‍රේසර් ]

Individual Class කරනවා. එතකොට දැන් මේ ටියුෂන් තහනම් කිරීමක් - මම නම් ඒක ඇහුවා විතරමයි. එසේ කිරීමක් කරනවා නම් අර සාමාන්‍යයෙන් ඉගෙන ගන්න තිබෙන දරුවන්ට තිබෙන අයිතිය තමයි මේ නැති කරලා දාන්නේ. ඒ කියන්නේ යම් පන්තියක් ඉදිරියට එන්න තිබෙන අවස්ථා නැති කර දැමීමක් තමයි මේ කරන්නේ. ඒ නිසා මේක හැමදාමත් එදා ඉඳන්ම කථා කරපු දෙයක්. කවදාවත් මම හිතන්නේ නැහැ මේ දේවල් කරන්න ලැබෙයි කියලා. අර ලලිත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මෙතැන ඉඳන් ගෙදරට යන්න ඕනෑ නම් විනාඩි 05 ක් යයි. මේ තිබෙන ස්ථානයේ ඉඳන් විනාඩි 05 ක්. උපරිම විනාඩි 07 ක් යයි. ඉතින් අපි ජීවත් වෙන්නේ මේ බෙල්ට් එකේ. මම හැමදාමත් කියන එක. පස් වන ශ්‍රේණිය දක්වා තමයි පාසල් තිබෙන්නේ. පස් වන ශ්‍රේණියෙන් ඉහළට යන්න තිබෙන දරුවෝ යන්නේ එක්කෝ පන්නිපිටිය ධර්මපාලට යන්න ඕනෑ. කොට්ටාව ආනන්දය. එහෙම නැත්නම් කොට්ටාව ධර්මපාල විද්‍යාලයට. මේ පාසල් අපේ පැතිවල බැලුවොත් එහෙම සමහර ළමයින් හයෙන් හතෙන් නතර වෙලා තිබෙනවා. මේ ආසන්නයේ. කළල්ගොඩ පැත්තේ එහෙම. ඉතින් හයෙන් හතෙන් යන්න බැරිකමට හේතුව බැලුවාම ඇත්ත වශයෙන්ම බස්වල යන්න සල්ලි නැහැ. ඔබතුමාගේ ප්‍රදේශයේත් වෙන්න පුළුවන්. අපේ පැත්තේ එහෙම ඉන්නවා. බස්වල යන්න සල්ලි නැති වුණාම ඒ ළමයා එහෙම්ම ගෙදරට වෙලා ඉන්නවා. ඒ නිසා මේ යෝජනාව යටතේ මේ ජාතික වශයෙන් මහ ඇමතිතුමාත් එක්කත් එකතු වෙලා මේක අර හමස් පෙට්ටියට යන්නේ නැති වෙන්න ඔබතුමා සාකච්ඡා කරලා මේක ක්‍රියාත්මක වන විධියට. ඊළඟ වාරයේ ඉඳන් හරි ක්‍රියාත්මක වෙන විධියට කටයුතු සලසන්න මේ කටයුත්ත කළොත් මම හිතන්නේ හොඳයි. ඒක පොදුවේ සියල්ලටම. සියලුම ළමයි. නැත්නම් ඔබතුමාගේ ප්‍රදේශයේ දහ දෙනෙකුට දෙයි. තව මන්ත්‍රීවරයෙකු පස් දෙනෙකුට දෙයි. එතකොට අනික් ළමයින් කොන් වෙන ස්වරූපයක් තිබෙනවා. ඇයි ඒගොල්ලන්ට දෙනවා. අපට නැත්තේ කියලා. මොකද, ළමයාට දේශපාලනයක් නැහැ නේ? ඉතින් ඒ නිසා පොදුවේ සියල්ලටම යන ආකාරයට මේ යෝජනාව යෙදෙනවා නම් මම හිතන්නේ හොඳයි. ඔබතුමාගේ ඉල්ලීම සාර්ථක වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙස ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 01.41]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් යෝජනාවක් අපේ යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඉදිරිපත් කළේ. විශේෂයෙන් මෙම කාරණා බලන කොට අපි කල්පනා කරන්නේ, මේ හැම දෙයක්ම කථා කරන්නේ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන්. දරුවන් පාසලට යවා ගන්නේ කොහොමද? එතකොට මේ පාසලට යවා ගැනීම සම්බන්ධයෙන් තිබෙන කාරණාව තමයි අධ්‍යාපනය ගැන උනන්දුවක් තිබෙනවා නම්, ඒ ගැන අවබෝධයක් තිබෙනවා නම් බයිසිකලයෙන් හෝ පයින් හෝ බස් රථයෙන් හෝ ගිහිල්ලා අධ්‍යාපනය ලබා ගෙන තිබෙනවා. ඉතිහාසය දිහා බැලුවාම, රටේ බිහි වෙලා ඉන්න උගතුන් දිහා බලන කොට ඒ අය කියයි, තමන් අධ්‍යාපනය ලබා ගන්න මොනතරම් කටයුතු කළාද කියන එක. නමුත් මේ තිබෙන ජනප්‍රිය පාසල් සංකල්පය මත ගමේ පාසල ඉතා සීඝ්‍රයෙන් වැසීගෙන යනවා. මේ වැහීගෙන යන සීඝ්‍ර කාරණාව සම්බන්ධයෙන් එහෙමනම් දෙමව්පියන් වශයෙන් අපි මානසික සංවර්ධනයක් ඇති වෙන්න ඕනෑ. මේ තිබෙන දුෂ්කර පාසලෙත්, අර තිබෙන විධිමත් පාසල්වල, ජනප්‍රිය පාසල්වල තිබෙන අධ්‍යාපනයම තිබෙනවා. ඒ නිසා අපට යම් ප්‍රමාණයකට හීනමානයක් තිබෙනවා, මේ පාසලට දරුවා දා ගත්තොත් සමහරවිට අර උසස් පාසලේ, ජනප්‍රිය පාසලේ වෙන කාරණා වෙන්නේ නැහැයි කියන එක. මෙන්න මේ හීනමානය නිසා තමයි, ගොඩක් වෙලාවට මේ දුෂ්කරයි

කියලා පාසල් ගොඩනැඟිලා ඒවාට දරුවන් යන්නේ නැත්තේ. නමුත් අතීතයේ මේවා ඉතා සක්‍රීය මට්ටමේ තිබුණු පාසල්. අධ්‍යාපන ක්‍රමයක් තිබුණා. ප්‍රාථමික පාසල්. ද්විතික පාසල්. ඊළඟට මධ්‍ය පාසල් වශයෙන් කොටසක් හැදිලා තිබුණා. එතකොට මේ අධ්‍යාපනය පිළිබඳව එහෙම ගැටලුවක් ඇති වෙලා තිබුණේ නැහැ. නමුත් අද කාලීන වශයෙන් යෝජනාවක් එනවා නම් බයිසිකලයක් හරි දීලා දරුවා පාසල් යවන්න ඕනෑය කියලා ඒකට අපි එකඟතාවය දක්වනවා. හැබැයි එකඟතාවය දැක් වූවාට මේවා ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තමයි ගැටලුව තිබෙන්නේ. මීට වඩා යෝජනා මමත් ඔබතුමා වාගේම මේ සභාවට ගේනවා අපි දැක්කා. එක යෝජනාවක් තමයි දහම් පාසල් අධ්‍යාපනය. ඊට පස්සේ එක යෝජනාවක් ගෙනාවා, අඩුම වශයෙන් දේශපාලඥයන් මේ සුරා සූදුවෙන් තොර, එහෙම නැත්නම් බාර් තිබෙන දේශපාලනඥයන් මේවායින් ඉවත් වෙන්න ඕනෑය කියලා යෝජනාවක් මේ පළාත් සභාවට ගෙනාවා. ඒවා එකක්වත් ක්‍රියාත්මක වුණේ නැහැ. මේවා පළු යනතුරු කථා කළා විතරයි. ඒවා ගැන සමාජ කතිකාවතක් නැහැ. ඒ නිසා මේ බස්නාහිර පළාත් සභාවේ යමක් කරනවා නම් යෝජනාවක් ගෙනැල්ලා, ඒ යෝජනාවට මධ්‍යම රජයත් එක්ක සම්බන්ධ වෙලා කතිකාවතක් හදන්න ඕනෑ. අර කිව්වා වාගේ මහා මාර්ග පද්ධතිය, රථ වාහන සම්බන්ධයෙන් සහ මඟීන් සම්බන්ධයෙන් තිබෙන ඒ අවශ්‍යතා ඉටු කරමින් තමයි මේ කාරණාව සිද්ධ කරන්න පුළුවන්කම ඇති වෙන්නේ.

මේ යෝජනාව දිහා බලන කොට මේ යෝජනාව අමුතු යෝජනාවක් නොවෙයි. අපේ රටේම වියලි කලාපයට යන කොට, එහෙම නැත්නම් අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව, කටාන ප්‍රදේශයට යන කොට දරුවන් සහ ජනතාව බහුලව බයිසිකල් භාවිතා කරන තත්ත්වයක් අපි දකිනවා. දරුවන් අධ්‍යාපන කටයුතු සඳහා මෙය යොදා ගන්නවා අපි දැකලා තිබෙනවා. එතකොට මෙය රජයෙන් බෙදා දෙන්න උත්සාහ කිරීමෙන් අර ඉස්සෙල්ලා මන්ත්‍රීවරයෙක් යෝජනා කළා මේවා නඩත්තු කරන්නේ කවුද? මේවාට ටයර් අරන් දෙන්නේ කවුද? එතකොට මේ කාරණා ගණනාවටම අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා වැඩ සටහනක් හදනවා නම් හොඳ කාලෝචිත වැඩ සටහනක්, ඒකට ක්‍රමවේදයක් ඇතිව, ඒ දරුවන් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් ඇති කරන්නට ඕනෑ. මේ බයිසිකල් සම්බන්ධයෙන් කටයුතු කරන කොට අපි මේක අසාර්ථක ක්‍රමයක් වශයෙන් දකින්නේ නැහැ. අපි පුංචි කාලයේ දැක්කා, පවුල් සෞඛ්‍ය නිලධාරිතුමිය බයිසිකලයකින් ගෙදරට එනවා දැක්කා. ඇයගේ රාජකාරීය කාර්යක්ෂමව කරන්න, එය විධිමත් භාවයෙන් කරන්න. අපි දකිනවා බයිසිකලයෙන් යන කොට යන්නේ පවුල් සෞඛ්‍ය නිලධාරිතුමිය. එහෙම නැත්නම් ගෙදරට ලියුම් ටික එන කොට අපි දන්නවා, බෙල් එක ගහන කොට ලියුම් බෙදන්නා ඇවිල්ලා තිබෙන්නේ, අපේ ගෙදරට ලියුමක් දෙන්න. මේ බයිසිකලය ගැන හොඳ සංකල්පයක් ගොඩනැඟුණු, අපේ ග්‍රාමීය මිනිස්සුන්ගේ හදවතේ තිබෙන ඔවුන්ගේ ප්‍රවාහන මාධ්‍යයක්. නමුත් අද වන විට කොපමණ කටයුතු කරන්න වෙයිද? අද වෙලා තිබෙන්නේ සමාජය ඉතා වේගයෙන් දියුණු වෙලා තිබෙනවා. අපට තිබුණු ගතානු ගතිකභාවයන් දියුණු වෙලා තිබෙනවා. දරුවන්ට මෙච්චර අම්මලා සෙනෙහසද ආදරේද කියලා අපි දන්නේ නැහැ. අපට එහෙම ආදරයක් අපේ අම්මා, තාත්තා තුළ තිබෙන්නට ඇති. හැබැයි, ඔවුන් මෙය ප්‍රදර්ශනය කරන්න උත්සාහ කළේ නැහැ. අද අම්මා දරුවාට බෑග් එක උස්සගෙන යන්න දෙන්නේ නැහැ.

අද දරුවාට තීන්දුවක් තීරණයක් ගන්න දෙන්නේ නැහැ. ගමේ පාසල වෙන්න පුළුවන්. නගරයේ පාසල වෙන්න පුළුවන්. දරුවා එළියට එනතුරු අම්මා මඟ බලාගෙන ඉන්නවා. දරුවා පාසලෙන් එළියට ආපු සැනින් අම්මා දරුවාගේ බෑග් එක එල්ලා ගන්නවා. දරුවා වාහනයකට දැම්මත් අම්මා මඟ බලාගෙන ඉන්නවා, වාහනයෙන් බැස්ස ගමන් දරුවාගේ බෑග් එක ගන්න. ඒක සෙනෙහස වෙන්න පුළුවන්. හැබැයි අපේ දරුවන්ට තීන්දු තීරණ ගන්න තිබෙන අයිතීන් අද සියල්ල නැති කරලා තිබෙනවා. එතකොට මේ හදිසියේ වාහනයේ යන කොට යම්කිසි තීන්දුවක් ගන්න වුණොත් දරුවාට පුළුවන්කමක් නැහැ, ඒ තීන්දුව ගන්න. සමාජයේ මේ තැනට ගේන්න දෙමව්පියන් වශයෙන් අපි හැම කෙනාම ලොකු වැරැද්දක් කළා. ඒ තමයි අපේ දරුවාගේ මේරීමත් එක්ක ඔහුට තීන්දු තීරණ ගන්න අපි අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. ඔහුව පාලනය කරන්න ගියා. ඕනෑවට වඩා ඔහුට සෙනෙහෙස දක්වන්න ගියා. ඒ නිසා එම පාසල් පද්ධතිය දිහා බලන කොට ඒ දරුවන් අද ප්‍රවාහන පහසුකම් ඉල්ලනවා. දරුවා පයින් යන්න අකැමැත්ත දක්වනවා. දරුවාට තීන්දු තීරණ ගන්න පුළුවන්කමක් නැහැ. ඔහුට බස් රථයක එන්න පුළුවන්කමක් නැහැ. එහෙම අවබෝධයක් නැහැ. අධ්‍යාපන ක්‍රමය කියන්නේ මිනිස්සුන්ට ජීවත් වෙන්න උගන්වන්න ඕනෑ. ජීවත් වෙන්න උගන්වනවා නම් මේවා ගැටලුවක් වෙන්නේ නැහැ. එහෙමනම් අපි මේ අධ්‍යාපන ක්‍රමයේත් වෙනස්කම් ඇති කරන්න ඕනෑ.

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

ඒ වාගේම මේ බයිසිකල් දෙන දරුවා, ග්‍රාමීය පාසලට යන දරුවා සමහරවිට දුප්පත් දරුවෙක් වෙන්න පුළුවන්. සමහරවිට ඒ දරුවා සෞඛ්‍ය සම්පන්න භාවයෙන් අඩු දරුවෙක් වෙන්න පුළුවන්. මේ සෞඛ්‍ය සම්පන්න භාවයෙන් අඩු දරුවාගේ නීරෝගීකම රැකගන්න අපි මොනවද කරන්න ඕනෑ. මේ දවස්වල ඉස්කෝලවල Sports meet තිබෙන කාලය. මේ දවස්වල අපේ ජනප්‍රියම ක්‍රීඩාව තමයි ගම හරහා දුවන තරගය. අද කොයි ඉස්කෝලයේද ගම හරහා තරගය පවත්වන්නේ. අද පාසල්වල මීටර් 10,000 තරගය තියන්නේ නැහැ. දරා ගැනීමේ ශක්තිය නැහැ. අපි දෙන බයිසිකලය කිලෝ මීටර් හතරක් දරුවාට පදින්න පුළුවන්ද? අපට අහන්න වෙනවා. සමාජයේ සෞඛ්‍ය පැත්තෙන් අපේ දරුවා බයිසිකලය පැදගෙන යන්න නිරෝගී දරුවෙක්ද? කියලා. දෙන පොත් මිටිය කරේ එල්ලගෙන බයිසිකලය පැදගෙන යන්න පුළුවන් දරුවෙක් අපි සමාජගත කරලා තිබෙනවාද? ඔහු හොඳ සෞඛ්‍ය සම්පන්නයිද? ඔහු නිරෝගීයිද? මේ දරුවා සමාජයට මුදා හරින්න තරම් සමාජය නිවැරැදි තැන තිබෙනවාද? දුරාචාර කියන එක ඉතා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒක මත්ද්‍රව්‍ය වෙන්න පුළුවන්. ඒ වාගේම විවිධ දුරාචාර කාර්යයන් වෙන්න පුළුවන්.

ඒ වාගේම පුංචි දරුවා බයිසිකලය පැදගෙන යන කොට හැම ගමකම තිබෙන්නේ කාමර කුළියට දීමට ඇත. එතකොට මේ නිවසක් තිබෙන මිනිස්සුන්ට කාමරයක් මිලදී ගන්න තිබෙනවා නම්, දරුවා දකින්නේ මොකක්ද? මේ සමාජය ඒ තරම් පල්ලෙහාට ගිහිල්ලා තිබෙනවා. මිනිස්සුන් තමන්ගේ අවශ්‍යතා ඉටුකරගන්න තමන්ගේ යම් යම් විනෝද කටයුතු සඳහා ගම පුරා කාමර කුළියට දෙන තත්ත්වයන් තිබෙනවා. පන්ති යන දරුවා ගෙදර එනතුරු කාරණා ගණනාවක් නිසා මඟ බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා යමක් කරන කොට සමාජ පසුබිම බලන්න ඕනෑ. පරිසර පද්ධතිය බලන්නට ඕනෑ. දරුවා දුරාචාරයට යොමු වීම, දරුවන්ව පොළඹවන මිනිස්සු ප්‍රමාණය වැඩියි. දරුවන්ගේ සෞඛ්‍ය සම්පන්න භාවය හොඳට තිබෙන්න ඕනෑ. ඒ දරුවා තීන්දු තීරණ ගන්න ඕනෑ. ඒ වාගේ කාරණා ගණනාවක් එක්ක මේවා ගොඩනැගෙනවා නම් අර කිව්වා වාගේ යම් යම් කාරණාවලට, බෝ නොවෙන රෝග තත්ත්වයන්ට බයිසිකලය ඉතා වැදගත් කියලා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි ළමයින්ගේ මරණ සංඛ්‍යාව බලන්න ඕනෑ. දවසට රූපවාහිනිය ළඟින් ඉඳගත්තාම අපි නිරන්තරයෙන් දකින දේ තමයි පුංචි දරුවන් දියේ ගිලිලා මැරෙන ප්‍රමාණය කොපමණ ඉහළ ගිහිල්ලා තිබෙනවාද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කාලය ගැන පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මේකේ කාලය අත්හිටුවලා නේ තිබෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ. දෙකට -

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

හරි. හරි. රීති අත්හිටුවලා නැහැ නේද? එම නිසා මම හිතනවා මේ කාලීන යෝජනාව සම්බන්ධව, දෙමව්පියන් වශයෙන් අපි බුද්ධිමත් වෙන්නට ඕනෑ. මේ කරන කාරණා හරහා අපට ප්‍රතිඵලයන් ලබා ගන්න පුළුවන් වෙයිද කියන එක. ඒ නිසා අද සමාජය දිහා මේ මොන කාරණා කළත් මම කනගාටු වෙන්නේ, අත්තනගල්ල ආසනයේ මා ළඟ නම් ගම් සියල්ල සහිතව තිබෙනවා. පාසල් 15 ක විතර ළමයින් 90 කට විතර අකුරු ලියන්න හෝ කියවන්න බැහැ. දරුවන්ට මේ සියලු පහසුකම් තිබෙනවා. හැබැයි අකුරක් ලියන්නත් බැහැ. කියවන්නත් බැහැ. මේ ළමයින් ඔක්කොම ඉන්නේ පහේ පන්තියේ. 6 පන්තියට යන්න දරුවන් බලාගෙන ඉන්නවා. අකුරු ලියන්නවත්, කියවන්නවත් බැරි ළමයින් 90 ක් අත්තනගල්ල ආසනයේ පහේ පන්තියේ ඉන්නවා. මේක ඛේදජනක තත්ත්වයක්. ඒ නිසා මේ මොන දේ කරන්න උත්සාහ කළත් අවසානයේ දරුවාගේ අධ්‍යාපනය වෙනුවෙන් වගකීමක් තවම මේ සමාජයේ ගොඩනැඟිලා නැහැ. විශේෂයෙන් දහම් පාසල් අධ්‍යාපනය වෙනුවෙන් අපි මොනතරම් හඬක් මේ සභාව තුළ කළාද? ගුණවත් අධ්‍යාපනය නැතිව සමාජයට දරුවෙක් මුදා හැරීමේ ගැටලුව. එයට කිසිම ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. ඒ නිසා මේ කාරණාවත් එහෙම වෙයි කියලා මට විශ්වාසයි. ඒ නිසා ඉදිරි කාලයේ - අපේ

කාලය හමාර වෙයි මේ යෝජනාව සම්මත වෙලා සැකසුම් වෙලා එන කොට. නමුත් ඉදිරි සභාවකදී හරි මේ දරුවන්ට තිබෙන ගැටලු හා දරුවන්ගේ ගුණාත්මක භාවය වැඩි කරන්න, අධ්‍යාපනය වැඩි දියුණු කරන්න මේ බස්නාහිර පළාත් සභාව කටයුතු කරයි කියන විශ්වාසයෙන් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.50]

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මගේ කළ්‍යාණ මිත්‍ර මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව ඉතාමත් කාලෝචිත, සමාජමය, ආකල්ප වශයෙන් ගත් විට, අපේ ක්‍රියාකාරකම්, අපේ පැරැන්නන් ළඟ තිබුණු බොහෝ චර්යාවන් හෙළිදරව් කරන යෝජනාවක් විධියටයි මා දකින්නේ. මා එහෙම කියන්නේ, පාසල් වැන් සංස්කෘතිය ගැන නොව. අද අපි පත් වෙලා තිබෙන තත්ත්වය වැරැදිලාවත් වැසිකිළිය වත්ත පහළ තිබුණා නම්, ටිකක් දුරින් ඉස්සර වාගේ. ඉස්සර වළ වැසිකිළි තිබුණේ. එහෙම තිබුණා නම්, අපි ඒ ගමන යන්නෙත් ත්‍රීරෝද රථයෙන්. ඒක නිවැරැදිව ඉක්මණට කෙරෙනවා නම් මීටර් එකක යයි. එහෙමත් නැත්නම් තවත් එකක යයි. එවැනි සමාජ තත්ත්වයක් තුළ තමයි අපි මේ යෝජනාව ගෙන එන්නේ. අද පාසල් පද්ධතියේ 10% ක් ජාතික වශයෙන් ළමා දියවැඩියාවට ගොදුරු වෙලා. ඒකේ බස්නාහිර පළාතේ ප්‍රතිඵලය වාර්තාගතයි. 14% යි. මම අද මේ හදිසියේ ඇවිල්ලා කථා කරන්නේ. මම දැනුයි ඔබතුමාගෙන් විනාඩි 05 ක් ඉල්ලුවේ. කොහොම නමුත් අද අපි පා පැදිය දකින්නේ, ඉතාමත්ම වයෝවෘද්ධ කෙනෙක් පාරේ පා පැදියක් පැද්දොත්, එහෙමත් නැත්නම් වෙනත් කීර විකුණන්නෙක්, මාළු විකුණන්නෙක්, එහෙමත් නැත්නම් තවත් පැත්තකින් ස්විප් විකුණන කෙනෙක් විතරයි. හැබැයි අපේ දරුවන්ට දෙමව්පියන් වත්කම් ප්‍රදර්ශනය කරන්නත් වීල් දහයේ දොළහේ පා පැදි අරගෙන දෙනවා. මහල් ගණන් පා පැදි ප්‍රදර්ශනාගාරත් ප්‍රධාන නගරවල තිබෙනවා. නමුත් මහ මග ඒ වීල් දහයේ දොළහේ පා පැදි ඇත්තෙත් නැහැ. මම මේ කථාව කිව්වේ වෙන දෙයකට නොවෙයි. පා පැදි දෙන්න ඕනෑ. ගමේ පාසල් වැහෙන එක නවත්තන්න ඕනෑ. ඒ වාගේම නගරයට ඉගිල්ලෙන මානසිකත්වය දෙමව්පියන්ගෙත්, දරුවන්ගෙත් තුනී කරන්නට ඕනෑ. හැබැයි අපි නිරෝගීකම පිළිබඳව, අධ්‍යාපනය වාගේම ශිෂ්‍යත්ව ප්‍රතිඵල, සාමාන්‍ය පෙළ ප්‍රතිඵල වාගේම ආරෝග්‍යා පරමාලාභා කියන අපේ පැරැණ්නන්ගේ තිබුණු මහා ගැඹුරු දින චර්යාව අද අපි සුණු විසුණු කරලා තිබෙනවා. වැඩිහිටියන් සුණු විසුණු කරපු මේ දින චර්යාව අද ළමයින් ඊටත් වඩා බරපතළ ලෙස පපඩම් පොඩි කරන්නා වාගේ පොඩි කරගෙන තිබෙනවා. මේ යන ගමන තවත් ඉදිරියට ගියොත් මේ රටේ කිසිම නායකයෙක්ගේ අතේ ඇලඩින්ගේ පුදුම පහන නැහැ. අරයා ආවාම මෙහෙම වෙයි. මෙයා ආවාම මෙහෙම වෙයි නොවෙයි. හැබැයි කිසිම නායකයෙක් මේ රටේ මහජනතාව පෙළගස්වන්න, මහජන ආකල්ප, ඔවුන්ගේ අභිමානය, ඒ වාගේම අපේ මව්බිමේ තිබෙන සාරවත් බව ඉස්මතු කරන වැඩ පිළිවෙළවල්වල නොවෙයි යන්නේ. පටු අරමුණුවල කියන එක මතක් කරන්න කැමැතියි. එහෙම යන ගමනක බස්නාහිර පළාතේ අපිත් මේ යෝජනාව ගේනවා. මේ යෝජනාව ගෙනෙද්දී අද අපේ දරුවන්ට කිරි එරෙන්නේ කාටද? නවසීලන්තයේ, ඕස්ට්‍රේලියාවේ වැස්සියන්ට. අද අපි කිරි කියලා දිය කරලා දෙන්නේ පිටි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සුමිත් සොයිසා ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Hon. Lalith Ellawala M.P.C] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair.*

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවත් එක්ක කථා කරද්දී අපේ රටේ මාර්ග බාධා තිබෙන්නේ විශ්ව විද්‍යාල ඉදිරිපිට. හැබැයි කිසිදු පෙර පාසලක් ඉදිරිපිට මාර්ග බාධක නැහැ. තිබෙනවාද? ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. අපේ දරුවන් අද පළමුවැනි ශ්‍රේණියට යන්නෙත්, පෙර පාසලට යන්නෙත් නීල් ආම්ස්ට්‍රෝන් සඳමතට බැස්සා වාගේ මහා බර පොදියක් කරේ ගහගෙන. එක පැත්තකින් අද අපි හාන්නේ නැහැ. වතුර බඳින්නේ නැහැ. කොටන්නේ නැහැ. පොළන්නේ නැහැ. හලන්නේ

[ ගරු සුමිත් විජයමුණි ද සොයිසා ]

නැහැ. අදින්නේ නැහැ. පදින්නේ නැහැ. අඹරන්නේ නැහැ. වනන්නෙත් නැහැ. අද අපි වනන්නේයි, අඹරන්නේයි යන කොට වැනිල්ලක්, ඇඹරිල්ලක් විතරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. අපේ තවත් කථික මන්ත්‍රීතුමෙක් ඉන්නවා. කාලය දික් කරන්න පුළුවන් නම් ප්‍රශ්නයක් නැහැ . අපේ කාලය දික් කරන්න කෙනෙක් නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මම අවසන් කරනවා. ඔබතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ප්‍රශ්නයක් නැහැ. මෙතැන කාලය දික් කරන්න ඇමැතිවරයෙක් හරි, සභානායකවරයා හරි සභාගර්භයේ ඉන්න ඕනෑ. කවුරුත් නැහැ නේ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

කියන්න කථා හුඟක් තිබුණත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හුඟක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ප්‍රමාණවත් කාලයක් නොමැති නම් මගේ ඒ කාලයත් මෙතුමාට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න. ඔබතුමා ගොඩක් වෙලා බලාගෙන සිටියා නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

එතුමාගේ අවස්ථාවත්, එතුමාත් හිටපු සභාපතිතුමා. මමත් ඔබතුමාගේත්, එතුමාගේත් හිටපු නියෝජ්‍ය සභාපතිතුමා. එතුමාට අවස්ථාව දෙමින් ආකල්පමය වශයෙන් දරුවන්ට පා පැදිය සෞඛ්‍ය සම්මන්න ලෙස එක පැත්තකින් ගමේ පාසල රකින්නත්, ජනප්‍රිය පාසල්වලට යන ගමන නවත්වන්නත්, ඒ එක්කම දෙමව්පියන්ගේ අතමිට හිඟ වෙන එක නවත්වන්නත්, ඒ වාගේම දරුවා දෙමව්පියන්ගේ ඇහැට පෙනෙන, කණට ඇහෙන දුරින් මූලික අධ්‍යාපන අවදියේදී, වැට පනින වයසේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. කථාව අවසන් කරන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේ යෝජනාව ඵලදායි වන්න හේතු වාසනා වේවා කියමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, විනාඩියෙන් කථාව අවසන් කරන්න. විනාඩියක් දෙන්න පුළුවන්.

[අ.භා. 01.58]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, අද මම ගෙනා මෙම යෝජනාව සම්බන්ධව ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා විශාල පිරිසක් මේ යෝජනාවේ තිබෙන වැදගත්කම, වටිනාකම පිළිබඳව දිගින් දිගටම කථා කළා. ඒ කථා කළ එක අවස්ථාවක් තමයි අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා එකතු කළා. මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී දරුවන්ගේ පා පැදිය එක පාටකට නිර්මාණය වෙන්න ඕනෑය කියලා. කහ පාට වාගේ පාටකට නිර්මාණය වෙන්න ඕනෑය කියලා. මම ඒකත් බොහොමත්ම අවධානය යොමු කරමින්, මේ යෝජනාව සම්බන්ධව කථා කරපු, ඒ අදහස් පළ කරපු මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය දුන්නු සියලුම

ගරු මන්ත්‍රීතුමන්ලාට බොහොමත්ම ස්තුතිවන්ත වෙමින්, මේ යෝජනාව ඉතාමත්ම කඩිනමින් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු සඳහා සියලු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට සභාවේ බෙදීමක් තිබෙනවාද? බෙදීමක් නැහැ. ඒ අනුව එම යෝජනාව බෙදීමකින් තොරව සභා සම්මත වූ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. මම කනගාටු වෙනවා. ජගත් අංගගේ හිටපු අපේ සභාපතිතුමාට අවස්ථාවක් ලබා දෙන්න ක්‍රමයක් තිබුණේ නැහැ. මම උත්සාහ කළා. අඩු වශයෙන් මෙතැන ඇමැතිවරයෙක් හෝ සභානායකතුමා සිටියා නම් අපට කාලය දික් කරන්න තිබුණා. එහෙමනම් ප්‍රශ්නයක් නැහැ. කැමත් ලැහැස්තියි. නමුත් කවුරුවක්වත් මුල් පේළියේ නැහැ. මට කාලය දික් කරන්න බැහැ. ඔබතුමා රීති දන්නවා නේ. ඒ නිසා මම කනගාටු වෙනවා. සභාව කල් තියන්න කවුරුවක්වත් නැහැ . මමම කල් තියනවා. අද දවසේ න්‍යාය පත්‍රය මෙයින් අවසන් වෙනවා. නැවත වරක් මම අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනවා ඊළඟ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. ඒ අනුව අද සභාවේ වැඩ අවසන් කරමින්,

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.00 ට, 2019 පෙබරවාරි මස 05 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 02.00 p.m till 9.30 a.m. on 05.02.2019*